# වාර්ෂික

# කාර්ය සාධන වාර්තාව 2012

## ශ්‍රී ලංකා රේගුව

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2012

## පටුන


| | |
|---|---|
| ප්‍රධාන නිලධාරීන් | 2 |
| සමස්ත කාර්ය සාධනය 2012 | 4 |
| **ව්‍යාපෘති I** | |
| | |
| නීති බලාත්මක කිරීමේ පර්ෂදය | 20 |
| නිවාරණ අංශය | 22 |
| සමාජ ආරක්ෂණ අංශය | 26 |
| පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය | 36 |
| මධ්‍යම විමර්ශණ අංශය | 41 |
| නීති කටයුතු අංශය | 44 |
| මධ්‍යම බුද්ධි තොරතුරු අංශය | 45 |
| ආදායම් හා සේවා පර්ෂදය | 50 |
| ප්‍රකාශන අංශය | 52 |
| කර්මාන්ත හා සේවා අංශය | 57 |
| භාණ්ඩ පරීක්ෂණ අංශය | 63 |
| මගී සේවා - කොළඹ අංශය | 67 |
| අපනයන අංශය | 68 |
| මගී සේවා - කටුනායක අංශය | 70 |
| ආදායම් හා සේවා – කටුනායක අංශය | 74 |
| සංයුක්ත සේවා පර්ෂදය | 78 |
| ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය | 80 |
| සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ අංශය | 88 |
| මධ්‍යම මිල පිරික්සුම් අංශය | 90 |
| විශේෂ සේවා අංශය | 91 |
| සේවා හා සැපයුම් අංශය | 94 |
| මානව සම්පත් පර්ෂදය | 96 |
| මානව සම්පත් කළමනාකරණ අංශය | 97 |
| මානව සම්පත් සංවර්ධන අංශය | 100 |
| කාර්ය මණ්ඩල සේවා අංශය | 104 |
| පළාත් පර්ෂදය | 106 |
| ආදායම් හා සේවා – පළාත් අංශය | 107 |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ ඇති අංශය | 110 |
| පද්ධති, ක්‍රියා පරිපාටි, අනුකූලතා විගණන අංශය | 111 |
| මූල්‍ය අංශය | 112 |
| විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය | 117 |
| **ව්‍යාපෘති II** | |
| නිෂ්පාදන බදු(විශේෂ විධි විධාන) | 122 |

# ශ්‍රී ලංකා රේගුව 2012
## ප්‍රධාන නිලධාරීන්

**ආචාර්ය එන්. ගුණවර්ධන මහතා**
රේගු අධ්‍යක්ෂ ජනරාල්
**ආර්.සේමසිංහ මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)
**එස්.ඩී.එස්.ගුණතුංග මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (සහාය සේවා)
**කේ.එල්.ජී.ටී.පෙරේරා මහතා**
වැඩබලන අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (පළාත්)
**එම්.පුවිහරන් මහතා**
වැඩබලන අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)
**ඩබ්.එල්.ඩී.ආර්.ඒ.කුමාරතිලක මහතා**
වැඩබලන අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (නීති බලාත්මක කිරීම)
**කේ.රන්ජන් මහතා**
රේගු අධ්‍යක්ෂ (නිවාරණ)
**ජී.ඒ.එල්. ගාමිණී මහතා**
රේගු අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)
**එස්.රාජේන්ද්‍රන් මහතා**
රේගු අධ්‍යක්ෂ (පශ්චාත් නිශ්කාෂණ විගණන)
**ඩී.ඒ.අයි. දරණගම මහතා**
රේගු අධ්‍යක්ෂ(මධ්‍යම විමර්ශන)
**කේ. ප්‍රේමනාත් මහතා**
වැඩබලන රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු)
**සී.එන්. රාජරත්නම් මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි තොරතුරු)
**ජේ.එච්. කොඩිකාර මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන)
**බී.ජේ.පී.පෙරේරා මහතා**
රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)
**එල්.එම්. නෙල්සන් මහතා**
රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ)
**එම්. පුවිහරන් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කොළඹ)
**කේ.එල්.ජී.ටී. පෙරේරා මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කටුනායක)
**ආර්. ධර්මපාල මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා – කටුනායක)

**ආර්.පී.ඩී.ටී. සෙනෙවිරත්න මහතා**

රේගු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ)

**එස්. නෙත්කුනනාතන් මහතා**

රේගු අධ්‍යක්ෂ (සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ)

**එන්.කේ. සිවකුමාර් මහතා**

රේගු අධ්‍යක්ෂ (මධ්‍යම මිල පිරික්සුම්)

**ඒ. කුලේන්ද්‍රන් මහතා**

රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)

**පී.බී.එස්.සී. නෝනිස් මහතා**

රේගු අධ්‍යක්ෂ (සැපයුම්)

**ඩබ්ලිව්.එල්.ඩී.ආර්.ඒ. කුමාරතිලක මහතා**

රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)

**ඉෂානි ජේ. අබේරත්න මහත්මිය**

රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)

**ප්‍රදීප් කුමාර මහතා**

වැඩබලන රේගු අධ්‍යක්ෂ (සේවක සේවා)

**කේ.කේ. බාලචන්ද්‍ර මහතා**

රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා - පළාත්)

**බී.එම්.එල්. පියසේන මහතා**

වැඩබලන රේගු අධ්‍යක්ෂ (විශේෂ කාර්ය හා සූපරීක්ෂණ)

**ජගත් ඩයස් මහතා**

රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා – පළාත්)

**පී.ටී.ජී. ගුණතිලක මහතා**

ප්‍රධාන ගණකාධිකාරි

**පී.කේ. වීරසූරිය මහත්මිය**

අධ්‍යක්ෂ (පද්ධති හා ක්‍රියා පරිපාටි අනුකූලතා විගණන)

**ජූඩ් නිලුක්ෂාන් මහතා**

වැඩ බලන අධ්‍යක්ෂ (නිෂ්පාදන බදු)


**යූ.එස්. වනපුෂ්ප මහතා**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යා ලේඛණ)

# සමස්ත කාර්ය සාධනය
# 2012

## ආදායම් රැස්කිරීම - 2012


ජාතික බදු ආදායම ප්‍රතිශතයක් ලෙස*




* තාවකාලික දත්ත

## ආදායම් රැස්කිරීම - 2012

| කාණ්ඩය | (රු. මිලියන) | මුළු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| එකතුකල අගය මත බද්ද - ආනයන | 99071.893 | 21.31579233 |
| ආනයන බද්ද | 73130.544 | 15.73438683 |
| වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද | 69965.009 | 15.05330682 |
| නිෂ්පාදන බද්ද - සිගරට් | 53528.691 | 11.51695427 |
| නිෂ්පාදන බද්ද - මෝටර් රථවාහන | 46485.089 | 10.00148956 |
| විශේෂ භාණ්ඩ බද්ද | 33665.836 | 7.243365873 |
| ආනයන සෙස් බදු | 29579.227 | 6.364112372 |
| නිෂ්පාදන බද්ද - පෙට්‍රල් හා ඩීසල් (ආනයන) | 27863.982 | 5.995069194 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 23298.450 | 5.012773116 |
| අපනයන සෙස් බදු | 3136.461 | 0.674824608 |
| නිෂ්පාදන බද්ද - අනෙකුත් (ආනයන) | 2533.480 | 0.545090357 |
| විවිධ | 919.084 | 0.197745325 |
| නිෂ්පාදන බද්ද - අනෙකුත්(දේශීය) | 802.608 | 0.172684956 |
| නිෂ්පාදන බද්ද - පෙට්‍රල් හා ඩීසල්(දේශීය) | 628.577 | 0.135241352 |
| ඇහලුම් විකිණීම් | 104.688 | 0.022524125 |
| නිෂ්පාදන බද්ද - මත්පැන් | 39.080 | 0.008408335 |
| අපනයන බද්ද | 20.863 | 0.004488774 |
| ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද | 6.802 | 0.001463483 |
| සමාජ වගකීම් බද්ද | 1.294 | 0.000278324 |



# ආදායම් රැස්කිරීම

*රු. මිලියන*


| ආදායම් කේතය | විස්තරය | සංශෝධිත ඉලක්කය 2012 | 2012 දෙසැම්බර් අවසන දක්වා ප්‍රගතිය | | | 2011 සහ 2012 දෙසැම්බර් අවසන දක්වා සැසඳීම | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | සැබෑ | බැහැරවීම් | 2011 | 2012 | බැහැරවීම් |
| 1001.01.00 | ආනයන බද්ද | 76,830 | 76,830 | 73,131 | (3,699) | 76,010 | 73,130.54 | (2,880) |
| 1001.02.00 | අපනයන බද්ද | 20 | 20 | 21 | 1 | 17 | 20.86 | 4 |
| 1001.04.00 | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද | 75,211 | 75,211 | 69,965 | (5,246) | 66,030 | 69,965.01 | 3,935 |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 29,287 | 29,287 | 29,579 | 292 | 26,773 | 29,579.23 | 2,806 |
| 1001.06.00 | මෝටර් වාහන සහන බද්ද | - | - | - | - | - | - | - |
| 1001.07.00 | ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද | - | - | 7 | 7 | 6 | 6.80 | 1 |
| 1001.05.02 | අපනයන සෙස් බදු | 3,120 | 3,120 | 3,136 | 16 | 2,897 | 3,136.46 | 240 |
| 1001.08.00 | විශේෂ භාණ්ඩ බද්ද | 36,608 | 36,608 | 33,666 | (2,942) | 15,622 | 33,665.84 | 18,044 |
| | **මුළු රේගු බදු ආදායම** | **221,076** | **221,076** | **209,505** | **(11,571)** | **187,356** | **209,504.74** | **22,149** |
| 1002.05.01 | නිෂ්පාදන බද්ද - සිගරට් | 54,924 | 54,924 | 53,529 | (1,395) | 49,589 | 53,528.69 | 3,939 |
| 1002.05.02 | නිෂ්පාදන බද්ද - මත්පැන් | - | - | 39 | 39 | - | 39.08 | 39 |
| 1002.05.03 | **නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම්** | **23,000** | **23,000** | **28,493** | **5,493** | **22,470** | **28,492.56** | **6,023** |
| | නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් (ආනයන) | *20,000* | 20,000 | *27,864* | *7,864* | *21,828* | 27,863.98 | 6,036 |
| | නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් (දේශීය) | *3,000* | 3,000 | *629* | *(2,371)* | *642* | 628.58 | (13) |
| 1002.05.04 | නිෂ්පාදන බද්ද - මෝටර් රථවාහන | 57,510 | 57,510 | 46,485 | (11,025) | 52,840 | 46,485.09 | (6,355) |
| 1002.05.09 | **නිෂ්පාදන බද්ද - අනෙකුත්** | **5,132** | **5,132** | **3,336** | **(1,796)** | **5,796** | 3,336.09 | **(2,460)** |
| | නිෂ්පාදන බද්ද - අනෙකුත් (ආනයන) | *3,632* | 3,632 | *2,533* | *(1,099)* | 5,246 | 2,533.48 | (2,713) |
| | නිෂ්පාදන බද්ද - අනෙකුත් (දේශීය) | *1,500* | 1,500 | *803* | *(697)* | 550 | 802.61 | 253 |
| | **මුළු නිෂ්පාදන බද්ද ආදායම** | **140,566** | **140,566** | **131,882** | **(8,684)** | **130,696** | **131,881.51** | **1,186** |
| 1002.01.04 | එකතුකල අගය මත බද්ද - ආනයන | 109,487 | 109,487 | 99,072 | (10,415) | 112,310 | 99,071.89 | (13,238) |
| 1003.10.00 | **සමාජ ආරක්ෂණ බද්ද** | - | - | 1 | 1 | 7 | 1.29 | (6) |
| | සමාජ ආරක්ෂණ බද්ද - ආනයන | - | | *1* | *1* | 7 | 1.29 | (6) |
| | සමාජ ආරක්ෂණ බද්ද - දේශීය | - | - | - | - | - | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බද්ද | *18,823* | 18,823 | *23,298* | *4,475* | 24,467 | 23,298.45 | (1,169) |
| | **මුළු අනෙකුත් බදු ආදායම** | **128,310** | **128,310** | **122,372** | **(5,938)** | **136,784** | **122,371.64** | **(14,413)** |
| | **මුළු බදු ආදායම *** | **489,952** | **489,952** | **463,758** | **(26,194)** | **454,836** | **463,757.89** | **8,922** |
| 2003.02.17 | ඇහලුම් විකිණීම් | 100 | 100 | 105 | 5 | 94 | 104.69 | 11 |
| 2003.03.00 | | | | | | | | |
| 2003.90.00 | විවිධ | 15,700 | 15,700 | 919 | (14,781) | 5,413 | 919.08 | |
| 2003.02.99 | | | | | | | | |
| | **මුළු බදු නොවන ආදායම** | **15,800** | **15,800** | **1,024** | **5** | **5,506** | 1,023.77 | **11** |
| | **මුළු ආදායම (බදු සහ බදු නොවන)** | **505,752** | **505,752** | **464,782** | **(26,189)** | **460,342** | **464,781.66** | **8,933** |
| | **ශුද්ධ තැම්පත්** | | | - | - | (2,578) | - | **2,578** |
| | **තැම්පත් සමග මුළු ආදායම** | **505,752** | **505,752** | **464,782** | **(26,189)** | **457,764** | **464,781.66** | **7,018** |

## ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග (HS ඡේද අනුව)

| Rank | HS ඡේදය | විස්තරය | මුළු ආදායම (රු.) |
|---|---|---|---|
| 1 | 87 | වාහන | 98,530,285,141 |
| 2 | 27 | පෙට්‍රෝලියම් නිෂ්පාදන | 39,556,442,179 |
| 3 | 84 | යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 20,213,386,160 |
| 4 | 39 | ප්ලාස්ටික් වර්ග සහ ඒවායින් සැකසූ නිෂ්පාදන | 14,401,301,491 |
| 5 | 25 | සිමෙන්ති සහ සිමෙන්ති ක්ලින්කර් | 13,939,823,766 |
| 6 | 85 | විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 11,828,890,683 |
| 7 | 7 | අර්තාපල්, රතුළූණු, කොන්ඩ කඩල යනාදි | 11,728,689,275 |
| 8 | 22 | පාන වර්ග, ස්ප්‍රීතු වර්ග හා විනාකිරි | 11,609,961,250 |
| 9 | 72 | යකඩ සහ වානේ | 9,377,751,668 |
| 10 | 10 | තිරිඟු | 9,010,925,253 |
| 11 | 4 | පශු නිෂ්පාදන | 8,894,618,401 |
| 12 | 17 | සීනි සහ රස කැවිලි | 8,772,827,776 |
| 13 | 48 | කඩදාසි සහ කඩදාසි බෝඩ් | 8,268,996,472 |
| 14 | 15 | පාම් තෙල්,පාම්ස්ටියරින් සහ මාගරින් | 7,482,653,662 |
| 15 | 73 | යකඩ සහ වානේ වලින් නිම කල භාණ්ඩ | 7,146,792,272 |
| 16 | 40 | රබර් සහ ඒවායින් නිම කල භාණ්ඩ | 6,789,214,683 |
| 17 | 69 | පිඟන් මැටි නිෂ්පාදනයන් | 6,783,042,840 |
| 18 | 38 | විවිධ රසායනික නිෂ්පාදන | 4,447,918,081 |
| 19 | 33 | සුගන්ධ තෙල් සහ රෙසිනොයිඩ් වර්ග | 3,601,879,381 |
| 20 | 62 | නොගෙතූ හෝ ක්‍රෝෂේ නොගෙතූ ඇඟලුම් සහ රෙදිපිළි උපාංග | 3,599,074,353 |
| 21 | 8 | කෑමට ගන්නා පළතුරු වර්ග සහ ගෙඩි වර්ග, කොමඩු වර්ග වල හෝ පැණිරි ගෙඩි වල ලෙලි | 3,292,722,762 |
| 22 | 19 | ධාන්‍ය පිටි සහ කැඳ ආහාර | 2,860,531,664 |
| 23 | 9 | කෝපි, තේ, මේට් හා කුළු බඩු වර්ග | 2,755,560,018 |
| 24 | 3 | මත්ස්‍යයන් සහ කවචයන්, මෘද්වංශීන් සහ අනෙකුත් ජලජ අපෘෂ්ඨවංශීන් | 2,500,085,950 |
| 25 | 70 | වීදුරු සහ වීදුරු උපකරණ | 2,446,423,274 |
| 26 | 32 | සම් පදම් කිරීමට සහ සායම් පෙවීමට ගන්නා සාරක (සායම් වර්ණක හා අනෙකුත් වර්ණක ද්‍රව්‍යයන්) | 2,398,652,835 |
| 27 | 29 | කාබනික රසායනික ද්‍රව්‍යයන් | 2,356,973,805 |
| 28 | 94 | ගෘහ භාණ්ඩ | 2,252,112,944 |
| 29 | 83 | ලෝහ වලින් නිම වුණු විවිධ භාණ්ඩ | 2,160,881,415 |
| 30 | 31 | පොහොර | 1,955,637,721 |
| 31 | 55 | කෘත්‍රිම මූලික කෙඳි වර්ග | 1,896,815,353 |
| 32 | 76 | ඇළුමිනියම් සහ ඒවායින් සෑදූ භාණ්ඩ | 1,860,514,918 |
| 33 | 21 | කෑමට යෝග්‍ය විවිධ සංයෝජන | 1,815,419,229 |
| 34 | 23 | ආහාර නිපදවීමේ කර්මාන්ත වල අවශේෂ කොටස් සහ අපද්‍රව්‍යයන් | 1,738,723,743 |
| 35 | 28 | අකාබනික රසායනික ද්‍රව්‍යයන් | 1,630,989,962 |
| 36 | 74 | තඹ සහ එයින් සෑදූ භාණ්ඩ | 1,628,208,248 |
| 37 | 16 | මාංශ වලින්, මාළු වලින්, කවචයින්ගෙන් කරනු ලබන පිළියෙල කිරීම් | 1,618,990,922 |
| 38 | 20 | එළවළු පළතුරු, බීජ හෝ වෙනත් ශාඛ උපාංගවලින් කළ පිළියෙල කිරීම් | 1,610,129,911 |
| 39 | 34 | සබන්, කාබනික පෘෂ්ඨ ක්‍රියාකාරක වර්ග, සේදීමට ගන්නා සකස් කිරීම් | 1,609,345,054 |
| 40 | 64 | පාවහන්, කෙණ්ඩා වැස්ම සහ ඊට සමාන දේවල් | 1,590,426,756 |
| 41 | 52 | කපු | 1,561,788,576 |
| 42 | 44 | දැව දඬු සහ දැව වලින් නිම කල භාණ්ඩ | 1,445,935,617 |
| 43 | 68 | ගලින්, බදාමයෙන්, සිමෙන්ති වලින්, ඇස්බැස්ටෝස් වලින්, තලාතු මිනිරන් වලින් හා ඒ සමාන ද්‍රව්‍යවලින් සෑදූ ද්‍රව්‍ය | 1,360,914,333 |
| 44 | 82 | මූලික ලෝහවලින් සාදන ලද, ආයුධ, හැඳි ගෑරුප්පු ආදිය | 1,237,913,229 |
| 45 | 90 | ප්‍රකාශ තන්තු, ඡායාරූපකරණ හා සිනමාකරණයේදී භාවිතා කරන කොටස් හා උපාංග | 1,216,900,169 |
| 46 | 11 | විදුම් කර්මාන්ත නිෂ්පාදන | 1,086,014,537 |
| 47 | 61 | ගෙතූ හෝ ක්‍රෝෂේ නොගෙතූ ඇඟලුම් හා රෙදි පිළි උපාංග | 1,014,757,521 |
| 48 | 18 | කොකෝවා සහ කොකෝවා සංයෝජන | 935,234,106 |
| 49 | 96 | විවිධ නිෂ්පාදන ද්‍රව්‍ය | 934,048,249 |
| 50 | 14 | එළවළු ද්‍රව්‍ය | 761,854,555 |

## ඉහළ ආදායම් උපයන භාණ්ඩ - 2012

| විස්තරය | මුළු බදු (රු.) | මුළු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස **(%)** |
|---|---|---|
| මෝටර් වාහන | 98,530,285,141 | 27% |
| පෙට්‍රෝලියම් නිෂ්පාදන | 39,556,442,179 | 11% |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික මෙවලම් | 20,213,386,160 | 5% |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 14,401,301,491 | 4% |
| සිමෙන්ති හා සිමෙන්ති ක්ලින්කර් | 13,939,823,766 | 4% |
| විදුලි උපාංග | 11,828,890,683 | 3% |
| අර්තාපල්, ළූණු, කඩල ආදිය | 11,728,689,275 | 3% |
| බීම වර්ග, ස්ප්‍රීතු හා විනාකිරි | 11,609,961,250 | 3% |
| යකඩ හා වානේ භාණ්ඩ | 9,377,751,668 | 3% |
| තිරිඟු | 9,010,925,253 | 2% |
| අනෙකුත් | 128,414,629,366 | 35% |
| | **368,613,086,232** | **100%** |




### ආදායම් එකතු කිරීම සංසන්දනය - 2011 සහ 2012

(රු. මිලියන)

| කාණ්ඩය | 2011 | 2012 | වෙනස |
|---|---|---|---|
| ආනයන රේගු බදු | 76,010.16 | 73,130.54 | -2,879.62 |
| අපනයන රේගු බදු | 16.76 | 20.86 | 4.10 |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 66,030.28 | 69,965.01 | 3,934.73 |
| ආනයන සෙස් බදු | 26,773.48 | 29,579.23 | 2,805.74 |
| ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද | 6.14 | 6.80 | 0.66 |
| අපනයන සෙස් බදු | 2,896.75 | 3,136.46 | 239.71 |
| විශේෂ භාණ්ඩ බද්ද | 15,622.14 | 33,665.84 | 18,043.70 |
| නිෂ්පාදන බද්ද - සිගරට් | 49,589.47 | 53,528.69 | 3,939.22 |
| නිෂ්පාදන බද්ද - මත්පැන් | 0.00 | 39.08 | 39.08 |
| නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් (ආනයන) | 21,827.77 | 27,863.98 | 6,036.21 |
| නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් (දේශීය) | 642.00 | 628.58 | -13.42 |
| නිෂ්පාදන බද්ද - මෝටර් රථවාහන | 52,840.22 | 46,485.09 | -6,355.13 |
| නිෂ්පාදන බද්ද - අනෙකුත් (ආනයන) | 5,246.47 | 2,533.48 | -2,712.99 |
| නිෂ්පාදන බද්ද - අනෙකුත් (දේශීය) | 550.00 | 802.61 | 252.61 |
| එකතුකල අගය මත බද්ද - ආනයන | 112,309.96 | 99,071.89 | -13,238.07 |
| සමාජ වගකීම් බද්ද | 7.37 | 1.29 | -6.07 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 24,466.96 | 23,298.45 | -1,168.51 |
| ඇහලුම් විකිණීම් | 93.83 | 104.69 | 10.86 |
| විවිධ | 5,412.63 | 919.08 | -4,493.54 |
| **එකතුව** | **462353.372** | **466793.658** | **4439.286** |


### ආදායම් එකතු කිරීම සංසන්දනය - 2011 සහ 2012




### වාර්ෂිකව හා මාසිකව රේගු ආදායම් සංසන්දනය

(රු. මිලියන)

| මාසය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 24,709.04 | 17,582.40 | 20,973.27 | 33,334.19 | 36,759.31 |
| පෙබරවාරි | 25,197.60 | 16,886.08 | 27,635.19 | 29,384.19 | 32,070.67 |
| මාර්තු | 27,700.50 | 31,520.28 | 28,276.06 | 38,853.43 | 45,402.23 |
| අප්‍රේල් | 23,732.06 | 19,401.08 | 25,968.24 | 33,264.14 | 40,701.41 |
| මැයි | 25,432.59 | 18,665.66 | 26,127.32 | 36,450.54 | 43,343.16 |
| ජුනි | 22,369.97 | 21,855.94 | 26,949.02 | 36,742.92 | 46,809.47 |
| ජුලි | 24,279.09 | 23,787.96 | 35,493.85 | 37,725.20 | 32,940.12 |
| අගෝස්තු | 24,080.10 | 23,963.84 | 34,428.66 | 38,762.76 | 33,309.60 |
| සැප්තැම්බර් | 23,714.15 | 57,971.03 | 34,620.10 | 40,481.87 | 33,642.72 |
| ඔක්තොම්බර් | 23,326.79 | 22,423.56 | 38,703.04 | 37,155.78 | 33,890.26 |
| නොවැම්බර් | 30,922.61 | 26,380.16 | 40,526.99 | 40,537.47 | 33,072.75 |
| දෙසැම්බර් | 39,771.53 | 38,544.51 | 41,201.04 | 57,650.03 | 31,916.01 |
| එකතුව | **315,236.03** | **318,982.50** | **380,902.78** | **460,342.51** | **443,857.70** |




# මෝටර් වාහන ආනයනය

ආනයනය කරන ලද ඒකක ගණන


| මාසය | ඒකක | |
|---|---|---|
| | **2011** | **2012** |
| ජනවාරි | 34,883 | 50,311 |
| පෙබරවාරි | 34,985 | 38,477 |
| මාර්තු | 37,126 | 53,228 |
| අප්‍රේල් | 41,712 | 33,767 |
| මැයි | 47,794 | 31,080 |
| ජූනි | 44,178 | 19,862 |
| ජූලි | 54,851 | 17,519 |
| අගෝස්තු | 45,842 | 19,800 |
| සැප්තැම්බර් | 52,843 | 33,313 |
| ඔක්තෝබර් | 49,480 | 43,758 |
| නොවැම්බර් | 35,192 | 25,505 |
| දෙසැම්බර් | 47,022 | 26,668 |
| එකතුව | **525,908** | **393,288** |



# මෝටර් වාහන ආනයනය

CIF වටිනාකම


| මාසය | CIF (රු.) | |
|---|---|---|
| | **2011** | **2012** |
| ජනවාරි | 14,523,722,878 | 21,256,336,140 |
| පෙබරවාරි | 12,373,845,242 | 16,954,170,840 |
| මාර්තු | 16,554,923,978 | 24,426,409,258 |
| අප්‍රේල් | 14,428,851,903 | 16,083,149,987 |
| මැයි | 16,615,696,882 | 15,659,343,418 |
| ජූනි | 15,565,149,707 | 10,556,027,168 |
| ජූලි | 18,429,774,777 | 10,720,764,216 |
| අගෝස්තු | 17,907,567,940 | 10,329,151,341 |
| සැප්තැම්බර් | 19,059,350,081 | 8,438,231,519 |
| ඔක්තෝබර් | 18,640,067,761 | 7,275,261,435 |
| නොවැම්බර් | 15,474,611,733 | 8,406,879,450 |
| දෙසැම්බර් | 16,909,220,753 | 7,179,033,205 |
| එකතුව | **196,482,783,635** | **157,284,757,977** |



# මෝටර් වාහන ආනයනය

## බදු ආදායම්


| මාසය | ආදායම් (රු.) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ජනවාරි | 9,725,110,365 | 11,109,844,511 |
| පෙබරවාරි | 8,069,640,783 | 8,233,046,108 |
| මාර්තු | 10,464,242,348 | 13,911,906,605 |
| අප්‍රේල් | 8,868,923,698 | 11,783,621,944 |
| මැයි | 11,783,367,142 | 12,364,583,772 |
| ජුනි | 10,444,041,904 | 5,354,183,367 |
| ජුලි | 11,506,136,845 | 5,455,760,513 |
| අගෝස්තු | 11,578,660,244 | 5,918,646,790 |
| සැප්තැම්බර් | 12,229,833,942 | 5,413,904,828 |
| ඔක්තොම්බර් | 11,398,540,101 | 4,922,883,651 |
| නොවැම්බර් | 10,424,804,707 | 4,996,455,008 |
| දෙසැම්බර් | 11,923,432,615 | 5,008,196,732 |
| එකතුව | **128,416,734,694** | **94,473,033,829** |



# මෝටර් වාහන ආනයනය


මෝටර් වාහන සඳහා ලබා දුන් රේගු බදු සහනය

| මාසය | බදු සහනය ලබා දුන් මෝටර් වාහන සඳහා CIF වටිනාකම (රු.) | රේගු බදු සහනය (රු.) |
|---|---:|---:|
| ජනවාරි | 1,767,645,523 | 530,642,962 |
| පෙබරවාරි | 1,208,605,316 | 354,475,682 |
| මාර්තු | 1,365,704,963 | 404,307,141 |
| අප්‍රේල් | 3,710,720,650 | 1,109,027,819 |
| මැයි | 1,942,572,634 | 568,554,961 |
| ජූනි | 476,510,293 | 127,446,153 |
| ජූලි | 821,107,209 | 255,599,874 |
| අගෝස්තු | 997,839,407 | 306,745,364 |
| සැප්තැම්බර් | 1,123,532,467 | 337,370,893 |
| ඔක්තොම්බර් | 1,705,668,281 | 282,494,886 |
| නොවැම්බර් | 917,994,172 | 207,473,850 |
| දෙසැම්බර් | 487,379,090 | 148,328,334 |



## මෝටර් වාහන ආනයනය

CIF වටිනාකමට එදිරිව ආදායම (එකතුකරන ලද/අතහැර දමන ලද)



## විශේෂ ව්‍යාපෘති සඳහා අත්හැර දමන ලද බදු

| ව්‍යාපෘතිය | වටිනාකම (රු.) | රේගු බදු (රු.) |
|---|---|---|
| කොළඹ-කටුනායක සීඝ්‍රගාමී මාර්ගය ව්‍යාපෘතිය | 724,570,276 | 87,708,763 |
| කොළඹින් පිටත අධිවේගී මාර්ගය, කඩුවෙල-කොට්ටාව ව්‍යාපෘතිය | 25,989,016 | 6,079,804 |
| වරාය සංවර්ධන ව්‍යාපෘතිය - හම්බන්තොට | 432,352,420 | 24,242,352 |
| උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 1,591,746,367 | 93,135,803 |
| එකතුව | **2,774,658,079** | **211,166,722** |


## වෙළඳ ගිවිසුම් යටතේ ආනයන - 2012 වර්ෂය

| වෙළඳ ගිවිසුම් | රේගු ප්‍රකාශන සංඛ්‍යාව | දල ස්කන්ධය (කිලෝ) | වටිනාකම (රු.) | බදු එකතුව (රු.) |
|---|---|---|---|---|
| **APTA** | 379 | 4,921,643 | 1,248,627,742 | 862,061,543 |
| **GSTP** | 272 | 7,744,291 | 6,478,659,698 | 74,812,981,670 |
| **ISFTA** | 19,354 | 1,602,232,282 | 49,755,323,145 | 101,942,642,519 |
| **PSFTA** | 1,231 | 945,852,243 | 13,948,734,136 | 6,160,535,350 |
| **SAFTA** | 156 | 740,989 | 139,950,516 | 244,849,239 |
| **SAPTA** | 89 | 429,793 | 86,093,393 | 46,170,486 |
| **SAPTALDC** | 27 | 84,210 | 52,877,354 | 26,185,264 |
| එකතුව | **21,508** | **2,562,005,452** | **71,710,265,984** | **184,095,426,071** |

| | |
|---|---|
| **APTA** | ආසියා පැසිපික් වෙළඳ ගිවිසුම යටතේ වන ආනයන |
| **GSTP** | වෙළඳ වරණයන් සඳහා වූ ගෝලීය ක්‍රමවේදය පිළිබඳ ගිවිසුම යටතේ වන ආනයන |
| **ISFTA** | ඉන්දු ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම යටතේ වන ආනයන |
| **PSFTA** | පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වන ආනයන |
| **SAFTA** | දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශ සඳහා වන ගිවිසුම යටතේ වන ආනයන |
| **SAPTA** | දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ ආනයන |
| **SAPTA-LDC** | අඩුවෙන්ම සංවර්ධිත රටවල් සඳහා දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ ආනයන |

## වෙළඳ ගිවිසුම් යටතේ ආනයන සඳහා දල ස්කන්ධය

සියලුම ආනයන වල ප්‍රතිශතයක් ලෙස



# නීති බලාත්මක කිරීමේ

# පරිච්ඡේදය

# නිවාරණ අංශය

## හැඳින්වීම

මුහුදු වරාය, තොටුපල, ජලමාර්ග, ජාත්‍යන්තර මුහුදු සීමාව, නිදහස් වෙළඳ කලාප, අපනයන සැකසුම් කලාප භාණ්ඩ නිරීක්ෂණ අංගනයක් ආදී සෑම ස්ථානයකම සිදුවන සමස්ත රේගු මෙහෙයුම් පිළිබඳ ආවේක්ෂණයෙහි යෙදෙමින් ශ්‍රී ලංකා රේගුවේ නීති බලාත්මක කෙරෙන ප්‍රධානතම අංශය නිවාරණ අංශයයි.
ඒ යටතට ගැනෙන පරිපාලන "පී" ශාඛාව මෙහෙයුම් සමුද්‍ර, විමර්ශණ, මෙගාපෝට් ආවේක්ෂණ, විකුණුම් යනාදී ශාඛා මෙන්ම දිවයින පුරා මුහුදු බඩ **ප්‍රදේ**ශයන්හි පිහිටි උප නිවාරණ කාර්යාල කීපයකින්ද මෙම අංශය සමන්විත වේ.

**ප්‍රධාන කර්තව්‍යයන් වනුයේ ,**

1. නීති විරෝධී ජාවාරම්, වාණිජ වංචා සහ නීති විරෝධී **මත්ද්‍රව්‍ය** ප්‍රවාහනය වැලැක්වීම.
2. රේගු වැරදි පිළිබඳ තොරතුරු ලබාගෙන එකී තොරතුරු ලබාගෙන එකී තොරතුරු මත ක්‍රියාකාරීවීම.
3. රේගුව විසින් සොයා ගන්නා රේගු වැරදි හා වංචා වලට අදාළ සැක සහිත භාණ්ඩ රඳවා ගැනීම, විමර්ෂණය සහ විමර්ශණයන් පවත්වා වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීම.
4. අයවිය යුතු බදු ආදායම රැස්කරන බවට වගබලා ගැනීම.
5. මෙරට සමාජ ආර්ථික හා පාරිසරික වැදගත්කම රැකගනිමින්/ ඊට එරෙහි වන්නන්ට විරුද්ධව නීති සහ විධිවිධාන බලාත්මක කිරීම.
6. කොළඹ වරාය ඇතුළු අනෙකුත් මුහුදු වරායන්ද බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොපල තුළ සහ මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොඩුපල තුළ ආවේක්ෂණ කටයුතු සිදු කිරීම.
7. යාත්‍රා පාලනය සහ සමුද්‍ර සීමා මෙහෙයුම් පාලනය.
8. ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය.

**1. නීති විරෝධී ජාවාරම්, වාණිජ වංචා සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය වැලැක්වීම.**

නිවාරණ අංශයේ ප්‍රධාන කාර්යාලය, "කොටුවේ නිවාරණ කාර්යාලය" යනුවෙන් හැඳින්වෙන අතර එය කොළඹ වරාය තුළ පිහිටා තිබේ. මීගමුව, කොග්ගල, ගාල්ල, ත්‍රිකුණාමලය, මීගමුව සින්නපාඩු යනාදි මුහුදුබඩ නගරවල උප නිවාරණ කාර්යාල පිහිටා තිබේ. එම නිලධාරීන් නීති විරෝධී ජාවාරම් වාණිජ වැරදි, මත්ද්‍රව්‍ය ජාවාරම් ආදිය වැළැක්වීමට සක්‍රියව මැදිහත් වේ. එසේම නිදහස් වෙළඳ කලාප වල රාජකාරී කරන නිලධාරීන් බදු අයකර ගත හැකි භාණ්ඩ වලින් සිදුවන බදු මගහැරීම් ආදිය වළක්වාලීමට මෙහෙයුම් ක්‍රියාත්මක කරයි.

සාමය ස්ථාපිත වීමත් සමඟ යාපනය සහ මන්නාරම පිහිටි උප නිවාරණ කාර්යාල දෙකද යළි විවෘත කිරීමට පියවර ගෙන ඇත. එසේ වුවද, යාත්‍රා නොමැතිකම නිසා සමුද්‍ර නීති බල ගැන්වීම අසීරු කටයුත්තක් වී තිබේ.

2012 වසරේ මුල පටන් හම්බන්තොට වරාය සහ මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල ආශ්‍රිතව පැවරු රාජකාරි ඉටුකිරීම සඳහා ද නිවාරණ නිලධාරීහු ස්ථානගත කර සිටිති.

**2. වැටලීම්, රඳවා ගැනීම්, විමර්ශනයන් හා නඩු පැවරීම්.**

පහත සඳහන් ප්‍රධානතම මූලාශ්‍ර දෙකෙන් විවිධ රේගු වැරදි (වාණිජ වංචා සහ මත්ද්‍රව්‍ය ජාවාරම්) පිළිබඳ තොරතුරු නිවාරණ අංශය වෙත ලැබේ.

අ) මෙම අංශයේ නිලධාරීන්ගේ පෞද්ගලික දැනුම් දෙන්නන්.

ආ) මහජන දැනුම් දෙන්නන්.

එවැනි තොරතුරු මත ක්‍රියාත්මක වූ මෙම අංශයේ නිලධාරීන්ට 2012 වසරේදී වංචා කීපයක් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබිණි.

මීට අමතරව මෙම අංශයේ නිලධාරීන්ගේ සුවිශේෂී හැකියාවන් උපයෝගී කරගෙන නැව් භාණ්ඩ ලේඛනය හා ආනයන ලේඛන ඇසුරින් සිදුකළ වංචාවන් කිහිපයක්ම අනාවරණය කරගෙන ඒ මත වැටලීම් කිරීමට හැකිවිය. එසේම ලැබුණු තොරතුරු මත ක්‍රියාත්මක වෙමින් කළ වැටලීම් වලදී බදු නොගෙවා ආනයන කළ හෝ හොරෙන් ගෙන්වූ භාණ්ඩ සුවිසාල ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීමට මෙම අංශය සමත්විය. ඒ සම්බන්ධ විමර්ශන හා නඩු පැවරීම් ද නිවාරණ අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලැබිණි.

එසේම නියමානුකූල අවදානම් කළමනාකරණ වැඩසටහන් සඳහා තාක්ෂණික උපදෙස් ලබාගැනීමටත් එමගින් සීමිත මිනිස් සම්පතෙහි සඵලදායකත්වය ඉහළ දමා ගැනීමටත් එමඟින් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින්ගේ ධාරිතා වර්ධනය කර ගැනීමටත් මෙම අංශය යෝජනා කරයි.

## 3. නියමිත පරිදි රාජ්‍ය ආදායම එකතු කරන බවට වගබලා ගැනීම.

ආනයන හා අපනයන මගින් ලැබෙන රාජ්‍ය ආදායම එකතු කිරීම රේගුවේ ප්‍රධාන කාර්ය භාරයයි. රේගු දෙපාර්තමේන්තුව මගින් අව්‍යාජ වෙළඳුන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා හඳුන්වා දෙනු ලැබූ විශාල වශයෙන් ප්‍රතිඵල ගෙන දෙන්නා වූ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග රාජ්‍ය ආදායම වංචා කිරීමට නැඹුරුවක් ඇති අයට රේගු දැලෙන් රිංගා යාමට සුළු ඉඩක් ලබාගෙන ඇත. බහුතරයක් ව්‍යාපාරිකයන් ස්වෙච්ඡාවෙන්ම නීතියට අනුකූලව කටයුතු කරන අතර වැරදි කිරීමට නැඹුරුවක් ඇත. සුළුතරයක් වෙළඳුන් ඔවුන්ගේ ආනයනික භාණ්ඩ සඳහා වැරදි අර්ථකථන , මිල අඩුවෙන් සඳහන් කිරීම හා භාණ්ඩ රේගුවට ඉදිරිපත් නොකර non declamation සිටින අවස්ථා ඇත.

එවැනි වැරදිකරුවන් හසුකර ගැනීමට පසු නිශ්කාෂණ විගණන අංශය විසින් පසු නිශ්කාෂණ පදනමින් විගණන පැවැත්වීමට අමතරව මෙහිදී නිවාරණ අංශයේ නිවාරණ නිලධාරීන්ගේ ක්‍රියාකාරී වැටලීම් නිසිත්, එවැනි වංචාකරුවන්ට ප්‍රබල බාධාවක් එල්ල වී ඇත. නිවාරණ අංශය විසින් කලට වේලාවට සිදු කළ මැදිහත්වීම් නිසා එවැනි කූට වෙළඳුන්ට එරෙහිව දඩ ගැනීමටත්, භාණ්ඩ රාජසන්තක කිරීමටත්, අමතර බදු මුදල් අයකර ගැනීමටත්, හැකි වී තිබේ. 2012 වසර තුළ නිවාරණ අංශය විසින් සිදුකළ මැදිහත්වීම් තුළින් පැන වූ දඩ මුදල් රාජසන්තක කිරීම් වලින් රු. මිලියන 135.87ක් සහ අමතර අයබදු වශයෙන් රු. මිලියන 119.29 ක් රැස්කර ගැනීමට සමත් විය.

නිවාරණ අංශයේ සියළු ශාඛා මගින් 2012 වසර තුළදී මූල පිරු නඩු සංඛ්‍යාව 1309කි. පසුගිය වසර සමඟ සැසඳීමේදී මූලපිරු නඩු සංඛ්‍යාවත් දඩ මුදල් ප්‍රමාණයත්, රාජසන්තක කිරීම් ප්‍රමාණයත්, මේ වසරේදී විශාල වශයෙන් ඉහළ ගොස් තිබේ.

2012 වසරේදී මෙම අංශයෙන් සිදුකළ නඩු කටයුතු පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ලියාපදිංචි කළ නඩු සංඛ්‍යාව | 2,221 |
| නිමාකළ නඩු සංඛ්‍යාව | 1,309 |
| වරද කරුවන් තහවුරු කළ සහ රාජසන්තක කිරීම්, දණ්ඩන පැනවූ නඩු සංඛ්‍යාව | 293 |

| | |
|---|---|
| රැස් කළ දඩ හා රාජසන්තක කිරීම් සමස්ත ආදායම | රු. මි. 135.87 |
| A/E (අතිරේක සටහන්කර) වශයෙන් රැස් කළ සමස්ත ආදායම | රු. මි. 119.29 |
| රැස්කළ සමස්ත අයබදු (දේශීය විකුණුම්) | රු. මි. 861.55 |
| සමස්ත අතිකාල හෝ අනෙකුත් අය කිරීම් | රු. මි. 17.91 |
| රැස්කළ සමස්ත අගය මිලියනවලින් - | 1,134.64 |

ඉහත දක්වා ඇති සටහනට ඇතුළත් නොකළ ද, 2012 වසර තුළ දී නිවාරණ අංශය විසින් සිදු කළ වාණිජ වංචා සහ භාණ්ඩ ජාවාරම් සිද්ධීන් කීපයක විමර්ශන කටයුතු නිමා වී නොමැති ඒවා පහත දැක්වේ.

| සිද්ධ අංකය | භාණ්ඩ ආනයනකරු | | භාණ්ඩ තොගයේ වටිනාකම |
|---|---|---|---|
| PREV/FPO/905/2012 | රහස්‍යතාවය සුරකිනු පිණිස හෙළි නොකෙරේ. | අප්‍රකාශිත භාණ්ඩ | මිලියන 20 ඉක්ම වූ |
| PREV/FPO/1668/2012 | - එම - | ජාවාරම් භාණ්ඩ රේගු (ප්‍රකාශනයක් පවා නොමැති) | මිලියන 50 ඉක්ම වූ |
| PREV/FPO/1826/2012 | - එම - | ජාවාරම් භාණ්ඩ | මිලියන 03 ඉක්ම වූ |
| PREV/FPO/2210/2012 | - එම - | දුම්වැටි ඇතුළු ජාවාරම් භාණ්ඩ | මිලියන 30 ඉක්ම වූ |

ඉහත සඳහන් කළ වංචා සහගත ආනයනයන්ට අමතරව ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබූ බඩු තොග එකොළහක්(11) වැටලීමට ද නිවාරණ අංශය සමත් විය.

## 4. සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කමක් ඇති දෑ සංරක්ෂණය සහ අදාළ නීති, රෙගුලාසි බලාත්මක කිරීම

රටේ පවතින සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වශයෙන් වැදගත් කමක් දක්වන දෑ සංරක්ෂණය කිරීමට නිවාරණ අංශයට එහි මෙහෙයුම් අනුව හැකි වී ඇත.

රේගු ආඥා පනතේ එන රෙගුලාසිවලට අමතරව, නිවාරණ අංශයේ නිලධාරීන් විසින් වෙනත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.
උදා-

1. අවි සහ පතරොම් පනත
2. වන සත්ත්ව සහ ශාක පිළිබඳ පනත
3. ආනයන සහ අපනයන පාලක පනත
4. විද්‍යුත් උපකරණ හා ඖෂධ පනත
5. විදුලි සංදේශ සහ නියාමන කොමිෂන් පනත
6. ආහාර හා ඖෂධ පනත
7. විනිමය පාලන පනත
8. බුද්ධිමය දේපළ පනත

## 5. කොළඹ වරාය අනෙකුත් වරායන්, නිදහස් වෙළඳ කලාප සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සුපිරික්සුම

කොළඹ වරායේ සුපරීක්ෂාව නිවාරණ අංශයට අයත් කොටුව නිවාරණ කාර්යාලය හා කොච්චිකඩේ නිවාරණ කාර්යාලය මගින් සිදු කරන අතර, කොටුව ප්‍රදේශයේ හා කොච්චිකඩේ ප්‍රදේශයේ සුපරීක්ෂාව පිළිවෙලින් ඉහත කාර්යාල වෙත පැවරී ඇත. දිනපතා පැය 24 පුරාම මෙම කාර්යාල විවෘතව පවතින අතර, ඒ ඒ කාර්යාල සඳහා වෙන වෙනම ගොඩබිම රාජකාරි භාර නිලධාරියෙක් (**LDO**)හැම මොහොතකම රාජකාරියේ නියුතු වෙයි. මෙම නිලධාරීන් තමන්ට අදාළ ගේට්ටු නිල පිරික්සුමට භාජනය කරන අතර, එමගින් එම අදාළ ස්ථානවල නියමිත නිලධාරීන් සේවයේ යෙදී සිටින බවට තහවුරු කර ගනී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ නයිකන්දේ පිහිටි උප නිවාරණ කාර්යාලයෙනි. එලෙසම බියගම පිහිටි උප නිවාරණ කාර්යාලය මගින් බියගම නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කෙරේ.

කෙසේ වුවත්, පල්ලෙකැලේ, හොරණ, මීරිගම යනාදී අපනයන සැකසුම් කලාප නිවාරණ අංශයේ සුපරීක්ෂණය යටතේ නොපවතී. එනිසා එම කලාප ආශ්‍රිතව උප නිවාරණ කාර්යාල පිහිටුවීම හෝ එම කලාපවලට උප නිවාරණ කාර්යාලවලින් නිලධාරීන් පත් කිරීම රේගු කටයුතු සිදු කිරීමට මහත් පිටුවහලකි.

## 6. නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය සහ දේශ සීමා මෙහෙයුම්

හම්බන්තොට වරාය ද ඇතුලුව ප්‍රධාන වරායන් හතරෙහි නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය නිවාරණ අංශය සතු වගකීමකි. කොටුව නිවාරණ කාර්යාලය මගින් කොළඹ වරායේ එම රාජකාරි සිදු කරන අතර, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වරායන්වල දී අදාළ ස්ථානවල උප නිවාරණ කාර්යාල මගින් එම රාජකාරි සිදු කරනු ලැබේ.

කොටුව නිවාරණ කාර්යාලය මගින් දවසේපැය 24 පුරා වරාය රාජකාරි භාර නිලධාරීවරයෙකු )HDO) නාවික යාත්‍රා මෙහෙයුම් රාජකාරි සඳහා යොදවනු ලබයි. ඔහු වරායට සේන්දු වන නැව්වලට ගොඩවන අතර, එහිදී අදාළ නැව අවසන් වරට සේන්දු වූ වරායෙන් නිකුත් කෙරුණු නික්ම යාමේ අවසර පත්‍රය තිබේදැයි විමසිලිමත් වෙයි. අදාළ නැවේ සියලු නාවුකයින්ට අදාළ ප්‍රකාශ පත්‍රය ද ඔහු පරීක්ෂා කරයි. (IMO Crew declarations) නැව් බඩු ලේඛනය රේගුවට ප්‍රකාශ කර භාරදීම කොළඹ වරායට සේන්දු වන සෑම නැවකට දේශීය නියෝජිතගේ (අදාළ නැවේ කපිතාන්ගේ නියෝජිත වශයෙන්) වගකීමකි.

දේශීය නියෝජිත විසින් අදාළ සියලු රාජකාරිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු සෑම නැවක් සඳහාම පිටත්වීමේ අවසරය "Outward Clearance" වරාය රාජකාරි භාර නිලධාරියා විසින් නිකුත් කරනු ලබයි.

දැනට නැවේ දේශීය නියෝජිත විසින් අපනයන නැව් බඩු ලේඛනය export cargo නිවාරණ කාර්යාලයට භාර නොදෙන බැවින් පිටත්වීමේ අවසරය ලබා දෙන නිලධාරියාට අදාළ නික්ම යන නැවේ ඇති අපනයන භාණ්ඩ දත්ත පිළිබඳ වැටහීමක් නැත.

## 7. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරන ලද භාණ්ඩ (බැහැර කිරීම) අලෙවි කිරීම

මුලු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශ හා ශාඛා මගින් තහනම් කරනලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීමේ බලය මධ්‍යම විකුණුම් අංශය වෙත පවරා ඇත. රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීම සම්බන්ධ ප්‍රතිපාදන රේගු ආඥා පනත මගින් සලසා ඇත. රජයේ මුදල් රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් මගින් විකිණීමේ පටිපාටිය එම වෙන්දේසිවලදී අනුගමනය කරනු ලැබේ.

# සමාජ ආරක්ෂණ අංශය

හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුළදී මින් පෙර සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් විවිධ කාර්යාංශයන් යටතේ ක්‍රියාත්මක වූ ඒකක ඒකාබද්ධ කරමින් සමාජ ආරක්ෂණ කටයුතු සඳහා වූ විශේෂ කාර්යාංශයක් ස්ථාපිත කරන ලදී. ඒ අනුව,

- මත්ද්‍රව්‍ය පාලන අංශය
- පාරිභෝගික හා පරිසර ආරක්ෂණ අංශය සහ
- ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් සුරැකීමේ අංශය

යන අංශය එම කාර්යාංශය යටතට ගෙන එනු ලැබීය.

**ප්‍රධාන කාර්යයන්**

සමාජ ආරක්ෂණ කාර්යාංශයේ ප්‍රධානතම කාර්යය වනුයේ -
පරිසරය හා ජෛව විවිධත්වය
සංස්කෘතිය හා ජාතික උරුමයන් හා
පාරිභෝගික අයිතීන් යන අංශ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වැළැක්වීමේ පියවර ගැනීමයි.

කාර්යාංශයේ අනෙකුත් කාර්යයන් අතරට මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම / නිරෝධනය කිරීම ඇතුලත් වේ.

## මත්ද්‍රව්‍ය පාලන අංශය

මත්ද්‍රව්‍ය පාලන අංශයේ ප්‍රධානතම කාර්යභාරයන් වනුයේ නිත්‍යානුකූල රේගු මාධ්‍යයන් ඔස්සේ (ආනයන, අපනයන, ත්‍යාග, තැපැල් භාණ්ඩ, කුරියර් සේවා, මගීන් හා මගී ගමන් මළු) සිදුවන මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම සහ රේගු නීතිය හා අදාල අනෙකුත් නීති ක්‍රියාත්මක කිරීම හරහා රටේ සමාජ ආර්ථික, සෞඛ්‍යය හා සංස්කෘතිකමය බැඳියාවන් ආරක්ෂා කිරීමයි.

**ප්‍රධාන කාර්යයන්**

1. ගුවන් තොටුපොල තුල පැය 24 පුරා ක්‍රියාත්මක සෝදිසි කටයුතු
2. ගුවන් භාණ්ඩ, මුද්‍රණ භාණ්ඩ, තැපැල් හා කුරියර් ආදිය අහඹු ලෙස සෝදිසි කිරීම
3. ගුවන් හා මුහුදු වාණිජ ආනයන අපනයනයන් හරහා සිදුවන මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය ජාවාරම් කිරීම හඳුනාගැනීම හා වැලැක්වීම
4. විශ්වාසනීය තොරතුරු මත විමර්ශනයන් සිදු කිරීම
5. දැනුවත් කිරීමේ හා ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. පූරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනයන්, ප්‍රතිනැව්ගත කිරීම් හා අපනයනයන් පිළිබඳ විමසිලිමත් වීම
7. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය සමග එක්ව ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම

# 2012 වසරේ මත්ද්‍රව්‍ය සොයාගැනීම්

| විස්තරය | ප්‍රමාණය (ග්‍රෑම්) | වටිනාකම (රු.) |
|---|---|---|
| කොකේන් | 3300 | 4,500,000/- |
| හෙරොයින් | 720 | 6,000,000/- |
| ගංජා | 24067.9 | 3,572,000/- |
| හෂීස් | 366.07 | 55,000/- |
| මෙතම්ෆෙටමයින් | 1710 | 20,100,000/- |

## මත්ද්‍රව්‍ය නොවන සොයාගැනීම්

| මාසය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|
| ජනවාරි | රන් ආභරණ - ග්‍රෑම් 2126 | 12,543,400/- |
| | පැන් පරග් - කි ග්‍රෑ. 54 | 540,000/- |
| මාර්තු | රන් ආභරණ, රන් බිස්කට් - ග්‍රෑම් 1740 | 11,052,000/- |
| අප්‍රේල් | හැන්ස් - කිලෝග්‍රෑම් 144 | 1,200,000/- |
| මැයි | සිගරට් - කාටුන් 285 | 712,500/- |
| ජුලි | සිගරට් - කාටුන් 266 | 543,000/- |
| ඔක්තෝබර් | ගබ්සා පෙති | 794,000/- |
| | රන් කුඩු | 6,467,500/- |
| නොවැම්බර් | ගබ්සා පෙති | 650,000/- |

# සොයාගැනීම් කිහිපයක් පිළිබඳ විස්තර ලුහුඬින්

★දිනය : 12.03.2012 වේලාව පෙ.ව. 5.30





බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පැමිණීම් පර්යන්තයේදී (හරිත) පිරිමි මගියකු නවතා පරීක්ෂා කරන ලද අතර ඔහුගේ අත් බෑගය පරීක්ෂා කිරීමේදී මත්ද්‍රව්‍ය ඒකකයේ නිලධාරීන් හට සැක කටයුතු කිසිවක් සොයාගැනීමට නොහැකි විය. වැඩිදුර පරීක්ෂා කිරීමේදී ඔහු පැළඳ සිටි දණහිස් ආරක්ෂක ආවරණය තුළ හා ඔහුගේ කලිසම් සාක්කුවක තිබී රන් පටි හා ආභරණ සොයා ගැනිණ.

ග්‍රෑම් 1740 ක් බරැති එම රන්පටි හා ආභරණ වල වටිනාකම රු. 11, 052,000/-. ක් විය.
මගියා ශ්‍රී ලාංකිකයෙකු බවත් සිංගප්පූරුවේ සිට පැමිණ ඇති බවත් මූලික පරීක්ෂණවලදී අනාවරණය විය.

දිනය : 2012.08.01 වේලාව : පෙ.ව. 9.40






සැක කටයුතු හැසිරීම හේතුවෙන් ඉරාන ජාතික මගීන් දෙදෙනෙකු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ මගී පර්යන්තයේදී (හරිත) නවතා පරීක්ෂා කරන ලදී. මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරීන් විසින් සිදු කරන ලද මූලික පරීක්ෂණයේදී එම මගින්ගේ ගමන් බෑග වලින් එකක ඇති ප්ලාස්ටික් දාරය කළු පැහැති ටේප් පටි වලින් ඔතා ඇති බව නිරීක්ෂණය විය.
වැඩිදුර පරීක්ෂණයේදී අදාල ගමන් බෑගයේ ප්ලාස්ටික් දාරයේ සහ හිසකෙස් සඳහා භාවිතා කරන ද්‍රවයක් සහිත භාජනයක සඟවා තිබූ මෙතම්ෆෙටටයින් ලෙස සැක කළ හැකි ග්‍රෑම් 1340 ක් බරැති සුදු කුඩු වර්ගයක් සොයා ගැනීමට හැකි විය.




දෙවැනි මගියාගේ ගමන් බෑගය පරීක්ෂා කිරීමේදී අසාමාන්‍ය බරක් සහිත රැවුල කැපීමේදී භාවිතා කරන ජීලට් වර්ගයේ ක්‍රීම් භාජනයක් මත්ද්‍රව්‍ය ඒකකයේ නිලධාරීන්ට හසු විය. එහිදී එම භාජනය තුළ සඟවා තිබූ තවත් මෙතම්ෆෙටමයින් ග්‍රෑම් 370ක් අදාල නිලධාරින් විසින් සොයා ගැනිණ.

***දිනය : 2012.10.05*** ***වේලාව : පෙ.ව. 6.45***



බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල මගී පැමිණීමේ පර්යන්තයේදී (රතු) පිරිමි මගියකු නවතා පරීක්ෂා කරන ලදී. ඔහුගේ බෑගයක් පරීක්ෂා කිරීමේදී කරදමුංගු බෑග් 2 ක් සොයාගැනීමට මත්ද්‍රව්‍ය නිලධාරීන්ට හැකි විය. වැඩි දුර පරීක්ෂණයේදී එම කරදමුංගු පැකට් 2 තුළ සඟවා තිබූ ග්‍රෑම් 3900 ක් බරැති ගංජා යැයි සැක කළ හැකි දුඹුරු වර්ගයේ ද්‍රව්‍යයක් සහිත පැකට් 21 ක් සොයා ගැනිණ.



එම මගියා ශ්‍රී ලාංකිකයෙකු බවත් නිතර නිතර ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සංචාරය කරන්නෙකු බවත් මූලික පරීක්ෂණයේදී අනාවරණය විය.

***දිනය : 2012.11.20*** ***වේලාව පෙ.ව. 4.20***





*බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල මගී පැමිණීමේ පර්යන්තයේදී (රතු) පිරිමි මගියකු නැවත පරීක්ෂා කරන ලදී. ඔහුගේ ගමන් මළු පරීක්ෂා කිරීමේදී ඒ තුළ ඇඟලුම් බණ්ඩල 2 ක් රේගු නිලධාරීන් විසින් සොයා ගැණින. වැඩිදුර පරීක්ෂණයේදී එම ඇඟලුම් බණ්ඩල 2 තුළ සඟවා තිබූ ග්‍රෑම් 16500 ක් බරැති ගංජා යැයි සැක කළ හැකි දුඹුරු පැහැති ද්‍රව්‍ය පැකට් 72 ක් අදාල නිලධාරීන් විසින් සොයා ගැණින.*

*එම මගියා ශ්‍රී ලාංකිකයෙකු බවත් නිතර නිතර ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සංචාරය කරන්නෙකු බවත් මූලික විමර්ශනයේදී අනාවරණය විය.*

***දිනය : 2012.12.13*** ***වේලාව : පෙ.ව. 4.45***





බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගී පැමිණීම් පර්යන්තයේදී (හරිත) පිරිමි මගියෙකු නවතා පරීක්ෂා කරන ලදී. ඔහුගේ ගමන් බෑගය පරීක්ෂා කළ මත්ද්‍රව්‍ය පාලන අංශයේ නිලධාරීන් හට එහි පතුලේ අසාමාන්‍ය ඝනකමක් නිරීක්ෂණය කළහ. වැඩිදුර පරීක්ෂණයේදී ගංජා යැයි සැක කළ හැකි ග්‍රෑම් 1879 ක් බරැති දුඹුරු පැහැති ද්‍රව්‍ය පැකට් 4 ක් සොයා ගැනිණ. ඉන් පැකට් තුනක් ගමන් බෑගයේ පතුලේ (අසාමාන්‍ය ලෙස සකස් කරන ලද) ද අනෙක ඩෙනිම් කලිසමේ සාක්කුවේද සඟවා තිබිණ.

මගියා ශ්‍රී ලාංකිකයෙකු බවත්, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර නිතර නිතර සංචාරය කරන්නෙකු බවත් මූලික පරීක්ෂණ වලදී අනාවරණය විය.

**සාරාංශය**

- 2012 වර්ෂයේ ලියාපදිංචි සිද්ධි සංඛ්‍යාව - 27
- සම්පූර්ණයෙන් අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව - 17
- අධිකරණයට ඉදිරිපත් කරන ලද වැරදි හා පමුණුවන ලද දඩ සංඛ්‍යාව - 17
- එකතු කර ගන්නා ලද මුළු දඩ මුදල - 1,910,000/-
- රේගුව භාරයට ගත් භාණ්ඩ වල මුළු වටිනාකම - 32,755,727/-
- 2012 වර්ෂය තුළ අවසන් නොකරන ලද සිද්ධි සංඛ්‍යාව - 10

# ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ආරක්ෂණ අංශය

නීති විරෝධී වනජීවී වෙළඳාම පිටු දකිමින් රටේ පරිසරය ජෛව විවිධත්වය හා සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමත් අව්‍යාජ වෙළඳාම පහසු කිරීමත් මෙම අංශය ස්ථාපිත කිරීමේ අරමුණු වේ.

## ප්‍රධාන කාර්යයන්

- ජෛව විවිධත්ව ආශ්‍රිත නිෂ්පාදන දේශසීමා අතර සංසරණය වීමේදී ඒවාට අදාල ජාතික හා ජාත්‍යන්තර නීති ක්‍රියාත්මක කිරීම
- ජෛව විවිධත්ව ආශ්‍රිත සියළු ආනයන හා අපනයනවල විස්තර, වර්ගීකරණය හා වටිනාකම පරීක්ෂා කිරීම
- ජෛව විවිධත්ව ආශ්‍රිත ආනයන හා අපනයන, ශාක හා සත්ව සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය හා අපනයනය පාලනය කරනු ලබන බලපත්‍ර අවශ්‍යතා හා අනුකූල වන බව තහවුරු කිරීම
- රටේ ජෛව විවිධත්ව උරුමයට හානි නොවන ආකාරයට ශාක හා සතුන් ආනයනය හා තිරසාර අපනයනය තුළින් රටේ සංවර්ධන වැඩසටහන පහසු කිරීම

2012 වසර තුළදී ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ (ජෛ.ස.ජා.ආ.) අංශයේ නිලධාරීන් විසින් සිදු කරන ලද සොයාගැනීම්

| දිනය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|
| 01/03/2012 | ජීවී පක්ෂීන් | 4,590,000/- |
| 11/05/2012 | ඩොලමයිට් කුඩු කි.ග්‍රෑ. 2050 | 82,291.08/- |
| | ඩොලමයිට් කැට කි.ග්‍රෑ. 2400 | |
| 30/05/2012 | කුරුළු කූඩු කි.ග්‍රෑ. 0.5 | 264,503.40/- |
| 22/08/2012 | හම් | 13,419,668/ |
| 05/09/2012 | ජීවී මසුන් | 573,602/- |
| 19/09/2012 | පෞරාණික කාසි | Priceless |
| 21/09/2012 | "කොතල හිඹුටු" | 39,000/- |
| 25/10/2012 | ෆොස්ෆේට් ගල් | 833,048/- |
| 03/11/2012 | ජීවී පොකිරිස්සන් | 394,201.80/- |
| 12/11/2012 | කබල්ලෑ කොරපොතු | 330,000/- |
| 07/12/2012 | ජීවී පොකිරිස්සන් | 417,233/- |
| 12/12/2012 | වැලි සහ මැටි ද්‍රව්‍ය | 162,769/- |

### ★ රාජසන්තක කරන ලද ආනයනික ජීවී පක්ෂීන්

රට තුළට ජීවී පක්ෂීන් තොගයක් රැගෙන ඒමට කරන ලද උත්සාහයක් ව්‍යර්ථ කිරීමට 2012.02.10 දින ජෛ.ස.ජා.ආ. නිලධාරීන්ට හැකි විය.

එම තොගයේ කළු පක්ෂීන් 121 දෙනෙකු හමු විය. අදාළ බලධාරීන්ගේ නිසි අනුමැතිය ලබා ගැනීමෙන් තොරව බැංකොක් හි වීදි වෙළඳපොළෙන් ආනයනය කොට තිබූ මෙම පක්ෂීන් අතර කුරුළු උණ රෝගය සෑදීමේ අවදානම සහිත පක්ෂි විශේෂයක්ද විය. එසේම සැබෑ වටිනාකම රු.

මිලියන 13.6 ක් වූ මෙම පක්ෂි තොගයේ වටිනාකම ලෙස දක්වා තිබුණේ ඇ.ඩො. 1130 (දළ වශයෙන් රු. 120,000/-) ක මුදලකි. මෙය තක්සේරු වංචාවක් සිදු කිරීමකි.

පක්ෂීන් එලෙස ආනයනය කිරීම ශාක හා සත්ව ආරක්ෂණ ආඥා පනත උල්ලංඝනය කිරීමකි. එසේම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිරෝධායන අනුමැතිය ලබා ගෙන තිබුණේ අදාල පක්ෂි තොගයෙන් අඩක් සඳහා පමණි.

රේගුව විසින් සිදු කරන ලද විධිමත් පරීක්ෂණයෙන් අනතුරුව පක්ෂීන් 121 ක් අත් අඩංගුවට ගෙන ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට භාර දුන් අතර අදාළ වරදකරුවන් හට රු. 450,000/- ක දඩයක් පමුණුවන ලදී.

### ★ සඳුන් ජාවාරම්කරුවෙකු කොටුවෙයි.

පකිස්තානු ජාතිකයකු විසින් බුලත් ඇසුරු ගමන් මළු 4 ක සඟවා රටින් පිටමං කිරීමට සූදානම් කර තිබූ 'සඳුන්' කැබලි තොගයක් අත්අඩංගුවට ගැනීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිටවීමේ පර්යන්තයේදී ජෛ.ස.ජා.ආ. නිලධාරීන් හට හැකි විය.

සඳුන් තොගයේ බර කි.ග්‍රෑ. 128.9 ක් වූ අතර එහි වටිනාකම රු. 193,950/- කි. විධිමත් රෙගු පරීක්ෂණයෙන් පසු එම සඳුන් තොගය අත් අඩංගුවට ගත් අතර එය ශාක හා සත්ව ආරක්ෂණ ආඥාපනත උල්ලංඝනය කිරීමක් වන හෙයින් වරදකරුට රු. 100,000/- ක දඩයක් පමුණුවන ලදී.

### ★ ඉන්දියානු කබල්ලෑ ජාවාරම් ප්‍රයත්නයක් ජෛ.ස.ජා.ආ. නිලධාරීන් විසින් අනාවරණය කර ගනී.

දුර්ලභ වර්ගයේ කබල්ලෑ විශේෂයක් වන "ඉන්දියානු කබල්ලෑවා" (*Maniscrasssicaudata*) හම් කි.ග්‍රෑ. 2කට අධික ප්‍රමාණයක් ඉන්දියාවට ගෙන යාමට උත්සාහ කළ ඉන්දියානු ජාතිකයෙකු ජෛ.ස.ජා.ආ. නිලධාරීන් විසින් 2012.11.12 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දී අල්ලා ගනු ලැබීය.

පසුගිය වසර තුල එම ඉන්දියානු ජාතිකයා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සිය වතාවකට අධික වාරයක් ගමන් කොට ඇති බව පරීක්ෂණවලදී අනාවරණය විය.

තර්ජිත සත්ව හා ශාඛ විශේෂයන් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතියට අනුව, 'ඉන්දියානු කබල්ලෑවා' තර්ජිත සත්වයකු වන බැවින් මෙම සතුන් හෝ උන්ගේ ශරීර කොටස් වෙළඳාම තහනම්ය. එම සත්ව විශේෂය අදාල සම්මුතියේ උපග්‍රන්ථ 1 හි දැක්වේ.

අදාල කබල්ලෑ සම් කොටස් අත්අඩංගුවට ගත් අතර එම ප්‍රයත්නය ශාඛ හා සත්ව ආරක්ෂණ ප්‍රඥප්තියේ විධිවිධාන හා රේගු ආඥා පනත සමග කියවිය යුතු වනාන්තර ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනය කරන බැවින් වරදකරුට එරෙහිව රු. 50,000/- ක දඩ මුදලක් පනවන ලදී.

### ★ ජීවී පොකිරිස්සන් 999 දෙනෙකු මුදා හරී

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව හොංකොං බලා නැව්ගත කිරීමට සූදානම් කොට තිබූ ජීවී පොකිරිස්සන් තොගයක් කටුනායක ගුවන් භාණ්ඩ ගම්මානයේදී ජෛ.ස.ජා.ආ. නිලධාරීන් විසින් 2012.02.10 දින සොයා ගන්නා ලදී.

එම තොගය තුළ පැකට් 26ක අසුරා තිබූ කි.ග්‍රෑ. 486 ක බරින් යුත් පොකිරිස්සන් 999 දෙනෙකු සිටි අතර එහි ප්‍රකාශිත වටිනාකම රු. 394,201/- කි.

නැව්ගත කිරීමට සූදානම් කොට තිබූ පොකිරිස්සන් තොගයෙන් තුනෙන් දෙකක පමණ කොටසක සිටි පොකිරිස්සන් අපනයනය සඳහා අවසර ලබා දෙන ප්‍රමාණයට වඩා කුඩා එවුන් බව රේගු පරීක්ෂණයේදී අනාවරණය විය. එසේම අපනයනය සඳහා අවසර ලබා නොදෙන බිත්තර දමන පොකිරිස්සන් ද ඒ අතර විය.

අදාල පොකිරිස්සන් තොගය රේගු ආඥා පනත සමග කියවිය යුතු ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නිකුත් කොට ඇති පොකිරිස්සන් ධීවර කළමනාකරණ රෙගුලාසි උල්ලංඝනය කරන බැවින් එම පොකිරිස්සන් අත්අඩංගුවට ගෙන කොළඹ වරාය අසල මුහුදට මුදාහරින ලදී. තවද අපනයනකරුට එරෙහිව රු. 100,000/- ක දඩයක් නියම කරන ලදී.

★ **ඓතිහාසික වටිනාකමක් සහිත භාණ්ඩ ජාවාරම් ප්‍රයත්නයක් ව්‍යර්ථ කෙරේ.**

පොලොන්නරුව යුගයට හා පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසි පාලන යුගවලට අයත් පෞරාණික කාසි, ආභරණ හා ඓතිහාසික වටිනාකමක් සහිත විවිධ භාණ්ඩ තොගයක් සිය ගමන් බෑග තුළ සඟවා රටින් පිටතට ගෙන යාමට උත්සාහ කළ ශ්‍රී ලාංකිකයන් සය දෙනෙකු අවස්ථා හතරකදී 2012.09.27 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී අත්අඩංගුවට ගත්හ. එහි පුරාවිද්‍යා වටිනාකමක් ඇති කාසි 665ක්, මාල, මුදු , සාරි කටු ආදී ආභරණ අඩංගු විය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන ලද පරිදි පුරාවිද්‍යා වටිනාකමක් සහිත එවන් භාණ්ඩ අදාල බලධාරියා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් / අවසරයක් නොමැතිව රටින් පිටතට ගෙන යාම රේගු ආඥාපනත සමග කියවිය යුතු පුරා විද්‍යාත්මක උපකරණ ආඥාපනතේ විධිවිධාන යටතේ වරදකි. එබැවින් රේගු පරීක්ෂණය අවසානයේදී එම භාණ්ඩ අත්අඩංගුවට ගෙන වරදකරුවන්ට එරෙහිව රු. 10,000/- ක දඩයක් නියම කරන ලදී.

සාරාංශය

| | |
|---|---|
| 2012 වසරේදී ලියාපදිංචි සිද්ධි ගණන | 12 |
| අවසන් කරන ලද සිද්ධි ගණන | 10 |
| අධිකරණයට ඉදිරිපත් කරන ලද වැරදි හා පමුණුවන ලද දඩ සංඛ්‍යාව | 09 |
| එකතු කර ගන්නා ලද මුළු දඩ ප්‍රමාණය | රු. 1,334,189/- |
| අත්අඩංගුවට ගන්නා ලද භාණ්ඩ වල වටිනාකම | රු. 6,357,734/- |
| 2012 වසරේදී අවසන් නොකරන ලද සිද්ධි සංඛ්‍යාව | 02 |

# පාරිභෝගික හා පරිසර ආරක්ෂණ අංශය

රටේ පවතින රෙගුලාසි හා ප්‍රමිති වලට අනුකූල වන පරිදි ආනයනය කරන ලද භාණ්ඩ වල ගුණාත්මකභාවය පාලනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ අරමුණින් 2011 වසරේදී පාරිභෝගික හා පරිසර ආරක්ෂණ අංශය (CPU) ස්ථාපිත කරන ලදී. ආනයනය හා අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් වන බුද්ධිමය දේපල අයිතිය පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීමේ ශ්‍රී ලංකා රේගුවේ මුඛ්‍ය අංශය වන්නේ පාරිභෝගික හා පරිසර ආරක්ෂණ අංශයයි. එසේම ජාත්‍යන්තර සම්මුතීන් හා අනෙකුත් අදාල ආයතන සමග වන සහයෝගිතාවයන් තුලින් මතුවන බැඳීම් ක්‍රියාත්මක කිරීම හරහා පරිසරය ආරක්ෂා කිරීමටද එය සිය දායකත්වය සපයයි.

**ප්‍රධාන කාර්යයන්**

1. බුද්ධිමය දේපල පනත (IPR), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), සුවඳ විලවුන් හා ඖෂධ උපකරණ පනත (CDDA), පාරිභෝගික ආරක්ෂණ අධිකාරි පනත (CAA), සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති රේගු කාර්යයන්ට අදාළ නීතිරීති ක්‍රියාත්මක කිරිම මගින් වංචා හා නීතිරීති කඩකිරීම වැළැක්වීමට කටයුතු කිරිම.
   ඉහත සඳහන් අධිකාරි මගින් ආවරණය වන ආනයනයන් රේගු පරිශ්‍රයෙන් නිදහස් කිරීමට පෙරාතුව ඒවා පාරිභෝගික හා පරිසර ආරක්ෂණ අංශය (CPU) වෙත යොමු කළ යුතු වේ.
2. උක්ත අවශ්‍යතාවය සඳහා එක් එක් භාණ්ඩ තොග හිමිකරු විසින් ඉහත සඳහන් බලධාරින්ට අදාලව ඉදිරිපත් කරන ලද ඇපකර ලේඛනයක් පවත්වා ගෙන යාම.
3. අදාල ආයතනයන්හි රෙගුලාසි වලට අනුකූල වන ලෙස රේගු ක්‍රියාවලීන් යථාවත් කිරීම.
4. අවශ්‍යතාවය පරිදි පාරිභෝගික හා පරිසර ආරක්ෂණ අංශයේ නිලධාරීන්ගේ පරීක්ෂණ ස්ථානවල සේවයේ යෙදවීම.
5. මේ වන තෙක් හඳුනාගෙන ඇති ආඥාපනත් හා පනත් වල ඇති රේගු සම්බන්ධ නීති යටතේ සාදන ලද රෙගුලාසි සමාලෝචනය කිරීම.
6. ඉහත ක්‍රියාකාරකම් වලට අදාලව රේගු ආඥාපනත සමග කියවිය යුතු අනෙකුත් අදාල පනත් හා ආඥා පනත්වල ඇති නීතිය ක්‍රියාත්මක කිරීම.

## කාර්යසාධනය

ජා.ජ.ස. හා ජ.ම. (මහනුවර) සමග එක්ව රේගු නිලධාරීන් සඳහා "ගුණාත්මක ජල පිරිපහදුව" තේමා කොට ගත් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

### 2012 වසරේදී හසුරුවන ලද සිද්ධි

| මාසය | විස්තරය | ප්‍රතිඵලය |
|---|---|---|
| පෙබරවාරි | ග්‍රීන් ටී : කි.ග්‍රෑ. 3540 | දඩ මුදල් ප්‍රමාණය රු.450,000 |
| ජුලි | ගැල්වනයිස් කරන ලද වානේ පයිප්ප 1349 | දඩ මුදල් ප්‍රමාණය රු.400,000 |
| ජුලි | සෙරමික් ටයිල් : කාටන් 22400 | දඩ මුදල් ප්‍රමාණය රු.350,000 |
| මැයි | ටින් මාළු : කාටුන් 800 | ප්‍රති අපනයනය කරන ලද |
| මැයි | ටින් මාළු : කාටුන් 800 | ප්‍රති අපනයනය කරන ලද |
| නොවැම්බර් | ටින් මාළු : කාටුන් 3600 | දඩ මුදල් ප්‍රමාණය රු.900,000 |
| නොවැම්බර් | වැකියුම් ෆ්ලාස්ක් සහ දත් බෙහෙත් | දඩ මුදල් ප්‍රමාණය රු.750,000 |
| නොවැම්බර් | ටින් මාළු : කාටුන් 920 | ප්‍රති අපනයනය කරන ලද |
| ඔක්තෝබර් | ටින් මාළු : කාටුන් 920 | ප්‍රති අපනයනය කරන ලද |
| ඔක්තෝබර් | ටින් මාළු : කාටුන් 920 | ප්‍රති අපනයනය කරන ලද |
| ඔක්තෝබර් | සෙරමික් ටයිල් - පැලට් 11 | ප්‍රති අපනයනය කරන ලද |

## 2012 වසරේ කාර්යසාධන සාරාංශය

| | |
|---|---|
| ලියාපදිංචි සිද්ධි ගණන | **222** |
| අධිකරණය වෙත ගෙන යන ලද හා දඩ මුදල් පමුණුවන ලද සිද්ධි සංඛ්‍යාව | 105 |
| අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 140 |
| එකතුකර ගන්නා ලද මුළු දඩ මුදල් ප්‍රමාණය | රු: 9,293,000 |
| **IPR** සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛ්‍යාව | 4 |
| හසුරුවන ලද මුළු **SLSI** සටහන් කර සංඛ්‍යාව | 3206 |

# පශ්චාත් නිෂ්කාශන හා විගණන අංශය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව රේගුවේ නව සංවිධාන ව්‍යුහය තුළ පශ්චාත් නිෂ්කාශන හා විගණන කාර්යාංශය නිති බලාත්මක කිරීමේ අංශය යටතේ ක්‍රියාත්මක වේ. පශ්චාත් නිෂ්කාශන විගණන කාර්යයට අතිරේකව, නැවත මුදල් ගෙවීමේ කාර්යයද මෙම කාර්යාංශය යටතට ගැනේ.

අපනයනකරුවන් විසින් අපනයනය කරන ලද භාණ්ඩ තොග රේගු පරිශ්‍රයෙන් නිෂ්කාශනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට පෙරාතුව එම භාණ්ඩ සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් ලබා දී තිබුණු ස්වේච්ඡා ස්වයං ප්‍රකාශ සියළු අන්දමින් නිවැරදි බවට (තත්‍ය තොගය හා ප්‍රකාශය සසඳා බැලීමෙන්) රේගුව විසින් තහවුරු කර ගැනීම රේගු ආඥා පනතේ විධිවිධාන අපේක්ෂා කරයි. පශ්චාත් නිෂ්කාශන විගණන සංකල්පයට අනුව සත්‍යාක්ෂණ කාර්යය සිදුවන්නේ භාණ්ඩ සැබැලෙස නිෂ්කාශනය කිරීමෙන් අනතුරුවයි. පශ්චාත් නිෂ්කාශන විගණන සාධකය හේතුවෙන් රේගු පරිපාලනයට අව්‍යාජ භාණ්ඩ තොග නිෂ්කාශනය පහසු කරවයි. එබැවින් එය "අවදානම් කළමනාකරණයේදී" අත්‍යවශ්‍ය වන්නා වූ මෙවලමකි.

පශ්චාත් නිෂ්කාශන විගණන අත්‍යවශ්‍යයෙන්ම විගණනය පදනම් කොටගත් රේගු පාලන ක්‍රමයකි. තත්‍ය භාණ්ඩ තොගය පරික්ෂා කිරීම වෙනුවට පශ්චාත් නිෂ්කාශන හා විගණන කාර්යාංශය හරහා ජාත්‍යන්තර වෙළඳාමේ ඍජුව හෝ වක්‍රව නියැලී සිටින පුද්ගලයින් සතු තොරතුරු / අදාල ලේඛන ඇති තොරතුරු, ලිපි ගොනු, ව්‍යාපාරික පද්ධති, ඉලෙක්ට්‍රොනික් දත්තක පද්ධති හා වෙනත් වාණිජ තොරතුරු පරීක්ෂා කිරීමෙන් ආනයනකරුවන් විසින් ලබා දී ඇති ප්‍රකාශ වල නිරවද්‍යතාවය හා නිත්‍යානුකූලභාවය පිළිබඳව රේගුවට සෑහීමකට පත් විය හැකිය.

## මූලික ඉලක්කයන්

1. රේගු ප්‍රකාශනයන්හි නිරවද්‍යතාවය හා නිත්‍යානුකූලභාවය තහවුරු කිරීම
2. නියමිත ආදායම ලැබෙන බවට සහතික වීම
3. පශ්චාත් නිෂ්කාශන හා විගණන අංශය හරහා වංචා හඳුනාගැනීම තුළින් වෙළඳ වංචා දිගින් දිගට සිදුවීම වැළැක්වීම හා ඊට එරෙහිව දණ්ඩන හා නිවැරදි කිරීම් ක්‍රමවේදයන් අනුගමනය කිරීම
4. රේගු නීතිය හා ඒ යටතේ සකසා ඇති රෙගුලාසි හා වෙනත් අදාල / සම්බන්ධ නිති හා රෙගුලාසි සමග පූර්ණ වශයෙන් අනුගත වීම
5. රේගු භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය තුළ සිදුවන ආදායම් හඳුනාගනිමින් ඒවා අවම කිරීම හා පද්ධතිය තුලින් එවන් අවදානම් තුරන් කිරීම හෝ ඊට අවශ්‍ය ප්‍රතික්‍රියා මාර්ග ගැනීම පිළිබඳ කළමනාකාරිත්වයට නිර්දේශ ඉදිරිපත් කිරීම
6. අදාල අවදානම් ක්ෂේත්‍ර යථාවත් කරමින් අවදානම් කළමනාකරණ පද්ධතිය ඉතා ඉහළ ඵලදායිතාවයකින් යුතුව පවත්වා ගෙන යාම

**ප්‍රධාන කාර්යයන්**


1. සියළු රේගු ප්‍රකාශනවල 'බලපත්‍ර පිටපත්' ක්‍රමානුකූල ලෙස එකතු කිරීම, ගබඩා කිරීම හා ආරක්ෂා කිරීම
2. බලපත්‍ර පිටපත් හා ඊට සම්බන්ධ ලේඛන පිරික්සීම හා එම ලේඛනවල ඇතුලත් තොරතුරු / දත්ත විශ්ලේෂණය කිරීම
3. සුදුසු විගණනයට භාජනය වන්නන් තේරීම
4. විගණන පැවැත්වීම
5. වංචා හෝ අව බදු අයකිරීම් හඳුනාගැනීම හා ඒ සඳහා යෝග්‍ය පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම
6. ඉදිරි වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා අවශ්‍ය විගණන ක්‍රියාවලි විමර්ශනය කිරීම
7. AsyCuDa (World) පද්ධතිය තුළින් ඉදිරිපත් කෙරෙන විද්‍යුත් භාණ්ඩ ලේඛන අධීක්ෂණය කිරීම
8. නියමිත නැවත ගෙවීම් වේගවත්ව ප්‍රදානය කිරීම, දෙපාර්තමේන්තුමය නැවත ගෙවීම් ක්‍රියාවලිය නියාමනය හා අධීක්ෂණය කිරීම

## පශ්චාත් නිෂ්කාශන විගණන අංශය

**2012 වසර තුළ කාර්යසාධනය (2011 වසර හා සසඳමින්)**

| | 2011 | 2012 |
|---|---|---|
| වසර තුළ ලියාපදිංචි විගණන සංඛ්‍යාව | 44 | 47 |
| අවසන් කරන ලද විගණන විමසුම් සංඛ්‍යාව (පූර්වයෙහි ලියාපදිංචි ඒවාද ඇතුළුව) | 69 | 24 |
| විගණන හා පමුණුවන ලද දඩ හරහා ස්ථාපිත වැරදි සංඛ්‍යාව | 33 | 24 |
| අය කර ගන්නා ලද මුළු දඩ මුදල් ප්‍රමාණය | රු. 42,439,788 | රු. 165,713,513 |
| රාජසන්තක කරන ලද භාණ්ඩ වල මුළු වටිනාකම | නැත | රු. 278,159,754 |
| අතිරේක ආදායම ලෙස එකතු කරන ගන්නා ලද මුළු මුදල් ප්‍රමාණය | රු. 153,764,042 | රු. 41,223,576 |

**කාර්යසාධනය සැසඳීම - 2011 සහ 2012**



# නැවත මුදල් ගෙවීමේ අංශය


## නැවත මුදල් ගෙවීමේ ඉල්ලීම් තත්ත්වය

පසුගිය වර්ෂ සමග සැසඳීම (2010 සිට 2011)

| වසර | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| ලියාපදිංචි අයදුම්පත් / ඉල්ලීම් | 149 | 76 | 186 |
| අවසන් කරන ලද නැවත ගෙවීම් | 17 | 51 | 98 |
| ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් / ඉල්ලීම් | 03 | 01 | 02 |

## නැවත මුදල් ගෙවීමේ ඉල්ලීම් තත්ත්වය

පසුගිය වර්ෂය සමග සැසඳීම (2010 සිට 2011)



**නැවත ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, මාසික පදනමින් හා බදු වර්ග පදනමින් (2012 වසර)**

| Tax Component | Jan | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **CID** | 143,636 | 31,400 | 100,478 | 7,228,141 | 6,744,498 | 46,864 | 2,498,864 | 3,948,042 | 732,480 | 3,742,687 | 3,310,555 | 28,527,645 |
| **SURCHARGE** | | | | | | | | | | | | 0 |
| **SRL** | | | 1,507 | 335 | 6,089 | | | | 7,947 | | | 15,878 |
| **PAL** | | | 29,124 | 8,526 | 67,446 | | 189,615 | 169,057 | 409,460 | 548,424 | 10,923,222 | 12,344,874 |
| **VAT** | | | | | | | | | | | | 0 |
| **NBT** | | | 26,125 | 44,897 | 316,151 | 74,412 | 1,103,424 | 259,693 | 495,473 | 243,695 | 5,041,490 | 7,605,361 |
| **EIC** | 21,773 | | 64,073 | 741,854 | 2,286,086 | 3,673,800 | 120,000 | 5,072,724 | 2,097,983 | 1,343,680 | 347,100 | 15,769,073 |
| **XID** | | | 54,684 | 14,087 | 405,849 | | | 355,618 | | 96,290 | | 926,528 |
| **RDL** | | | | | 191,490 | | | | | | | 191,490 |
| **SCL** | | | | | | | 2,580,000 | 11,279,000 | 2,250,000 | | | 16,109,000 |
| **XDM** | | | | | | | | | 4,069,209 | | | 4,069,209 |
| **XDL** | | | | | | | 2,908,935 | | | | | 2,908,935 |
| **XDO** | | | | | | | | | | | 443,398 | 443,398 |
| **Export CESS** | | | | | | | | | | 319,000 | | 319,000 |

| බදු සංඝටකය | **2009** | **2010** | **2011** | **2012** |
|---|---|---|---|---|
| රේගු තීරු බද්ද | 3,685,603 | 4,966,962 | 51,094,310 | 28,527,645 |
| අධිභාරය | 440,450 | 745,043 | 7,476,196 | 0.00 |
| ස.ම.බ. | | 86,010 | 882,098 | 15,878 |
| ගුවන් තොටුපල බද්ද | | 219,487 | 2,862,906 | 12,344,874 |
| වැට් බද්ද | 932,328 | 3,444,068 | 23,932,731 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | | | 442,608 | 7,605,361 |
| **EIC** | | 16,579,929 | 10,444,200 | 15,769,073 |
| **XID** (නිෂ්පාදන බද්ද) | 1,090,272 | 88,843 | 412,490 | 926,528 |
| ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද | | 13,919 | 191,490 | 191,490 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | | | | 16,109,000 |
| නිෂ්පාදන බදු (රථවාහන) | | | | 4,069,209 |
| නිෂ්පාදන බදු (මත්පැන්) | | | | 2,908,935 |
| නිෂ්පාදන බදු (අනෙකුත්) | | | | 443,398 |
| අපනයන සෙස් බද්ද **CESS** | | | | 319,000 |
| එකතුව | **6,148,653** | **26,144,261** | **97,739,029** | **89,230,391** |

# මධ්‍යම විමර්ෂණ අංශය

**හැඳින්වීම**

මධ්‍යම විමර්ෂණ කාර්යාංශය ස්ථාපිත කිරීමට පෙර, සියළු කාර්යාංශ හා ඒකක පාහේ (ඒවායේ කාර්යභාරය නීතිය ක්‍රියාත්මක කිරීමද යන්න පිළිබඳ විශේෂයකින් තොරව) විමර්ෂණ කටයුතුවල නියැලුණු අතර ඒ හේතුවෙන් එම විමර්ෂණයන්හි ප්‍රගතිය පිරික්සා බැලීමට ඉහළ කළමනාකාරිත්වයට නොහැකි විය. එසේම විමර්ෂණයන්හිදී එම ඒකක විසින් තම තමන්ට ආවේනික වූ සම්මතයන් යොදාගැනීම හේතුවෙන් විමර්ෂණ ක්‍රියාවලිය සමරූපීතාවයෙන් හා පාරදෘෂ්‍යභාවයෙන් තොර වූ අතර ඇතැම් අවස්ථාවලදී බලය අයථා පරිදි භාවිතා කිරීම්ද නිරීක්ෂණය කොට තිබුණි. මෙම සෘණාත්මක බලපෑම් වලක්වාලීම හා විමර්ෂණයන් ප්‍රමාණාත්මක හා ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම අරමුණු කරගනිමින් පරිපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළදී මධ්‍යම විමර්ෂණ කාර්යාංශය ස්ථාපිත කරනු ලැබීය.

එබැවින්, කාර්යාංශය විසින්ම හා වෙනත් මෙහෙයුම් කාර්යාංශ විසින් අනාවරණය කරගනු ලබන බව රේගු නීතිය හා ඒ ආශ්‍රිත වෙනත් නීති උල්ලංඝනය වීම් විමර්ශනය කිරීම මධ්‍යම විමර්ශන කාර්යාංශයේ වගකීම වේ. මෙහෙයුම් කාර්යාංශ විසින් අනාවරණය කරගනු ලබන උල්ලංඝනයන් පමණක් මෙම කාර්යාංශය විසින් භාර ගනු ලබන හෙයින් නිවාරණ අංශය හා විශේෂ කාර්ය හා ආවේක්ෂණ (ST&V) අංශය විසින් සිදු කරනු ලබන අනාවරණයන් මෙහි විෂයපථය යටතට නොගැනේ.

මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම මෙහි තවත් වගකීමකි.
කාර්යාංශයේ ප්‍රධාන ඉලක්ක වනුයේ,

- සියළු රේගු විමර්ෂණයන් මධ්‍යගත කිරීම හා ඒවා සමරූපී හා වෘත්තිමය ආකාරයෙන් සිදුවීම
- සිද්ධිවල ප්‍රගතිය ඵලදායී ලෙස අධීක්ෂණය කිරිම සඳහා මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වා ගෙන යාම හා
- ත්‍යාග මුදල් බෙදා හැරිම මධ්‍යගත කිරීම හා සමරූපී සාධාරණ හා පාරදෘශ්‍ය ආකාරයෙන් ඒවා බෙදා හැරීම වේ.

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු නීතිය උල්ලංඝනය වීම් අනාවරණය කරගැනීම හා ඒවා විමර්ෂනය කිරීම
2. අනෙකුත් කාර්යාංශ (විශේෂ කාර්ය හා ආවේක්ෂණ) (ST&V) හා නිවාරණ අංශය හැර) විසින් අනාවරණය කර ගනු ලබන සිද්ධීන් විමර්ෂණය කිරීම
3. නිවාරණ කාර්යාංශය හා විශේෂ කාර්ය හා ආවේක්ෂණ කාර්යාංශය විසින් සිදු කරනු ලබන විමර්ෂණයන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීම
4. මධ්‍යම සිද්ධි ලේඛනය (CCR) පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම
5. දෙපාර්තමේන්තුව විසින් අවසන් කරන ලද සියළු සිද්ධි සම්බන්ධයෙන් ත්‍යාග මුදල් බෙදා හැරීම

**කාර්යසාධනය සැසඳීම -**

| වර්ෂය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| **CIB** විසින් අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව | 23 | 48 | 62 |
| **CIB** විසින් අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 05 | 21 | 64 |
| **"NFA"** ලෙස අවසන් කරන ලද සිද්ධි | 02 | 08 | 03 |
| අය කර ගත් දඩ මුදල් (රු.) | 9,315,692/- | 66,388,000/- | 32,880,000/- |
| වෙනත් රාජසන්තක කිරීම් (රු.) | | 8,364,450/- | 221,361,350/- |
| වෙළඳාමෙන් ලත් මුදල් (රු.) | | 6,130,000/- | 289,728,263/- |
| එකතුව (රු.) | 9,315,692/- | 80,882,450/- | 543,969,613/- |
| ම.සි.ලේ. ලියාපදිංචි මුළු සිද්ධි සංඛ්‍යාව | 6096 | 4210 | 5828 |
| ම.සි.ලේ. තුළ යාවත්කාලීන කරන ලද සිද්ධි සංඛ්‍යාව | 4490 | 2536 | 4434 |
| නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලේඛන සංඛ්‍යාව | 168 | 154 | 179 |

## 2012 CIB කාර්යමණ්ඩලයේ සුවිශේෂී කාර්යසාධනය

අ. **Ref: CIB/INV/34/2011:**
ආයෝජන මණ්ඩල පහසුකම් අයුතු ලෙස භාවිතා කරමින් ආනයනය කරන ලද නීතිවිරෝධී ගෙතූ රෙදි බැහැර කිරීම අනාවරණය කර ගැනීම. අඩු කරන ලද රාජසන්තක කිරීම් ලෙස රු. 27,300,000/- ක මුදලක් හා වෙළඳාමෙන් ලත් මුදල් ලෙස රු. 1,550,000/- ක මුදලක් අය කර ගැනිණ.

ආ. **Ref: CIB/INV/16/2012:**
රථවාහන බලපත්‍ර උල්ලංඝනය කරමින් ආනයනය කරන ලද මෝටර් රථ ඒකක 42 ක් අල්ලා ගන්නා ලදී. අඩු කරන ලද රාජසන්තක කිරීම් ලෙස රු. 38,200,000/- ක මුදලක් අය කර ගැණින.

ඇ. **Ref: CIB/INV/36/2011:**
ආයෝජන මණ්ඩල පහසුකම් අයුතු ලෙස භාවිතා කරමින් ආනයනය කරන ලද නීති විරෝධී ගෙතූ රෙදි බැහැර කිරීම අනාවරණය කර ගැනීම අඩු කරන ලද රාජසන්තක කිරීම් ලෙස රු. 7,250,000/- ක මුදලක් අය කර ගැණින.

ඇ. **Ref: CIB/INV/045/2012:**

සාවද්‍ය ලේඛන ඉදිරිපත් කරමින් විනිමය පාලන රෙගුලාසි වලට පටහැනි ලෙස ආනයනය කරන ලද සීනි මෙට්‍රික් ටොන් 2155 (160 x 20 බහාලුම් තුළ) ක් සොයා ගැණින. අඩු කරන ලද රාජසන්තක කිරීම් ලෙස රු. 25,100,000/- ක මුදලකුත් විකිණීමෙන් ලද මුදල ලෙස රු. 230,768,300/- ක මුදලකුත් අය කර ගැණින.

**පොදුවේ වෙනත් අදහස්:**

කාර්යාංශය දැඩි කාර්යමණ්ඩල ඌනතාවයකින් පෙළේ. විශේෂයෙන් ගත් කළ නියෝජ්‍ය අධිකාරිවරුන් 18 දෙනෙක් සහකාර අධිකාරිවරුන් 44 දෙනෙකු හා ආරක්ෂක නිලධාරීන් 20 දෙනෙකුගේ හිඟය කාර්යාංශයෙන් සුමට ක්‍රියාකාරිත්වයට බාධාවකි.

නැව් බඩු ලේඛන, මෝටර් වාහන නිෂ්කාශන ක්‍රියාවලිය හා භාණ්ඩ පාලන ප්‍රදේශය අධීක්ෂණය කිරීම සඳහා AsyCuDa ජාලය සමග තවත් ඔන්ලයින් සජීවී සම්බන්ධතා පැවතීම කාර්යාංශයට අවශ්‍ය වේ.

අවශ්‍ය දෘඪකාංග නොමැති වීම හේතුවෙන් CCR ස්වයංක්‍රීය කිරීමට දැනට කාර්යාංශයට හැකියාවක් නොමැත.

කාර්යාංශයට අනුයුක්තව සේවය කරන කාර්ය මණ්ඩලයට වැඩිදුර පුහුණු අවස්ථා නිර්මාණය කිරීමට යෝජනා කෙරේ.

# නීති කටයුතු අංශය

හැඳින්වීම

කාර්යාංශයේ නාමයෙන්ම පිලිබිඹු වන පරිදි, "නීති කටයුතු අංශයේ කාර්යභාරය වනුයේ ඉහළ කළමනාකාරිත්වයට හා අනෙකුත් කාර්යාංශවලට අවශ්‍ය නිති උපදෙස් ලබා දීම දෙපාර්තමේන්තුව විසින් හෝ පිටස්තර පාර්ශ්වයන් විසින් දෙපාර්තමේන්තුවට එරෙහිව පවරන ලද නඩු කටයුතුවලදී රේගු දෙපාර්තමේන්තුවේ හා පොදුවේ රජයේ බැඳියාවන් ආරක්ෂා කිරීමට ස්වකීය විශේෂඥතාවය සපයා දීම හා නීතිය බලාත්මක කිරීමේ අංශවල නඩු පැවරීම් වල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමයි.

එසේම රේගු ආඥාපනත හා ඒ යටතේ සාදා පනවා රෙගුලාසි සමාලෝචනයට ලක් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමට එහි තවත් වගකීමකි.

**ප්‍රධාන කාර්යයන්**

1. ඉහළ කළමනාකාරිත්වයට හා අනෙකුත් කාර්යාංශවලට අවශ්‍ය නිති උපදෙස් ලබා දීම
2. දෙපාර්තමේන්තුව වෙනුවෙන් නීතිපති උපදෙස් ලබා ගැනීම
3. අධිකරණයේ පවතින නඩු කටයුතු වලදී රේගු දෙපාර්තමේන්තුවේ හා රජයේ බැඳියාවන් වෙනුවෙන් පෙනී සිටීම
4. රේගු නීතිය අඛණ්ඩව සමාලෝචනයට ලක් කිරීම

## ලියාපදිංචි කළ නඩු සංඛ්‍යාව

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් අධිකරණයේ පැවති නඩු | - | - | - | - | - | - | - | 01 | **03** |
| මහාධිකරණයේ පැවති නඩු | - | 01 | - | - | - | - | - | 01 | **06** |
| අභියාචනාධිකරණයේ ඉල්ලුම්පත්‍ර | 51 | 89 | 107 | 36 | 43 | 18 | 18 | 20 | **51** |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉල්ලුම්පත්‍ර | 08 | 11 | 06 | 16 | 14 | 10 | 15 | 08 | **09** |
| මහාධිකරණයේ ඉල්ලුම්පත්‍ර | - | - | 02 | 02 | - | - | - | - | **-** |
| එකතුව | 59 | 101 | 115 | 54 | 57 | 28 | 33 | 30 | 69 |

## අවසන් කරන ලද නඩු ගණන

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් අධිකරණයේ නඩු ගණන | - | - | - | - | - | - | - | - | **-** |
| මහාධිකරණයේ නඩු ගණන | - | 01 | - | - | - | - | - | 01 | **-** |
| අභියාචනාධිකරණයේ ඉල්ලුම්පත්‍ර | 03 | 07 | 06 | 102 | 18 | 03 | 28 | 21 | **6** |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉල්ලුම්පත්‍ර | 04 | 04 | - | 07 | 02 | 02 | 11 | 10 | **3** |
| මහාධිකරණයේ ඉල්ලුම්පත්‍ර | - | - | - | - | - | - | - | - | **-** |
| එකතුව | 07 | 11 | 06 | 109 | 20 | 05 | 39 | 31 | 9 |

# මධ්‍යම බුද්ධි තොරතුරු අංශය

**හැඳින්වීම**

ආදායම හෝ 'සමාජ ආරක්ෂණ' බැදීම් කැපකිරීමෙන් තොරව නිත්‍යානුකූල වෙළඳාම පහසු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් අංශ වලට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවශ්‍ය ඵලදායී, කාලීන, නිරවද්‍ය හා අදාල බුද්ධි තොරතුරු සපයා දීම මධ්‍යම බුද්ධි තොරතුරු කාර්යාංශයේ වගකීම වේ.

පොදුවේ ගත් කල එහි ඉලක්කයන් පහත පරිදි වේ:

- අවශ්‍ය බුද්ධි තොරතුරු ලබාදීම මගින් ඉහළම තලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම
- භාණ්ඩ හා පුද්ගල නිෂ්කාශනයේදී බුද්ධි තොරතුරු කේන්ද්‍ර කොටගත් පාලන පද්ධතින් මෙහෙයවීම අවධාරණය කිරීම
- දේශසීමා අතර භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව තහවුරු කිරීම
- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමේ මුඛ්‍ය ස්ථානය හා ජාතික සම්බන්ධක ස්ථානය (ජා.ස.ස්.) ලෙස කටයුතු කිරීම හා නීතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහාය ලබා දීම

**ප්‍රධාන කාර්යයන්**

1. තොරතුරු එක්රැස් කිරීම
2. පැය 24 පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය *(PIRD).*
3. දත්ත පද්ධති පවත්වාගෙන යාම හා භාවිතයට ගැනීම
4. බුද්ධි තොරතුරු සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම
5. දේශීය වශයෙන් කාර්යාංශය අතරත් අභ්‍යන්තර වශයෙන් අනුමත නියම කරන ලද ආයතන සමග බුද්ධි තොරතුරු බෙදා හැරීම
6. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සමග සම්බන්ධීකරණය කිරීම
7. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ කලාපීය ජාතික සම්බන්ධක ස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ මුඛ්‍ය ස්ථානය ලෙස කටයුතු කිරීම
8. ජාතික ආරක්ෂාව සම්බන්ධ කටයුතුවලදී සම්බන්ධීකරණ ඒකකය ලෙස කටයුතු කිරීම
9. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක මුලපිරීම (Container Security Initiative) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
10. ආරක්ෂක අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් තෝරාගනු ලැබූ භාණ්ඩ තොග පරීක්ෂා කිරීම සම්බන්ධීකරණය
11. දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගී වීම
12. භාණ්ඩ තොග ලැයිස්තු සමාලෝචනය කරමින්, බුද්ධි තොරතුරු පාදක අධි අවදානම් භාණ්ඩ තොග අල්ලා ගැනීම හා විමර්ෂණ සිදු කිරීම
13. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
14. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම (POD)
15. CEN දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
16. ලියාපදිංචියට පෙර භාණ්ඩ තොග ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කිරීම (2012 සිට)
17. CHA දත්ත පද්ධතිය පවත්වාගෙන යාමට හා CHA අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම සඳහා නිෂ්කාශන ඒජන්තවරුන්ගේ තොරතුරු ඒකරාශී කිරීම.

**2012 කාර්ය සාධනය**

**ලබා ගත් හා බෙදා දුන් තොරතුරු - පසුගිය වර්ෂ සමග සැසඳීමක්**

| විස්තරය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| PIRD හරහා ලබා ගත් තොරතුරු සංඛ්‍යාව | 44 | 60 | 60 |
| වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස්, ලිපි, ප්‍රවෘත්ති) | 25 | 44 | 04 |
| එකතුව | 69 | 104 | 64 |
| අනෙකුත් අංශ සමග බෙදා හදා ගත් තොරතුරු සංඛ්‍යාව | 12 | | |
| අවශ්‍ය පියවර ගැනීම සඳහා වෙනත් අංශ වෙත බෙදා හරින ලද තොරතුරු සංඛ්‍යාව | 12 | 27 | 26 |
| කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලද ක්‍රමෝපායික තක්සේරු සංඛ්‍යාව | - | - | - |

**බෙදා හරින ලද බුද්ධි තොරතුරු**

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| CIU විපරම් | 08 | 06 | 11 |
| RILO, WCO, CEN විපරම් | 03 | 01 | 01 |

බෙදා හරින ලද මාසික “බුද්ධි තොරතුරු විශ්ලේෂණ වාර්තා

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| CIU බුද්ධි විශ්ලේෂණ වාර්තාව | - | - | - |
| RILO මාසික එකතුව | 08 | 03 | - |
| විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව | 2513 | 1730 | 2091 |

බුද්ධි තොරතුරු කාර්යාංශය විසින් සම්බන්ධිකරණය කරන ලද ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන ලද භාණ්ඩ සොයා ගැනීම්

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| ජාතික ආරක්ෂක අවශ්‍යතාවයන් වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන ලද සොයාගැනීම් සංඛ්‍යාව (රේගු බුද්ධි තොරතුරු කාර්යාංශය විසින් සම්බන්ධිකරණය කරන ලද විමර්ෂණ) | 414 | 407 | 392 |
| නාවික හමුදා සොයාගැනීම් හරහා හමුව, සිද්ධි සංඛ්‍යාව | - | - | - |

**CHA සහ VAT ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව (26.04.2012 සිට)**

| | 2012 |
|---|---|
| රේගු නිවාස නියෝජිත බලපත්‍ර අළුත් කිරීම් | 2700 |
| ශ්‍රී.ලං.ව.අ. වාප්පු බලපත්‍ර (A සාමාර්ථය) (ආසන්න වශයෙන්) | 1500 |
| VAT ලියාපදිංචි කිරීම, ආනයනකරුවන්ගේ ලේඛන පරීක්ෂාව | 1108 |

## දේශීය සහ විදේශීය විමර්ෂණ හා බුද්ධි තොරතුරු නියෝජිතායතන සමග සම්බන්ධීකරණය

| නියෝජිතායතනය | ඉල්ලීම් සංඛ්‍යාව | | | ලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | | නොලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **2010** | **2011** | **2012** | **2010** | **2011** | **2012** | **2010** | **2011** | **2012** |
| RILO- චීනය | 05 | | | | | | 05 | | |
| DRI- ඉන්දියාව | 09 | 21 | 16 | 09 | 12 | 07 | | 09 | 09 |
| ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 18 | 14 | 10 | 18 | 14 | 07 | | | 03 |
| එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | | 03 | 02 | | 02 | 01 | | 01 | 01 |
| HM Customs UK | 02 | 01 | | 02 | | | | 01 | |
| ඕස්ට්‍රේලියා | 01 | 01 | 03 | 01 | 01 | | | | 03 |
| සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 05 | 01 | 01 | 05 | 01 | | | | 01 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | | 01 | | | 01 | | | | |
| ජපාන රේගු දෙපාර්තමේන්තුව | 01 | | 01 | 01 | | 01 | | | |
| නවසීලන්ත අභ්‍යන්තර ඒජන්ත කාර්යාලය | 01 | | | 01 | | | | | |
| පාකිස්තාන රේගුව | 01 | 03 | | 01 | 03 | | | | - |
| ඉන්දුනිසියානු රේගුව | | | | | | | | | |
| මාලදිවයින් රේගුව | | 01 | 01 | | | 01 | | 01 | |
| තායිලන්ත රේගුව | 02 | 01 | 02 | 02 | | 02 | | 01 | |
| නේපාල රේගුව | 01 | | | 01 | | | | | |
| ඉරාන රේගුව | 01 | | | | | | 01 | | |
| මලයාසියා රේගුව | 01 | | | | | | 01 | | |
| වියට්නාම් රේගුව | 01 | 01 | | 01 | | | 01 | 01 | |
| ICE ATTACHE නව දිල්ලියෙහි ඇමෙරිකානු තානාපති කාර්යාලය | 01 | 01 | | | | | 01 | 01 | |
| තායිලන්ත තානාපති කාර්යාලය | 01 | | | 01 | | | | | |
| ජපාන තානාපති කාර්යාලය | | | | | | | | | |

## පොදු වර්ධනයන්

**<u>අ. CSI වැඩසටහනේ ප්‍රගතිය</u>**

අ. පරීක්ෂා කරන ලද සංක්‍රාන්ති / ප්‍රතිනැව්ගත කිරීම් සංඛ්‍යාව - 185
ආ. පරීක්ෂා කරන ලද දේශීය බහලුම් සංඛ්‍යාව - නැත
ඇ. භෞතික වශයෙන් පරීක්ෂා කරන ලද බහලුම් සංඛ්‍යාව - නැත
ඈ. විෂමතා සහිත බහාලුම් සංඛ්‍යාව - නැත

**<u>ආ. නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය</u>**

a. ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව - 45
b. අවසන් කරන ලද නඩු සංඛ්‍යාව - 33
c. දඩ ලෙස උපායගත් මුදල් ප්‍රමාණය - රු. 2,218,473/-
d. වෙළඳ කටයුතු වලින් උපයාගත් මුදල් ප්‍රමාණය - රු. 13,067,084/-
e. A/E ලෙස අය කර ගත් මුදල් ප්‍රමාණය - රු. 4,788,134/-
f. රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම - රු. 41,419,055/-

**සුවිශේෂී කාර්යසාධනය**

**A <u>බුද්ධි තොරතුරු භාවිතයෙන් මධ්‍යම බුද්ධි අංශයේ කාර්ය මණ්ඩලය විසින් සොයා ගනු ලැබූ විශේෂිත සිද්ධි</u>**

I. සාවද්‍ය අපනයන රේගු ලේඛනයක් ඉදිරිපත් කරමින් ස්වාභාවික රබර් ෂීට්12,000 ක් ලෙස හඟවමින් අපනයනය කිරීමට සූදානම් කළ අබලි ඇලුමිනියම් කි.ග්‍රෑ. 10,490 ක් සොයා ගැනීම. විමර්ශනයන් ක්‍රියාත්මකයි.

II. ඩයි යොදා කපු රෙදි ලෙස නිත්‍යානුකූල ලෙස නැවත අපනයනය සඳහා සූදානම් කොට තිබූ අබලි යකඩ කි.ග්‍රෑ. 47,000 ක් සොයා ගැනීම. (විමර්ෂණයන් ක්‍රියාත්මකයි)

B <u>PIRD හරහා ලැබුණු තොරතුරු හා ම මධ්මධ්‍යම බුද්ධි අංශයේ හි බුද්ධි තොරතුරු එක්රැස් කිරීම හරහා අනාවරණය කර ගනු ලැබූ වැදගත් සිද්ධි</u>

RILO, හරහා ලැබුණු තොරතුරු මත පදනම්ව කෙන්යාවේ සිට කොළඹ හරහා ඩුබායි වෙත ප්‍රතිඅපනයනය කිරීමට සූදානම් කොට තිබූ අබලි ප්ලාස්ටික් ලෙස ප්‍රකාශ කොට තිබූ ප්‍රතිනැව්ගත කිරීමේ බහාලුමක් අත්අඩංගුවට ගන්නා ලදී. එම බහාලුමේ තිබී ඇ.ඩො. 2,752,020/- ක වටිනාකමකින් යුත් ඇත් දළ 359 ක් පරික්ෂණයේදී සොයා ගැනිණ. අලියා, තර්ජනයට ලක්ව ඇති සත්ව විශේෂයක් ලෙස තර්ජිත සතුන් ජාත්‍යන්තර වෙළදාම පිළිබඳ සම්මුතියේ 1 වන උපලේඛනයේ ඇතුලත් සත්වයෙක් වන අතර ඌව වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනත මගිනුත් ආරක්ෂා කොට ඇති සතෙකි. එසේ හෙයින් අලියාගේ ශරීර කොටස් ප්‍රතිනැව්ගත කිරීම ජාතික මෙන්ම ජාත්‍යන්තර නීතිය යටතේද දඬුවම් ලැබිය යුතු වරදකි.

# ආදායම් හා සේවා පරිෂදය

# ප්‍රකාශන අංශය

## හැඳින්වීම

මෙම කාර්යාංශය "D" ශාඛාවෙන්, දිගු කාමරයෙන්, රථ වාහන අංශයෙන් හා කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීම් අංශය යන කොටස් වලින් සමන්විතය.

ප්‍රකාශන අංශය සංවිධාන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී ස්ථාපිත කරන ලද නව කාර්යාංශයකි. එහි ආරම්භය ඇත්තේ "ආනයන අංශය" තුල වුවත්, දැන් එය ආනයන හැසුරුම් වලනට පමණක් සීමා වී නොමැත. ආනයන, අපනයන, ප්‍රතිනැව්ගත කිරීම, බැඳුම්කර සකස් කිරීම ආදී හසුරුවනු ලබන භාණ්ඩ වර්ග අනුව සිය පරාමිතීන් නිර්වචනය කිරීම වෙනුවට දැන් මෙම කාර්යාංශය එහි ප්‍රධාන කාර්යය වන "ප්‍රකාශන සකස් කිරීම" යන්නට වෙන්වූ කාර්යාංශය ලෙස හඳුනා ගැනේ.

ආනයනකරුවන්, අපනයනකරුවන් හා භාණ්ඩ බැඳුම්කරණය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයින් පිළිවෙලින් එසේ ආනයනය අපනයනය හෝ බැඳුම්කරණය කිරීමට ඇති භාණ්ඩ සම්බන්ධයෙන් ස්වේච්ඡා ප්‍රකාශයන් සිදු කිරීම රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර අවශ්‍යතාවයකි. "Bills of Entries" ලෙස මින් පෙර හඳුන්වනු ලැබූ මෙම ප්‍රකාශ දැන් හඳුන්වනු ලබන්නේ රේගු ප්‍රකාශන හෝ CusDecs ලෙසය. බදු ගෙවීම (අවශ්‍ය පරිදි) හා එම ලේඛනවල ප්‍රකාශ කොට ඇති අදාල භාණ්ඩ නිෂ්කාශන ආදී CusDecs භාර ගැනීම, ලියාපදිංචි කිරීම, සකස් කිරීම හා අනුමත කිරීම පිළිබඳ විශේෂඥතාවයක් මෙම කාර්යාංශය විසින් උසුලයි.

2012 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි අපනයනයන්ට අදාල CusDecs සකස් කිරීමේ කාර්යය මෙම කාර්යාංශයෙන් ඉවත් කොට අපනයන කාර්යාංශය වෙත භාර දෙන ලදී.

ලේඛන සකස් කිරීම ස්වයංක්‍රියකරණය කිරීමත් සමග CusDecs දැනට සකස් කෙරෙනුයේ ACCESS (Automated Customs Cargo, Entry System for Sri Lanka) (ශ්‍රී ලංකාව සඳහා වූ ස්වයංක්‍රිය රේගු භාණ්ඩ ඇතුලත් කිරීමේ පද්ධතිය) තුලින් වන අතර අතින් කරනු ලබන කාර්යයක් වන්නේ භාණ්ඩ වර්ගීකරණ අංශය පමණි. ACCESS හරහා පුද්ගලයන්ට සිය CusDecs අන්තර්ජාල සම්බන්ධතාවය තුලින් සෘජුවම ඉදිරිපත් කිරීමට හෝ දිගු කාමරයේදී පුද්ගලිකව භාරදීමට හැකියාව තිබේ.

ආනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් CusDecs පිළියෙල කරන නිලධාරීන් හට මූලික වශයෙන් ප්‍රකාශක හට පහත දැක්වෙන දෑ ඇති බව තහවුරු කර ගැනීමේ වගකීම ඇත.

- භාණ්ඩ තොගය නිෂ්කාශනය කිරීම ඉල්ලා සිටීම සඳහා අවශ්‍ය වන ප්‍රවාහකයාගේ (නැව, ගුවන්යානය) බලපත්‍රය
- පද්ධතිය තුළ භාවිත යෝග්‍ය කේත යොදා ගනිමින් භාණ්ඩ තොගය ප්‍රමාණවත් ලෙස විස්තර කොට තිබීම
- රේගු අපනයන බදු මත පදනම්ව සුසංගත පද්ධති නාමකරණය හරහා භාණ්ඩ නියමිත පරිදි වර්ගීකරණය කොට තිබීම
- භාණ්ඩ තොගයේ සැබෑ ගනුදෙනු වටිනාකම සඳහන් කොට තිබීම

- යෝග්‍ය විනිමය අනුපාත මත අදාල මුදල් වර්ගය භාවිතයෙන් වටිනාකම් සටහන් කොට තිබීම
- පිළිගත් / අවසර දී ඇති බැංකු මාර්ග හරහා භාණ්ඩ තොගය වෙනුවෙන් ගෙවීම් (විදේශ විනිමය) සම්ප්‍රේෂණය කොට තිබීම
- ඇතුලත් කොට ඇති භාණ්ඩ තොගයට නියමිත 'පටිපාටි කේතය' යටතේ ප්‍රකාශනය කොට සකස් කොට තිබීම
- යෝග්‍ය පරිදි අවශ්‍ය අනුමැතිය ලබා දීමේ ලේඛන, බලපත්‍ර, අවසරපත්‍ර ආදිය අමුණා තිබීම

ඉහත සියළු අවශ්‍යතා සපුරා ඇත්නම් අදාළ නිලධාරියා විසින් බදු ගෙවීම් හා භාණ්ඩ නිෂ්කාශන අනුමත කළ හැකිය.

අනවශ්‍ය ප්‍රමාදයන්ගෙන් තොරව වේගවත්ව නිෂ්කාශන සිදු කිරීම කරන අතරම නියමිත ආදායම ලැබෙන බවටත්, 'සමාජ ආරක්ෂණ' බැඳීම්වලට හානියක් නොවන බවටත් නිලධාරියා විසින් වගබලා ගත යුතුය. ඉහත සඳහන් සියලු අවශ්‍යතා ඉටු කරනු ලැබූ හා අවශ්‍ය සහතික අමුණන ලද භාණ්ඩ තොග සම්බන්ධයෙන් වුවද ඒවා යම් ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමකට අනර්ථකාරී හෝ පිළිකුල උපදවන ඒවා නම් එම භාණ්ඩ දේශීය වශයෙන් සංසරණය වීම වැළක්වීමට අදාල නිලධාරීන් වගබලා ගත යුතුය.

එසේම සමහර භාණ්ඩ සඳහා ආනයන හා අපනයන පාලක, ආහාර සහ ඖෂධ අධිකාරිය, විලවුන් උපකරණ හා ඖෂධ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පරමාණු බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ආදී (මෙහි සඳහන් කොට ඇත්තේ කිහිපයක් පමණි) ආයතන වලින් ලබා ගන්නා බලපත්‍ර අභ්‍යන්තර නිශ්කාෂන සඳහා අවශ්‍ය වේ. ආනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් ආඥා පනත්, පනත් හා රෙගුලාසි 33 කට නොඅඩු සංඛ්‍යාවක් අදාල වන බැවින්, භාණ්ඩ ආනයනකරුවන් එම සියළු අවශ්‍යතා නිසි පරිදි සම්පූර්ණ කරනු ලබන බව තහවුරු කර ගැනීම පිණිස, නිලධාරීන් හට ඒ පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු රෙගුලාසි හා අනෙකුත් ආශ්‍රිත ආඥාපනත් යටතේ රේගු ප්‍රකාශන සකස් කිරීම
2. ආනයන හා අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් නියමිත ආදායම තක්සේරු කිරීම හා එකතු කිරීම
3. වෙළඳාමේ, කර්මාන්තයේ හා පොදු මහජනතාවගේ යහපත වෙනුවෙන් රජයේ ප්‍රතිපත්ති යටතේ බදු විරාමයන් / නිදහස් කිරීම් ප්‍රදානය කිරීම හා තීරු බදු හා බදු අත්හිටුවීම
4. ආනයන හා අපනයනය වලට අදාල සියළු නෛතික අවශ්‍යතා සමග ස්වේච්ඡා අනුගත වීම තහවුරු කිරීම
5. වේගවත් නිෂ්කාශන ක්‍රියාවලී හරහා නිත්‍යානුකූල ආනයනකරුවන් / අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම සපයා දීම

## "D" ශාඛාව

"D" ශාඛාව කාර්යාංශයේ ලේකම් කාර්යාලය ලෙස සැලකිය හැකිය. ඓතිහාසික වශයෙන් වසර 200කට පමණ පෙර රේගු පාලක, ජනරාල්වරයා පත් කිරීමේදී ඔහු යටතේ සේවයේ නියුතු 'A' විෂයය, 'B' විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරිම සඳහා ලිපිකරුවන් 4 දෙනෙකු සේවයේ යෙදී සිට ඇත. පසු කාලයේදී 'A' විෂයය දැනට පවතින මානව සම්පත් කළමනාකරණ කාර්යාංශය ලෙස (මින් පෙර පරිපාලන ශාඛාව) විකාශය විය. "C" ලිපිකරු වරාය රාජකාරි ඉටු කළ අතර පසුව එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් වෙනමම ආයතනයක් ලෙසින් ස්ථාපිත විය. ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කළ, බදු විරාමයක් / නිදහස් ලබා දුන් හා නැව් භාණ්ඩ ලේඛන භාරගත් පැරණි "D" ශාඛාව තවමත් එම කාර්යයන්ට සමාන කාර්යභාරයක් ඉටු කරන අතර තවමත් ඒ නමින්ම හැඳින්වේ.

"D" ශාඛාව විසින් පාලනය කරනු ලබන වැදගත් හා මුඛ්‍ය කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

අ. දෙපාර්තමේන්තුව තුල හා පිටස්තරයන් අතර සම්බන්ධතාවය පැවැත්වීම

ආ. පහත දෑ සඳහා අවසරලබා දීම,

- භාණ්ඩ එවනු ලැබූ රට අනුව වරණීය මිල ගණන් ඉල්ලා සිටීමට අවකාශය ඇත්නම් එසේ ඉල්ලුම් කිරීම
- මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද අවසර ලබා දීමේ ලේඛන ප්‍රකාරව තීරු බදු සහන / විරාමයන් ඉල්ලුම් කිරීම
- ආදායම එක්වර නොගෙවන "විලම්බනය කරන ලද ගෙවීම" පදනමින් එකතු කර ගන්නා අවස්ථාවන්හිදී රජයේ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තු ආදිය වෙත වෙන් කොට ඇති භාණ්ඩ නිෂ්කාශනය කිරීම
- ලබා දී ඇති සහතිකයේ බල සීමාව ප්‍රකාරව විදේශ තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාල සඳහා වෙන් කොට ඇති භාණ්ඩ නිෂ්කාශනය සඳහා අවසර ලබා දීම
- අනෙකුත් බලාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ඒකක වෙත නැව්බඩු ලේඛන ලබාගැනීම, ලියාපදිංචි කිරීම හා බෙදා හැරීම

ඇ. විශාල භාණ්ඩ තොග ආනයනයන අධීක්ෂණය

ඈ. රේගු ආඥාපනත හා ආශ්‍රිත වෙනත් නීති උල්ලංඝනය වන අවස්ථා අනාවරණය කර ගැනීම හා විමර්ශනය සිදු කිරීම, වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම හා විමසීම් සිදු කිරීම

## දිගු කාමරය

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේදී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත්විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල උදා; ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය දැකිය හැකි පොදු ලක්ෂණයකි.

රේගුව ප්‍රධාන වශයෙන් ආදායම කේන්ද්‍ර කොට ගත් රජයේ ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැකිය. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමග සමාජ ආරක්ෂණ බැඳීම් බවට පරිමානය වී ඇති නමුත් ආදායම එකතු කිරීම නම් වූ මූලික ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.

රේගු ආඥාපනතේ 10 වන වගන්තිය රේගු බදු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි 47 වන වගන්තිය අනුව භාණ්ඩ තොග අනායනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳ සැබෑ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළු බදු (තීරු බදු ඇතුළුව) ආනයනකරු විසින් ගෙවිය යුතුය.

රේගුවේ දිගු කාමරය යනු, මෝටර් වාහන හැර අනෙකුත් සියළු මුහුදු භාණ්ඩ සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් රේගු ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු ස්ථානයයි. මෝටර් රථ සම්බන්ධයෙන් රේගු සටහන්කර සකස් කිරීම දැන් පූර්ණ වශයෙන් මෝටර් රථ අංශය වෙත භාර දී තිබේ.

රේගුව විසින් රේගු බදු වලට අමතරව පහත දැක්වෙන බදු වර්ගද අය කරනු ලැබේ.

- අගය එකතු කිරීමේ බද්ද (VAT)
- වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද (PAL)
- ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)
- විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL)
- සුරාබදු (විශේෂ විධිවිධාන)
- බදු (Cess)

ආඥාපනතේ 12, 43 වගන්තිය හා 'ආ' උපලේඛනයට අනුව භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියක ඇතුලත් සීමාවන් හා තහනම් පැනවිය යුතුය. මෙම ඉතා පුලුල් විධිවිධානයට අනුව දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥාපනත් හා රෙගුලාසි 33කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම රේගුවට සිදු වේ. මින් ප්‍රධානතම පනත වන්නේ 1969 අංක 01 දරණ ආනයන හා අපනයන පාලන පනතයි.

## රථ වාහන අංශය

රථවාහන අංශයේ මූලික කාර්යභාරය වන්නේ ආනයනය කරනු ලැබූ වාහන සම්බන්ධයෙන් වන CusDecs සකස් කිරිමයි. රජයේ ආදායමින් 55% ක් පමණ රේගුව විසින් එකතු කරන බැවින් හා ඉන් 27% ක් වාහන සම්බන්ධ බදු ආදායම වන හෙයින් මෙම ඒකකයේ ඇති දැවැන්ත වැදගත්කම යමෙකුට පහසුවෙන් වටහාගත හැකිය.

ACCESS ජාලයේ දැනට පවතින 'AsyCuda World' මෘදුකාංගය හා සම්බන්ධ වීමෙන් රේගුවට බැංකු සමග සම්බන්ධ වී වාහන ආනයනයේදී ප්‍රේෂණය කෙරෙන විදේශ විනිමය පරික්ෂා කර බැලිය හැකි අතර, එසේ ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය පහසු කරවා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමගද සම්බන්ධ විය හැකිය. එබැවින් රේගු බදු නොගෙවන ලද වාහන ලියාපදිංචිය වැලැක්විය හැකිය.

### කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීමේ ඒකකය

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වන්නේ To- බැඳුම්කර හා Ex- බැඳුම්කර සකස් කිරීම වන අතර ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර මෙය බැඳුම්කර ඒකකයේ කොටසක්ව පැවතිණ. කර්මාන්ත හා සේවා සඳහා වෙනම කාර්යාංශයක් තිබුණද, අදාල රේගු සටහන්කර සකස් කිරිම සිදු කරනුයේ ප්‍රකාශන කාර්යාංශය විසිනි.

## 2012 වසර තුල 'D' ශාඛාව විසින් හසුරුවන ලද සිද්ධි පිළිබඳ විස්තරය

| | |
|---|---|
| 1. ලියාපදිංචි කළ සිද්ධි ගණන | 278 |
| 2. අවසන් කරන ලද සිද්ධි ගණන | 186 |
| 3. අවසන් කරන ලද සිද්ධි හා ඒ වෙනුවෙන් පමුණුවන ලද දඩ / රාජසන්තක කිරීම් | 61 |
| 4. මුළු දඩ / රාජපසන්ත කිරීම් ප්‍රමාණය | Rs. 15,719,485 |
| 5. භාණ්ඩවල මුළු වටිනාකම | Rs. 39,738,058 |
| 6. අතිරේක අයකරගැනීම් තුලින් එකතු කර ගත් මුළු මුදල | Rs. 3,391,648 |
| 7. ටෙන්ඩර් විකිණීම් හරහා එකතු කරගත් මුළු මුදල | Rs. 33,403,282 |

## *2012 වසර තුළදී සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව*

| | ජන | පෙබ | මාර්තු | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිගු කාමරයේදී | 16,074 | 11,751 | 15,122 | 12,068 | 13,692 | 13,026 | 15,334 | 14,548 | 13,393 | 13,091 | 15,366 | 14,279 | **167,744** |
| රථ වාහන ඒකකයේදී | 4,474 | 3,399 | 4,392 | 3,185 | 3,378 | 1,607 | 1,417 | 1,688 | 1,269 | 2,396 | 1,131 | 1,774 | **30,110** |
| **EDI** හරහා | | | 517 | | | | | | | | | | **517** |
| හර වැය ශීර්ෂයෙන් ගෙවූ **CusDecs** | 65 | 66 | 50 | | | | | | | | 5 | 37 | **223** |
| එකතුව | **20,613** | **15,216** | **20,081** | **15,253** | **17,070** | **14,633** | **16,751** | **16,236** | **14,662** | **15,487** | **16,502** | **16,090** | **198,594** |

**එකතු කර ගනු ලැබූ ආදායම 'දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනය' යටතේ දක්වා ඇති හෙයින් එම තොරතුරු මෙහි පල නොවේ.**

# කර්මාන්ත හා සේවා කාර්යාංශය

**හැඳින්වීම**

ඓතිහාසිකව රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආනයන හා අපනයන බදුකරණයයි. යම් විශේෂ හේතූන් මත මෙම බදුකරණ ක්‍රියාවලිය 'බැඳුම්කර' ආකාරයෙන් තාවකාලිකව නතර කරනු ලබන (අත්හිටුවන) අවස්ථා තිබේ. රේගු ව්‍යවහාරයේදී 'බැඳුම්කර' යන්නෙන් අදහස් කරනුයේ ආනයනය කරන ලද බදු අය කළ යුතු භාණ්ඩ එම කාර්යය සඳහාම වෙන් වූ 'බැඳුම්කර ගබඩාවක්' ලෙසින් හඳුන්වනු ලබන ගබඩාවක ආරක්ෂිතව තැබීමයි.

අතීතයේදී මෙම 'බැඳුම්කර' ක්‍රමවේදය යොදාගනු ලැබුවේ බදු ගෙවීමකින් තොරව සිය ආනයනික භාණ්ඩ නැවත අවශ්‍ය වන තෙක් 'රැජිනගේ ගබඩාවේ' තැන්පත් කොට තබන වෙළඳුන් හට අවශ්‍ය පහසුව සැපයීමයි. ඇතැම් අවස්ථාවල වෙළඳුන් මූල්‍ය හේතු මත භාණ්ඩ බැඳුම්කරණය කිරීමටද ඉදිරිපත් වී ඇත. පසු කාලයකදී මෙම ක්‍රමය වෙනස් වී නිෂ්පාදකයන් හට බදු ගෙවීමකින් තොරව අමුද්‍රව්‍ය ගබඩාකොට තැබීමටත් එම අමුද්‍රව්‍ය යොදාගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඉඩ දීම දක්වාත් විකාශනය විය. එමගින් ඔහුට බදු ගෙවීමට අවශ්‍යතාවයක් උදා නොවුනු නමුත් රටට අවශ්‍ය විදේශ විනිමය ඉපැයීමට එය හොඳ අවස්ථාවක් විය. මෙම මූලික සංකල්පයට විවිධ එකතුවීම් සිදුව ඇති අතර එමගින් විවිධ නව කර්මාන්තයන් හට ඉදිරියට ඒමට අවස්ථාව නිර්මාණය වී තිබේ. දැනට එය රටේ කර්මාන්ත හා ආර්ථික වර්ධනයට දිරි දීමේ ක්‍රමවේදයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. මෙහි වඩාත්ම වැදගත් කාර්යය වනුයේ එය අප රට ජාත්‍යන්තර වෙලඳාමේ කරලියට ගෙන ඒමයි.

කර්මාන්ත හා සේවා අංශය ආනයනය කරන ලද භාණ්ඩ, කර්මාන්ත හ වාණිජ අවශ්‍යතාවයන් පරිදි විශේෂිත ක්‍රියා පටිපාටි යටතේ නිෂ්කාශනය කිරීම සඳහා ආරක්ෂිත / බැඳුම්කර යටතේ තාවකාලිකව ගබඩා කර තැබීමට අදාල රේගු කටයුතු සිදු කරයි. එමෙන්ම රේඛීය ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් එනම්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සම්බන්ධිකරණය මගින් නිෂ්පාදන / අපනයන කර්මාන්ත විවිධාංගීකරණ ප්‍රවණතාව ගවේෂණය කිරීමේ අරමුණින් කටයුතු කිරීම සඳහා එකී කර්මාන්ත ධෛර්යමත් කරයි.

**ප්‍රධාන කාර්යයන්**

වෙළඳාම පහසු කිරීමේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම / පරිපාලනය කිරීම මෙම කාර්යාංශය වෙත පවරා ඇති කාර්යභාරය වේ. කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රේගු බැඳුම්කර ගබඩා කළමනාකරණය කිරීම
2. අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන හා තීරුබදු ප්‍රතිදාන පරිපාටි ආදී අපනයන පහසුකරවීමේ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම
3. තීරු බදු රහිත සාප්පුවල කටයුතු කළමනාකරණය කිරීම
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලට අදාල භාණ්ඩ ආනයන / අපනයන කටයුතු කිරීමේදී එම ආයතනය සමග සම්බන්ධිකරණය කිරීම
5. බඩු ගබඩා කිරීම, තොග පාලනය, නැව් බඩු පාලනය හා ආයෝජන මණ්ඩලයේ ආනයන / අපනයන සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වා ගෙන යාම සඳහා ICT කාර්යාංශය සමග සම්බන්ධිකරණය කිරීම.
6. 'විලම්බන තන්ත්‍ර' රේගු සටහන්කර සකස් කිරීමේදී ප්‍රකාශන කාර්යාංශය සමග සම්බන්ධිකරණය කිරීම

කර්මාන්ත හා සේවා කාර්යාංශයේ ප්‍රධාන ශාඛා

1. ලේඛන ශාඛාව
2. ව්‍යාපෘති ශාඛාව
3. නියාමන හා නැවත ගෙවීමේ ශාඛාව
4. ආයෝජන මණ්ඩල සම්බන්ධිකරණ ඒකකය
5. තැපැල් තක්සේරු (කොළඹ) ශාඛාව

# ලේඛන ශාඛාව

සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| (අ) ප්‍රධාන කාර්යාලයේ ඇති මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 82,395 | 88,096 | 95,397 |
| (ආ) ආයෝජන පහසුකම් අංශයෙහි ඇති මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 5,885 | 6,030 | 4,618 |

## කර්මාන්ත හා සේවා කාර්යාංශයේ අය කර ගැනීම්

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| **ආදායම් එකතු කර ගැනීම (රු. මිලියන)** | 13,875 | 15,466 | 15,783 |
| **පරීක්ෂණ ගාස්තු (රු. මිලියන)** | 7.4 | 7.0 | 7.3 |

## ව්‍යාපෘති අංශය

රේගු බැඳුම්කර ගබඩාවල වත්මන් තත්ත්වය (2012)

| | | පොදු බැඳුම්කර | පෞද්ගලික බැඳුම්කර | නිෂ්පාදන බැඳුම්කර | සිනි බැඳුම්කර | **UPB** බැඳුම්කර |
|---|---|---|---|---|---|---|
| **i** | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 06 | 49 | 6 | 04 | 08 |
| **ii** | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | - | - | - | 01 | - |
| **iii** | අවලංගු කිරීම් සංඛ්‍යාව | - | - | - | 01 | - |
| **iv** | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 06 | 49 | 06 | 04 | 08 |

| | | සේවා බැඳුම්කර | **Feeder** බැඳුම්කර | තීරු බදු රහිත | **MCC** බැඳුම්කර | එකතුව |
|---|---|---|---|---|---|---|
| **i** | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 13 | 75 | 52 | 07 | **220** |
| **ii** | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | - | 01 | 01 | - | **03** |
| **iii** | අවලංගු කිරීම් සංඛ්‍යාව | - | - | - | - | **01** |
| **iv** | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 13 | 76 | 53 | 07 | **222** |

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ තීරුබදු රහිත සාප්පුවල වෙළඳාම පිළිබඳ තොරතුරු

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| සී ට්‍රාන්ස් ඩියුටි ෆ්‍රී ෂොප් (USD) | 817,165/- | 1,349,906/- | 1,144,855/- |
| සිලෝන් පෝර්ට් සර්විසස් ලිමිටඩ් (USD) | 975,275/- | 647,200/- | නැත |
| STC ජෙනරල් ට්‍රේඩින් කොම්පැනි ලිමිටඩ් (USD) | 1,193,483/- | 703,444/- | 1,161,806/- |
| එඩිසන් ඉලෙක්ට්‍රිකල් ඩියුටි ෆ්‍රී | නැත | නැත | නැත |
| මුළු (USD) | 2,985,922/- | 2,407,578/- | 2,306,661/- |

## TIEP1, TIEP 4 & IBG වැඩසටහන් වල වර්තමාන තත්ත්වය (2012)

**1.** මෙහෙයුම්කරුවන්

| | TIEP 1 | TIEP 4 | IBG |
|---|---|---|---|
| i. වසර ආරම්භයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව | 863 | 474 | 199 |
| ii. වසර තුළදී එක්වූ මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව | 64 | 19 | 16 |
| iii. වසර අවසානයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව | 927 | 493 | 215 |

**I.** ආනයනවල වටිනාකම (සෘජු හා වක්‍ර) (රු.)

| | TIEP 1 | TIEP 4 | IBG |
|---|---|---|---|
| ආනයන වල වටිනාකම | 65,054,012,070 | 2,116,024,978 | 598,169,706 |

**II.** තීරු බදු අවලංගු කිරීම්

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| වසර සඳහා ප්‍රතිපාදන (රු. මිලියන) | 59.88 | 300 | 300 |
| තීරු බදු අවලංගු කිරීම් ගෙවීම් (රු. මිලියන) | 41.49 | 4 | 14.78 |
| ශේෂ ප්‍රතිපාදන (රු. මිලියන) | 18.39 | 20 | 6.78 |
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | 1,777 | 940 | 394 |
| සකස් කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 367 | 168 | 261 |

# අධීක්ෂණ හා නැවත ගෙවීම් අවශ්‍ය ලබා ගත් ආදායම

ලබා ගත් ආදායම

| | 2012 | |
|---|---|---|
| | ඇපකර සංඛ්‍යාව | වටිනාකම (රු.) |
| පිළිගත් බැංකු ඇපකර | 1,583 | 2,091,411,180 |
| ඉල්ලා සිටි බැංකු ඇපකර | 510 | 887,120,369 |
| පියවන ලද බැංකු ඇපකර | 1,590 | 2,346,864,443 |
| පිළිත් පුද්ගල ඇපකර හා ආයතනික ඇපකර | 156 | 10,038,425,000 |
| පියවන ලද පුද්ගල ඇපකර හා ආයතනික ඇපකර | 121 | 9,964,078,000 |

# ආයෝජන මණ්ඩල කර්මාන්ත සම්බන්ධිකරණ අංශය

**i.** ආයෝජකයින් සංඛ්‍යාව

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| වසර ආරම්භයේදී ආයෝජකයන් සංඛ්‍යාව | 189 | 190 | 214 |
| වසර තුලදී ලියාපදිංචි නව ආයෝජකයින් | 10 | 24 | 79 |
| වසර අගදී ආයෝජකයන් සංඛ්‍යාව | 199 | 214 | 293 |

**ii.** සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| ආනයන | 3034 | 3068 | 2,215 |
| අපනයන | 2851 | 2497 | 2,201 |

| | | 2011 | 2012 |
|---|---|---|---|
| iii | ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලින් ලත් ආදායම (රු. මිලියන) | 10,013 | 9,984 |
| iv | ඇපකර අවලංගු කිරීම හේතුවෙන් ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලින් ලත් ආදායම (රු. මිලියන) | 9.5 | 37.0 |

## රේගු ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ ඒකකය (CBCU)

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| වසර ආරම්භයේදී තිබූ සිද්ධි සංඛ්‍යාව | 51 | 51 | 51 |
| වසර තුළ මුල පුරන ලද සිද්ධි සංඛ්‍යාව | 4 | 1 | - |
| වසර තුලදී අවසන් කරන ලද විමසුම් සංඛ්‍යාව | 3 | 3 | - |
| විමර්ෂණ අවසන් නොමැති සිද්ධි සංඛ්‍යාව | 48 | 48 | 45 |
| විමසුම් අවසන් නොමැති සිද්ධි සංඛ්‍යාව | 4 | - | 1 |
| වසර අවසානයේදී | | - | |
| අධිකරණයේදි නඩු පවරන ලද සිද්ධි සංඛ්‍යාව | - | - | - |
| අය කරගැනීම් (රු.) | | | |
| විශේෂ තැන්පත් (රු.) | - | - | - |
| දඩ / රාජසන්තක කිරීම් (රු.) | 59,115,200/- | 88,552,987/- | - |
| විකුණුම් ආදායම (රු.) | | | 527,500/- |
| රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම | | | - |
| එකතුව (රු.) | **59,115,200/-** | **88,552,987/-** | **527,500/-** |

## බැඳුම්කර විමර්ෂණ ඒකකය

**අනාවරණය කරගත් උල්ලංඝනයන් සංඛ්‍යාව, අයකරගත් සංඛ්‍යාව හා අධිකරණයේ පවරන ලද නඩු**

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| වසර මුලදී තිබූ සිද්ධි සංඛ්‍යාව | 610 | 619 | 569 |
| වසර තුලදී මුල පුරන ලද සිද්ධි සංඛ්‍යාව | 12 | 12 | 29 |
| වසර තුලදී අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව | 3 | 62 | 7 |
| විමර්ශන අවසන් නොමැති සිද්ධි සංඛ්‍යාව | 619 | 569 | 574 |
| වසර අවසානයේදී අවසන්ව නොමැති විමර්ශන සංඛ්‍යාව | 4 | 3 | 1 |
| අධිකරණයේ නඩු පවරන ලද සිද්ධි සංඛ්‍යාව | 2 | 2 | නැත |
| දඩ / රාජසන්තක කිරීම් | නැත | 750,000 | 14,229,764 |
| රාජසන්තක කිරීම් වල වටිනාකම | 638,986 | 234,720 | 37,637,847 |

# තැපැල් තක්සේරු අංශය

2012 වසරේදී එකතු කර ගත් ආදායම

| කොළඹ (රු.) | මහනුවර (රු.) | ගාල්ල (රු.) | ත්‍රිකුණාමලය (රු.) | යාපනය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| 81,273,448 | 4,032,062 | 3,212,883 | 1,003,000 | 1,899,028 | **91,420,421** |

| | PA | BULK | EMS | TOTAL |
|---|---|---|---|---|
| POD සංඛ්‍යාව | 30,513 | 734 | 14,830 | 46,077 |
| පාර්සල් සංඛ්‍යාව | 35,318 | 801 | 17,850 | 53,969 |
| වටිනාකම (රු.) | 187,172,751 | 2,872,235 | 331,052,980 | 521,097,966 |
| මුළු බදු (රු.) | 25,309,985 | 249,908 | 55,713,555 | 81,273,448 |

# භාණ්ඩ පරීක්ෂණ අංශය

## හැඳින්වීම

භාණ්ඩ පරීක්ෂණ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ මුහුදු මගින් ආනයනය කළ භාණ්ඩ ඒවායේ හිමිකරුවන් වෙත මුදා හැරීමට පෙර රේගු අවශ්‍යතා සඳහා එම භාණ්ඩ පරීක්ෂා කර බැලීමයි. මෙම පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබන්නේ අදාල භාණ්ඩ වලින් රජයට නියමිත ආදායම ලැබෙන බව සහතික කිරීම සඳහා වේ. එමෙන්ම තාක්ෂණික හා භෞතික තහවුරුව මගින් රේගු ආඥාපනත හා අනෙකුත් ආනුෂංගික අණ පනත් මගින් කර ඇති තහනම් හා සීමා කිරීම පිළිබඳව කටයුතු කිරීම සහතික කිරීමද මෙමගින් සිදු කෙරේ. නිත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ ප්‍රධාන වගකීමකි.

**ප්‍රධාන කාර්යයන්**

1. ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ආනයන රේගු ප්‍රකාශන නිරවද්‍යභාවය සඳහා තවදුරටත් පරීක්ෂා කිරීම
2. වෙනස් පරීක්ෂණ මටටම් යටතේ භාන්ඩ පරීක්ෂා කිරීම සඳහා බහාලුම් විවිධ පරීක්ෂණ මධ්‍යස්ථානවලට යොමු කිරීම
3. බහාලුම් පරීක්ෂාවේදී හා නිදහස් කිරීමේදී අවදානම් කළමනාකරණය පදනම් කරගත් බහලුම් තේරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරීම
4. නියමිත ආදායම ලබන බව සහතික කිරීම සඳහා බහාලුම් භෞතිකව පරීක්ෂා කිරීම
5. සිතාමතාම බහාලුම් ප්‍රකාශන නිසි පරිදි ඉදිරිපත් නොකෙරෙන අවස්ථා හසුකර ගැනීමට හා වැළැක්වීම සඳහා බහාලුම් දෛනිකව පරීක්ෂා කිරීම
6. තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ සංචලනයට අදාල අනෙකුත් මුහුදු සීමා පාලන රෙගුලාසි භාවිතා වන බව සහතික කිරීම සඳහා බහාලුම් පරීක්ෂාව
7. වේගවත් නිෂ්කාෂණ කටයුතු පහසු කරන මෙවලමක් වශයෙන් සඟවා ගෙන එන සහ ප්‍රකාශ නොකළ භාණ්ඩ හසුකරගැනීම සඳහා එක්ස්රේ ස්කෑන් යන්ත්‍ර භාවිතා කිරීම

පරීක්ෂණ සඳහා වන මුහුදු මාර්ගයෙන් ගෙන එන භාණ්ඩ වල විෂයපථය පුළුල් කොට ඒ තුළ පුද්ගලික ප්‍රයෝජනය සඳහා සහ

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI),
- අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන (TIEP) හා
- රේගු බැඳුම්කර යෝජනා ක්‍රම.

යටතේ ක්‍රියාත්මක අපනයන කේන්ද්‍රිය කර්මාන්ත ඇතුළත් වේ.

මුහුදු මගින් ගෙන එන භාණ්ඩ ආනයනය කරනු ලබන්නේ අඩු බහලුම් ධාරිතාවෙන් යුත් භාණ්ඩ ලෙස හෝ බහලුම් තලය, බහලුමේ අඩංගු භාණ්ඩ තොගය එක් පාර්ශ්වයකට භාර දීමේදී එවන් තොග

පූර්ණ බහාලුම් තොග (FCL); ලෙස හැඳින්වේ. එය පාර්ශ්ව කිහිපයක් වෙත භාරදීමේදී ඒවා අඩු ධාරිතාවයෙන් යුත් බහලුම් තොග ලෙස හැඳින්වේ. (LCL).

මුහුදු මගින් ගෙන එන භාණ්ඩ, පූර්ණ බහාලුම් ධාරිතාවන්ද, අඩු බහාලුම් ධාරිතාව හා මහා පරිමාණ තොග වශයෙන්ද පැමිණෙන මධ්‍යම මට්ටමේ අවදානමක් සහිත හා ඉහළ අවදානමක් සහිත බහාලුම් සම්පූර්ණ පරීක්ෂාව සඳහා වරායෙන් පිටත බහාලුම් අංගන දෙකක් ක්‍රියාත්මක වේ. එමෙන්ම අඩු අවදානම් සහිත බහාලුම් පරීක්ෂාව සඳහා තවත් අංගනයන්ද ක්‍රියාත්මක වේ. අඩු ධාරිතාවෙන් සහිත බහාලුම් ඉහත සඳහන් කළ පරීක්ෂණ මධ්‍යස්ථාන වලදීද වරායෙන් පිටත පිහිටි ගබඩාවකදීද පරීක්ෂණයට භාජනය කෙරේ. ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ව්‍යාපාර සඳහා ගෙන එනු ලබන භාණ්ඩ පරීක්ෂාව සඳහා වෙනම අංගනයන් පිහිටුවා ඇත. එක්ස්රේ ස්කෑන් යන්ත්‍ර 2 ක් වරාය තුළ පිහිටුවා ඇති අතර තවත් එක් යන්ත්‍රයක් වරායෙන් පිටත පිහිටුවා ඇත.

**පොදු වැඩි දියුණු කිරීම**

සැපයුම් දාමයේ ප්‍රමාදයන් අවම කිරීම සඳහා සහ භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම සඳහා වරාය තුළ පිහිටා ඇති X කිරණ ස්කෑනර් අංගනය තුළ පූර්ණ කාර්ය මණ්ඩලයක් සහ සියළු පහසුකම් සහිත කාර්යාලයක් ස්ථාපිත කොට ඇත. ඉලක්කගත ඉහළ අවදානම් භාණ්ඩ බහාලුම් පරීක්ෂා කිරීම සඳහා X කිරණ ස්කෑනර් භාවිතා කරන අතර අනෙක් අතට එය භාණ්ඩ නිෂ්කාශනයේදි ඇතිවන බාධාවක් මගහරවාගෙන අඩු අවදානම් සහිත බහලුම් ඉතා කඩිනමින් නිදහස් කිරීම පහසු කිරීමේ මෙවලමක් ලෙසද භාවිතා කෙරේ.


ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කර්මාන්ත වලට සේවය සැපයීම සඳහා ඕරුගොඩවත්ත මධ්‍යම සත්‍යොක්ෂණ පර්යන්තයේ පැය 24 පුරා ක්‍රියාත්මක මුහුදු භාණ්ඩ නිෂ්කාශන පහසුකම් සලසා ඇත.


එමෙන්ම ආයෝජකයාගේ පරිශ්‍රයේදීම පරීක්ෂා කිරීම සිදු කිරිම දක්වා පහසුකම් පුළුල් කර ඇත. ආයෝජන මණ්ඩලය මගින් නිර්දේශ කරනු ලබන තෝරාගත් සමාගම් සඳහා ග්‍රීන් චැනල් පහසුකම් ලබා දී ඇත.


කොල චැනල නිෂ්කාශන යටතේ ගෘහස්ථ භාවිතය සඳහා ආනයනය කරන ලද අඩු අවදානමක් සහිත භාණ්ඩ බහාලුම් 36000 ක් නිදහස් කිරීමට 2012 වසරේදී ඉලක්ක කරන ලද අතර එමගින් නිත්‍යානුකූල වෙළඳුන් හට සපයනු ලබන සහනය ඉහළ දැමීම අපේක්ෂාව විය. නමුත් අපේක්ෂිත ඉලක්කය ඉක්මවා යමින් බහාලුම් 49,982 ක් නිදහස් කිරීමට හැකියාව ලැබුණි.

2012 කාර්ය සාධනය

| විස්තරය | | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| පරීක්ෂණ මධ්‍යස්ථාන වලදී ලියාපදිංචි කරන ලද ආනයන රේගු ප්‍රකාශන (නිවාස වල ප්‍රයෝජනය සඳහා) | | 226,584 | 222,131 | 189,617 |
| **පරීක්ෂණ වර්ගය** | Amber | 114,257 | 153,657 | 138,360 |
| | Detailed | 12,834 | 12,791 | 15,036 |
| | HRC | 4,416 | 5,956 | 3,329 |
| | රතු | 9,145 | 1,576 | 1,868 |
| | කොළ | | | 24,784 |
| | වෙනත් (Infac, TIEP, etc.) | 13,725 | 7,749 | 6,240 |
| නිෂ්කාශනය කළ ආයෝජන මණ්ඩල නැව් භාණ්ඩ (පිටත කලාපය) | | 27,968 | 58,362 | *59,010 |
| හසු කර ගත් සිද්ධි සංඛ්‍යාව | | 200,314 | 236,103 | 245,714 |
| අතිරේක රේගු සටහන්කර මගින් අයකරගත් මුදල් (රු. මිලියන) | | 325 | 436 | 572 |
| දඩ මුදල් (රු. මිලියන) | | 113 | 506.3 | 487.0 |
| රාජසන්තක කළ භාණ්ඩ වල වටිනාකම (රු. මිලියන) | | 55.8 | 62.4 | 67 |
| දඩ මුදල් (රු. මිලියන) | | 7.8 | 30.5 | 2.1 |
| රාජසන්තක කළ භාණ්ඩ වල වටිනාකම (රු. මිලියන) | | 39,613 | 90,771 | 33,002 |
| ස්කෑන් කරන ලද බහාලුම් සංඛ්‍යාව | | 9,758 | 12,627 | 14,238 |
| (* LCL - 40,573 + FCL - 18,437) | | | | |




100000
10000
1000
100
10
1
2011
2012


ආනයන සංඛ්‍යාව (ගෘහස්ථ භාවිතය)
2012 වසරේදී නිශ්කාෂණය කරන ලද භාණ්ඩ
100000
90000
80000
70000
60000
50000
40000
30000
20000
10000
0
7562
11102
2680
37470
23854
35069
14124
12844
277
88267
44398
GL1
GL II
HRC
NNR
JCT
BQ
Guidepier
Kochchikade
PVQ
RCT
BOI
Number of FCL consignments cleared

# මගී සේවා - කොළඹ අංශය

හැඳින්වීම

මගී සේවා අංශය කොළඹ වරායට ඇතුළු වන හා ඉන් පිටවන මගීන් හා භාණ්ඩ ඵලදායි ලෙස පාලනය කිරීම වෙනුවෙන් වගකීමට බැඳී සිටී.

ප්‍රධාන කාර්යයන්

1. රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිශ්කාෂණය පහසු කිරීම
2. ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය වැලැක්වීම
3. සමාජයේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම
4. UPB ගබඩා පාලනය හා නියාමනය කිරීම

2012 වර්ෂය තුළ ගමන් බඩු අංශයේ ආදායම

| | දඩ මුදල් (රු) | බදු හා අයබදු (රු) | එකතුව (රු) |
|---|---|---|---|
| ගමන් බඩු (කවුන්ටරය) | 4,352,859 | 25,377,029 | 29,729,888 |
| ගමන් බඩු (විකුණුම්) | 4,924,693 | 142,499,814 | 147,424,507 |
| ගමන් බඩු (නව නුගේ පාර) | 3,749,702 | 53,467,047 | 57,216,749 |
| ලක්සිරිසේවා | 1,370,672 | 58,105,485 | 59,476,157 |
| ට්‍රාන්ස්කෝ | 1,014,771 | 37,320,546 | 38,335,317 |
| මීඩ්කෝ | 1,304,239 | 24,113,592 | 25,417,831 |
| ට්‍රයිකෝ (කොළඹ) | 2,659,683 | 71,436,542 | 74,096,225 |
| CSL (කොළඹ) | 2,347,269 | 60,853,479 | 63,200,748 |
| **උප එකතුව** | **21,723,888** | **473,173,534** | **494,897,422** |
| | | | |
| Trico (ගාල්ල) | 461,212 | 12,472,502 | 12,933,714 |
| Trico (කුරුණෑගල) | 360,700 | 18,012,145 | 18,372,845 |
| CSL (මහනුවර) | 426,404 | 15,245,340 | 15,671,744 |
| **උප එකතුව** | **1,248,316** | **45,729,987** | **46,978,303** |
| | | | |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල | 100,585,834 | 149,829,790 | 250,415,624 |
| | | | |
| **එකතුව** | **123,558,038** | **668,733,311** | **792,291,349** |

# අපනයන කාර්යාංශය

## හැඳින්වීම

අපනයන අංශය සමග ක්‍රියාපරිපාටි සරල කිරීම තුලින් හා Direct Trader Input (DTI), ක්‍රමය හඳුන්වාදීම මගින් අන්තර්ජාතික නිත්‍යානුකූල භාණ්ඩ සංචලනය ධෛර්යමත් කරන අතර ඍජු අපනයන හා ප්‍රති අපනයන නිෂ්කාශනය සඳහා පහසුකම් සලසයි. එමෙන්ම මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික, සමාජ අභිලාෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීමද දරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. මෙම අංශය, වරාය මගින් හා ගුවන් මගීන් කරනු ලබන අපනයන සම්බන්ධව සියලු කටයුතු වලට සම්බන්ධ වේ.
2. රටෙන් අපනයනය කරනු ලබන සියලු භාණ්ඩ සම්බන්ධ සෑම කරුණකටම දායක වේ.
3. අපනයන භාණ්ඩ රේගු අවශ්‍යතා සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා පරික්ෂා කිරීම
4. අපනයන බදු, සෙස් බදු, රාජ්‍ය භාග සියලු අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අය කිරීම
5. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් නවතන ස්ථාන කළමනාකරණය
6. MCC තොග ගබඩාව පවත්වාගෙන යාම
7. Carnet ක්‍රමය යටතේ තාවකාලික ආනයන/අපනයන පහසු කරවීම
8. ආපසු ගෙවීම් ඉල්ලීම් අනුමත කිරීම
9. නැව්ගත කිරීමේ සහතික නිකුත් කිරීම
10. තීරුබදු ප්‍රතිදාන ලේඛන සහතික කිරීම
11. නිදහස් ප්‍රති අපනයන සහතික ලියාපදිංචිය
12. Rules of Origin අනුව වෙළඳ දෙපාර්තමේන්තුව නැව්ගත කිරීම සහතික කිරීම
13. ප්‍රතිනැව්ගත කිරීම් කටයුතු පහසු කරලීම
14. ජාතික වෙළඳ සංඛ්‍යාත ලේඛණ සැපයීම
15. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම
16. පුද්ගලික අංශය, රාජ්‍ය ආයතන ඇතුළුව සියලු දායකයන් සමග සහයෝගිතාවය ගොඩ නැගීම
17. සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය නිරන්තරයෙන් වර්ධනය කෙරෙන ආකාරයට පද්ධති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැගීම
18. අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය උපරිම ආකාරයට භාවිතයට ගැනීම

| | January | February | March | April | May | June | July | August | Sep. | Oct. | Nov. | Dec. | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| No. of CusDecs Processed | 12,276 | 11,251 | 13,891 | 11,323 | 13,286 | 13,114 | 13,501 | 12,093 | 12,065 | 12,957 | 12,456 | 11,493 | 149,706 |
| No. of Shipment effected (No. of CusDecs)(Customs + BOI) | 29,721 | 25,818 | 28,355 | 21,054 | 25,265 | 26,942 | 23,409 | 24,093 | 22,172 | 23,888 | 22,564 | 24,034 | 297,315 |
| Panel Applications | 893 | 893 | 1,109 | 817 | 917 | 1,162 | 1,158 | 1,160 | 1,052 | 1,080 | 1,110 | 1,035 | 12,386 |
| Examination fees Collected | 4,397,550 | 3,951,980 | 4,644,700 | 3,023,500 | 4,222,000 | 4,450,800 | 3,996,800 | 4,286,350 | 3,580,170 | 4,061,780 | 4,048,200 | 3,995,050 | 48,658,880 |
| Computer fees collected | 2,515,750 | 2,446,000 | 2,859,700 | 2,471,100 | 2,889,650 | 2,788,400 | 3,340,000 | 3,215,000 | 3,048,500 | 3,272,500 | 3,144,500 | 2,901,750 | 34,892,850 |
| Export Levies Collected : I. Export Duty | 2,028,148 | 2,314,507 | 1,367,172 | 1,117,218 | 2,088,671 | 1,384,793 | 1,785,614 | 2,613,443 | 2,320,252 | 2,369,491 | 1,846,422 | 571,588 | 21,807,319 |
| II. Royalty | 6,729 | 4,162 | 4,484 | 2,208 | 10,559 | 3,313 | 2,223 | 900 | 8,987 | 3,378 | 4,666 | 1,823 | 53,432 |
| III. CESS - a. CC 1 | 6,418,386 | 6,568,134 | 7,112,360 | 5,609,285 | 7,475,052 | 8,975,040 | 9,831,150 | 8,484,872 | 7,415,539 | 7,930,224 | 6,477,077 | 5,261,572 | 87,558,691 |
| b. TC 1 | 16,635,194 | 15,783,017 | 17,145,576 | 13,770,709 | 20,911,931 | 64,895,048 | 71,189,910 | 59,501,901 | 59,609,332 | 57,418,492 | 59,957,478 | 55,155,325 | 511,973,913 |
| c. TC 2 | 13,874 | 13,794 | 14,999 | 12,026 | 18,283 | 57,693 | 62,230 | 52,033 | 52,144 | 50,212 | 52,496 | 48,199 | 447,983 |
| d. RC 1 | 80 | 4,904 | 3,004 | 287,872 | 52,923 | 76,503 | 308,077 | 100 | 4,000 | Nil | 3,280 | Nil | 740,743 |
| e. RC 4 | Nil | Nil | Nil | Nil | 11 | 3 | 9 | Nil | 5,236 | 279 | 660 | Nil | 6,198 |
| f. EEC | 72,755,749 | 84,460,510 | 114,779,542 | 78,576,694 | 88,132,218 | 180,957,185 | 200,613,956 | 184,549,461 | 175,282,530 | 203,428,644 | 192,803,883 | 170,970,483 | 1,747,310,855 |
| Air Cargo CC 1 | 15,435 | 8,260 | 11,133 | 20,385 | 12,915 | 16,248 | 14,960 | 3,990 | 11,963 | 1,580 | Nil | Nil | 116,869 |
| Extra (Short paid Cess) | 1,752 | 5,233 | 367 | 9,740 | 4,428 | 3,608 | 2,467 | 1,303 | 61,001 | 28,681 | 1,337,322 | 1,461,110 | 2,917,012 |
| Over time Charges | 3,299,078 | 3,785,454 | 3,932,887 | 3,460,199 | 3,707,179 | 3,848,794 | 4,015,644 | 3,803,481 | 3,927,528 | 3,752,838 | 3,584,960 | 3,579,909 | 44,697,951 |
| Current Accounts i. No. of Current Account holders | 45 | 45 | 45 | 45 | 66 | 45 | 46 | 46 | 46 | 46 | 46 | 47 | 568 |
| ii. No. of Current Account operated | 44 | 45 | 45 | 45 | 66 | 44 | 45 | 45 | 45 | 39 | 41 | 39 | 543 |
| iii. Deposits during the period | 151,685,371 | 175,173,788 | 199,059,497 | 152,346,796 | 155,028,919 | 149,539,333 | 173,647,935 | 140,173,543 | 143,988,978 | 148,943,045 | 136,355,989 | 129,005,774 | 1,854,948,968 |
| iv. Total amount debited during the period - | 125,763,359 | 161,710,622 | 185,591,780 | 112,627,480 | 123,713,161 | 155,521,486 | 168,093,490 | 142,554,460 | 140,543,756 | 145,357,762 | 134,323,006 | 128,268,466 | 1,724,068,828 |
| v. No. of entries passed against current accounts - | 1,735 | 1,982 | 2,350 | 2,053 | 1,488 | 1,488 | 2,062 | 2,050 | 1,908 | 1,904 | 1,754 | 1,630 | 22,404 |
| No. of FRICC issued on request | 57 | 47 | 63 | 49 | 66 | 61 | 49 | 47 | 38 | 52 | 39 | 43 | 611 |
| No. of Shipment certificates issued | 44 | 24 | 44 | 55 | 15 | 24 | 42 | 16 | 23 | 40 | 38 | 15 | 380 |
| Shipment/Export Certificate fees collected | 12,950 | 5,250 | 12,000 | 15,750 | 26,400 | 18,400 | 10,500 | 4,000 | 5,750 | 10,000 | 9,500 | 3,750 | 134,250 |
| CusDecs amendments / Cancellations (Penalties) /Vessel Ammendment | 1,049,352 | 394,238 | 493,900 | 418,750 | 998,500 | 3,564,927 | 453,950 | 613,006 | 554,950 | 660,750 | 623,000 | 930,533 | 10,755,856 |
| No. of Vessel/Flight Amendments | 531 | 538 | 647 | 650 | 745 | 761 | 768 | 606 | 1,501 | 999 | 830 | 792 | 9,368 |
| Transshipment : Total No. of Deposit (container) | 78,841 | 71,089 | 85,769 | 85,482 | 80,927 | 99,832 | 93,256 | 86,189 | 76,878 | 88,339 | 76,400 | 79,137 | 1,002,139 |
| Total No. of Container Re-shipped | 75,564 | 70,016 | 86,025 | 81,123 | 76,816 | 101,195 | 96,832 | 98,495 | 86,469 | 90,989 | 94,204 | 87,815 | 1,045,543 |
| Tranship sea to air | 39 | 41 | 26 | 46 | 50 | 36 | 42 | 38 | 34 | 45 | 38 | 31 | 466 |
| No of clearance issued (Vessel) | 266 | 249 | 310 | 239 | 278 | 292 | 279 | 277 | 244 | 243 | 255 | 266 | 3,198 |
| No. of Outward Flight | 1,011 | 464 | 1,724 | 1,908 | 1,735 | 1,704 | 1,696 | 1,721 | 1,599 | 2,008 | 1,910 | 1,965 | 19,445 |
| No. of ships stores received | 256 | 272 | 316 | 244 | 288 | 278 | 270 | 221 | 208 | 232 | 193 | 223 | 3,001 |
| No. of Bills of Store | 5 | 11 | 2 | 6 | 20 | 10 | 10 | 5 | 7 | 12 | 39 | 8 | 135 |
| No. of Removal out | 4 | 4 | 3 | 2 | 6 | 3 | 2 | 2 | Nil | 1 | 4 | 2 | 33 |
| No. of manifest | 46 | 66 | 35 | 26 | 7 | 48 | 35 | 26 | 21 | 41 | 58 | 69 | 478 |

# මගී සේවා (කටුනායක) කාර්යාංශය

හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුල මගී සේවා කාර්යාංශය ආදායම් හා සේවා පර්ෂදය ඇතුලත ක්‍රියාත්මක වේ. වර්තමානයේදී මෙම අංශය එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. නි.රේ.අ. තනතුරට පහළ තනතුරේ තවත් නිලධාරී කණ්ඩායමක් සේවා මුර ක්‍රමයට බ.ජා.ගු. තොටුපොලේ රාජකාරි ඉටු කරමින් දවසේ පැය 24 පුරාම රාජකාරි ආවරණය කරනු ලබයි.

මගී සේවා අංශය ගුවන් භාණ්ඩ ප්‍රදේශය හැර බ.ජා.ගු. තොටුපොලේ පාලන / ආවේක්සණ කටයුතු භාරව ක්‍රියා කරන අතර බ.ජා.ගු. තොටුපොලේ සේවයේ යෙදී සිටින රේගු නිලධාරීන් පැමිණීමේ / පිටවීමේ පර්යන්ත වල දේශසීමා නිලධාරින් ලෙස කටයුතු කරයි.

මූලික ඉලක්කයන්

- ගුවන් මගී සංචලනය පහසු කිරීම
- රේගු ආඥා පනත හා අනෙකුත් අදාල නීති යටතේ පවරා දී ඇති නීති බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම
- ගුවන් සංචලන සම්බන්ධ දේශසීමා මෙහෙයුම් නියාමනය හා අධීක්ෂණය කිරීම
- ගුවන්යානා සංචලන පාලනයේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීම
- ආදායම් අහිමිවීම් / විදේශ විනිමය අහිමිවීම් අවම කිරීම, එවන් අවස්ථා හඳුනාගැනීම හා ඊට එරෙහි කඩිනම් පියවර ගැනීම
- ආරක්ෂක අමාත්‍යාංශය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සුවඳ විලවුන් සහ අන්තරායකර ඖෂධ පිළිබඳ අධිකාරිය පාලන දෙපාර්තමේන්තුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදී වෙනත් ආයතන හා අධිකාරි වලට අදාල පනත් හා රෙගුලාසි මගින් රේගුව වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන්තොටුපොල හා ගුවන් සේවා, නිරෝධායන දෙපාර්තමේන්තුව, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ආදී ගුවන් තොටුපොල පරිශ්‍රයේ පිහිටි අනෙකුත් රජයේ ආයතන සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගෙන යාම

මෙම කාර්යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ මට්ටමේ විවිධ තනතුරු දරන නිලධාරීන් විසින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගින්ගේ හා ඔවුන්ගේ ගමන් බෑග වල සංචලනය පහසු කිරීම
2. බ.ජා.ගු. තොටුපොලේ ප්‍රභූ ගමන් බිමන් පහසු කිරීම
3. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ඉන් පිටවන ගුවන් යානා හා ඒවායේ කාර්යමණ්ඩල සැලසුම් කිරීම
4. මගී ගමන් බෑග සඳහා තීරුබදු රහිත ගමන් බෑග දීමනාව ප්‍රදානය කිරීම හා අධීක්ෂණය සහ එවන් පහසුකම් අපහරණය කිරීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම
5. ATA කාඩ්පත්, ඇපකර හා විශේෂ තැන්පතු මත භාණ්ඩ මුදා හැරීම
6. රේගුව / ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් අනුමත කරන ලද මැණික් / ස්වර්ණාභරණ පාර්සල් හැසිරවීම
7. රට තුළට පැමිණෙන / ඉන් පිටවන මගීන්ගේ විදේශ මුදල් ප්‍රකාශ පරීක්ෂා කිරීම හා අනුමත කිරීම
8. මගියා පිට වූ පසු ඔහු විසින් රැගෙන නොගිය බෑග ඇටෝර්නි බලපත්‍ර සහිත බලයලත් පුද්ගලයෙකු හට ඉතිරි ගමන් බෑග දීමනාව ලබා දීම
9. සැකසහිත අවස්ථාවක හෝ අවශ්‍ය වෙනත් අවස්ථාවක හිමිකරුවන් නොමැති බෑග පරීක්ෂා කිරීම
10. අවශ්‍ය විටකදී පුද්ගලයින් පරීක්ෂා කිරීම
11. වැරදි අනාවරණය කරගැනීම විමර්ශනයන් සිදු කිරීම හා අනාවරණය කොටගත් රේගු සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීම
12. රටින් පිටතට යන ගුවන් යානා සඳහා නිෂ්කාශන නිකුත් කිරීම
13. වාණිජ අන්දමේ භාණ්ඩ රැගෙන එන මගීන්ගෙන් තීරුබදු හා අනෙකුත් බදු අය කර ගැනීම

## 2012 වසරේ කාර්යසාධනය

**අ. සංචලනය පහසු කිරීම - රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගීන් හා ඔවුන්ගේ ගමන් බෑග**

2012 වසරේ සංඛ්‍යාලේඛන වලට අනුව, පසුගිය වසරට සාපේක්ෂව මගී ගමන් වල කැපී පෙනෙන වර්ධනයක් 2012 වසර තුළ අත්පත් කරගෙන තිබේ. පසුගිය වසර තුළ මගීන් මිලියන 3.2 ක් රට තුළට පැමිණ ඇති අතර මිලියන 3.3 ක් රටින් පිටතට ගොස් තිබේ.

මෙම මගීන් ශ්‍රී ලාංකිකයන්, වෙනත් ජාතින්ට අයත් සංචාරකයින්, සංක්‍රාන්ති මගීන්, ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන්, ශ්‍රී ලංකා රජයේ හා වෙනත් රටවල දූත පිරිස්, ජාත්‍යන්තර ව්‍යාපාරිකයන්, වෘත්තිකයන්, ක්‍රීඩකයන් ආදී ලෙස කාණ්ඩ කළ හැකිය. පහසු කිරීම් හා වෙනත් සේවාවන් ඒ ඒ කාණ්ඩවලට අවශ්‍ය වන පරිදි සපයා දෙන ලදී.

**ආ. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පරිසර විද්‍යාත්මක බැඳියාවන් ආරක්ෂා කිරීම**

ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පරිසර විද්‍යාත්මක බැඳියාවන්ට හානි සිදුවන ආකාරයේ කටයුතු කළ ඇතැම් සංවිධානාත්මක කණ්ඩායම් හා පුද්ගලයින්ගේ එකී ප්‍රයත්නයන් සාර්ථකව ව්‍යර්ථ කිරීමට මගී සේවා කාර්යාංශය සමත් වී ඇත.

රටේ ඇති ඉහළ ශාඛ හා සත්ව විශේෂ විවිධත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්ව දර්ශකයේ ඉහළම ස්ථානයක් හිමි කර ගන්නා රටක් වන අතර වටිනාකම තක්සේරු කළ නොහැකි ජාන සම්පත් ඇති රටක් ලෙසද එය ලොව තුළ සුවිශේෂී ස්ථානයක් ගනී.

රටේ ඉතිහාසය හා සංස්කෘතික උරුමය පිරික්සීමේදී පුරා විද්‍යාත්මක වටිනාකම මිළ කළ නොහැකි භාණ්ඩද එහි හමුව ඇත. මෙවන් ජාතික වටිනාකමක් සහිත භාණ්ඩ ජාවාරම් කිරීමට මේ වන විට ජාත්‍යන්තර ජාවාරම්කරුවන් කටයුතු කරමින් සිටින හෙයින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ මගීන්ගේ ගමන්මළු පිළිබඳ විශේෂයෙන් විමසිලිමත් වෙමින් එකී භාණ්ඩ විවිධ ස්වරූපයන්ගෙන් රටින් පිටමං කිරීම වැළැක්වීමට ගුවන් තොටුපොලේ දේශසීමා නිලධාරීන්ට හා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ රේගු නිලධාරීන් හට විශේෂ කාර්යභාරයක් පැවරේ.

එවන් ප්‍රයත්නයක් ව්‍යර්ථ කිරීමේ පියවරක් ලෙස, එවන් ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ පුහුණුවක් ලත් නිලධාරීන් පිටවීමේ පර්යන්ත ප්‍රදේශයේ සේවයේ යොදවා තිබේ.

රේගුව විසින් අනාවරණය කොටගත් ඉතා වැදගත් සිද්ධි කිහිපයක් පහත දැක්වේ.

- පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත කාසි රටින් පිටමං කිරීමට ගත් ප්‍රයත්නයන්

ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කාසි 278 ක් නීතිවිරෝධී ලෙස රටින් පිටතට ගෙන යාමට උත්සාහ කළ ශ්‍රී ලාංකික මගියකු පිටවීමේ පර්යන්තයේදී අත්අඩංගුවට ගැනීමට රේගු නිලධාරීන් සමත් විය. එම කාසි පුරා විද්‍යාත්මක වශයෙන් ඉතා වටිනා බව විමර්ෂණයේදී තහවුරු වූ අතර පරීක්ෂණයේදී ඒවා රාජසන්තක කරන ලදී.

- ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යාමට සූදානම් කොට තිබූ සඳුන් දැව කි.ග්‍රෑ. 128.9 ක් අනාවරණය කොට ගෙන ඒවා රාජසන්තක කරන ලදී.

**ඇ. නීතිවිරෝධී මත්ද්‍රව්‍ය / මත්කුඩු හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අනාවරණය කර ගැනීම**

නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගනිමින් සමාජය ආරක්ෂා කිරීම පිළිබඳව අප අපගේ විශේෂ අවධානය යොමු කොට ඇත්තෙමු. මේ පිළිබඳව විමසිලිමත්ව හිඳිමින් දේශසීමා කේන්ද්‍රයක් වන ගුවන් තොටුපොලේදී අපගේ බුද්ධි තොරතුරු නිලධාරීන් විසින් සාර්ථක මෙහෙයුම් අටක් සිදු කරන ලදී.

ඒවායින් සුවිශේෂී සිද්ධි ලෙස

- රු. මිලියන 20.1 ක වටිනාකමකින් යුත් මෙතම්ෆෙටමයින් ග්‍රෑම් 1340 ක් අත්අඩංගුවට ගැනීම
- රු. මිලියන 5.5 ක වටිනාකමකින් යුත් මෙතම්ෆෙටමයින් ග්‍රෑම් 370 ක් අත්අඩංගුවට ගැනීම හා
- කොකේන් කි.ග්‍රෑ. 3.3 ක් අත්අඩංගුවට ගැනීම දැක්විය හැකිය.

ඉහත සඳහන් අනාවරණයන් සඳහා ශ්‍රී ලංකා රේගුවේ මත්ද්‍රව්‍ය පිළිබඳ විශේෂ පුහුණුව ලත් නිලධාරීන්ගේ සහාය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල කාර්ය මණ්ඩලය වෙත ලැබුණි.

ඈ. තහනම් කරන ලද හා සීමා කරන ලද වෙනත් භාණ්ඩ සොයා ගැනීම

මෙම කාණ්ඩය යටතේ අත් අඩංගුවට ගත් භාණ්ඩ පහත දැක්වේ.

- ස්වාභාවික පළතුරු හා මල් වර්ග
- ජීවී පැලෑටි
- සතුන් (සුරතල් මසුන්)
- ආරක්ෂක අමාත්‍යාංශය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සුවඳ විලවුන් සහ අන්තරායකර ඖෂධ පිළිබඳ අධිකාරිය හා නිරෝධනය අනුමැතිය අවශ්‍ය සීමා කරන ලද ද්‍රව්‍ය

2012 වර්ෂය තුළ, එවන් ද්‍රව්‍ය අනුමැතියකින් තොරව ශ්‍රී ලංකාවට ගෙන එන අතර, ඒවා රාජසන්තක කිරීමට කටයුතු කරන ලදී.

## එ. මුදල් විශුද්ධිකරණය, රත්‍රන් මැණික් හා ස්වර්ණාභරණ ජවාරමට එරෙහි පියවර

රේගුවේ මුඛ්‍ය කාර්යයක් ලෙස, විදේශ මුදල්, රත්‍රන් හා වටිනා ගල් වර්ග ජාවාරම් කිරීමට ගත් උත්සාහයන් අනාවරණය කර ගන්නා ලදී. සිද්ධි 27 කදී රු. මිලියන 102ක වටිනාකමකින් යුත් විදේශ මුදල්, සිද්ධි 6 කදී රු. මිලියන 163ක වටිනාකමකින් යුත් රත්‍රන් හා සිද්ධි 4 කදී රු. මිලියන 3.9 ක වටිනාකමින් යුත් වටිනා ගල් වර්ග සොයාගැනීමට අපට හැකි විය.

# ආදායම් හා සේවා කාර්යාංශය (කටුනායක)

**හැඳින්වීම :**

ආදායම් හා සේවා කාර්යාංශය (කටුනායක) කටුනායක බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ගුවන් භාණ්ඩ පර්යන්තයේ ස්ථාපිත කොට ඇත.
නිසි ආදායම එකතු කර ගැනීම හා ආනයනය කරන ලද භාණ්ඩ දේශ සීමා පාලන රෙගුලාසි සුරකෙන ආකාරයට නිෂ්කාශනය කිරීම සහ රේගු ආඥාපනතේ හා වෙනත් අදාල නීති හා රෙගුලාසි වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම මෙම කාර්යාංශයේ වගකීම වේ.

ගුවන් භාණ්ඩ පර්යන්තයේ ප්‍රධානතම භාණ්ඩ නැව් හැසුරුම්කරු ලෙස කටයුතු කරන්නේ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයයි. අනෙකුත් නැව් භාණ්ඩ හැසුරුම්කරුවන් ලෙස හා නිහඬ රේගු පාලන යටතේ සේවා සැපයිම සඳහා නැව් භාණ්ඩ පර්යන්ත II හි ස්වයං හැසුරුම් සේවා සපයන්නා ලෙස SLFFA කාගෝ සර්විස් ලිමිටඩ් හා එක්ස්පෝ ඒවියේෂන් ලිමිටඩ් යන ආයතන කටයුතු කරයි. කුරියර් භාණ්ඩ, වේගවත්ව නිශ්කාෂණය කිරීමේ කටයුතු ඩීඑච්එල් හා කලම්බු කාගෝ එක්ස්ප්‍රස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් බැඳුම්කර ගුදම් වලදී සිදු කරයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. ගුවන් මගින් ආනයනය කරනු ලබන භාන්ඩ වලට අදාල රේගු තීරු බදු, සෙස් හා වෙනත් ගෙවීම් තක්සේරු කිරීම හා එකතු කිරීම
2. භාණ්ඩ ප්‍රකාශ හා නිෂ්කාශන බලපත්‍ර සකස් කිරීම
3. නිෂ්පාදන හා සේවා කාර්යාංශය යටතේ ක්‍රියාත්මක විවිධ අපනයන කේන්ද්‍රිය පහසුකරණ වැඩසටහන් යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාෂණය සඳහා අනුමැතිය ලබා දීම
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ව්‍යාපාර වෙත යැවීමට නියමිත ආයතනික භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම
5. ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය, කුරියර් භාණ්ඩ, විදේශ දූත මණ්ඩල භාණ්ඩ හා තැපැල් ආදී ආනයනික හදිසි භාණ්ඩ කඩිනමින් නිෂ්කාශනය කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වීම
6. නැවත පැමිණෙන මගින් විසින් කැටුව නොයන ලද බෑග කැටුව නොයන ලද මගී බෑග් ගබඩා වෙත මාරු කර යැවීම පහසු කිරීම
7. ආයෝජන මණ්ඩල, ආයෝජන මණ්ඩල නොවන, කුරියර් හා ඉක්මනින් නරක්වන භාණ්ඩ සඳහා අපනයන රේගු සටහන්කර සකස් කිරීම හා නිෂ්කාශන ලබා දීම

## 2012 වසරේ කාර්යසාධනය

### ගුවන් භාණ්ඩ කාර්යසාධනය

| විස්තරය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| රට තුළට පැමිණෙන ගුවන් ගමන් සංඛ්‍යාව | 15,017 | 18,856 | 20,206 |
| බාන ලද පැකේජ සංඛ්‍යාව | 2,564,433 | 2,715,340 | 3,189,413 |
| බෙදා හරින ලද පැකේජ සංඛ්‍යාව | 1,473,996 | 1,582,629 | 1,603,793 |
| ප්‍රතිනැව්ගත කරන ලද පැකේජ සංඛ්‍යාව | 1,013,392 | 1,259,958 | 1,653,927 |
| මාරු කර යවන ලද කැටුව නොයන ලද පැකේජ සංඛ්‍යාව | 15,508 | 16,831 | 20,949 |

**නිදහස් කිරීමේ මාධ්‍යය අනුව පැකේජ සංඛ්‍යාව**

2011 වසරේ පැකේජ සංඛ්‍යාව වන 2,715,340 ට සාපේක්ෂව 2012 වසරේ 17.45% ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත. එම කාලසීමාව තුළදී ගුවනේ සිට ගුවනට ප්‍රතිනැව්ගත කිරීම් 31.27% කින් ඉහළ ගොස් ඇත.

| නිදහස් කිරීමේ මාධ්‍යය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| තීරු බදු හා වෙයනත් ගාස්තු ගෙවන ලද | 80,144 | 85,209 | 77,215 |
| බැංකු ඇපකර | 808 | 777 | 140 |
| පුද්ගල ඇපකර | 802 | 729 | 307 |
| ප්‍රතිපාදන මත | 649 | 596 | 209 |
| Infac & TIEP බැඳුම්කර | 1,465 | 1,691 | 2,183 |
| ආයෝජන මණ්ඩලය | 87,973 | 93,097 | 101,561 |

ඉහත දත්තවලට අනුව බදු හා වෙනත් ගෙවීම් රහිත ආයෝජන මණ්ඩල පහසුකම් භාවිතය 4.7% කින් ඉහළ ගොස් ඇත. ඇපකර මත භාණ්ඩ නිදහස් කිරීම ක්‍රමිකව පහළ බැසීමක් නිරීක්ෂණය කළ හැක.

**බදු හා තීරු බදු එකතු කිරීම**

| විස්තරය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| ආනයන වල වටිනාකම (CIF) | 53,348,809,905 | 54,461,785,439 | 55,188,143,216 |
| භාණ්ඩ සංඛ්‍යාව (ආනයනය කරන ලද HS භාණ්ඩ) | 3,948 | 4,056 | 4,094 |
| රේගු තීරුබදු | 1,666,002,518 | 1,44,378,446 | 1,483,179,034 |
| ආනයන Cess | 501,149,481 | 526,659,816 | 547,700,492 |
| සුරාබදු තීරුබදු | 33,991,908 | 2,517,363 | 2,592,413 |
| සමාජ ආරක්ෂණ බද්ද | 24,654,180 | 23,011 | 9,510 |
| විශේෂ නි.බ. | 167,769 | 41,224,255 | 362,376,364 |
| වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද | 2,237,512,006 | 2,638,445,056 | 2,604,402,109 |
| අධිභාර | 112,287,686 | 35,136 | 21,450 |
| ජා.ගො.බ. | 1,403,923,778 | 1,230,439,139 | 1,215,543,863 |
| අ.එ.බ. | 3,509,612,651 | 2,831,843,809 | 2,990,508,962 |
| **එකතුව** | **9,489,301,977** | **8,712,566,031** | **9,206,334,197** |

පසුගිය වසරේ ආදායම වන රු. මිලියන 9,206 ට සාපේක්ෂව 2012 වසර තුළදී ආදායම 5.07; කින් ඉහළ ගොස් ඇත. ආනයනය කරන ලද භාණ්ඩ වල CIF අගය පසුගිය වසරට සාපේක්ෂව 27% කින් පමණ ඉහළ ගොස් ඇත.

**සාවද්‍ය ප්‍රකාශ හෝ විනිමය පාලන පහත උල්ලංඝන කිරීම් සම්බන්ධ සුවිශේෂී සිද්ධි**

| | |
|---|---:|
| I රාජසන්තක කිරීම් / දඩ | 38,002,992 |
| II A/E අය කර ගැනීම් | 24,461,329 |
| **එකතුව** | **62,464,321** |

## ආදායම් හා සේවා (ගුවන් භාණ්ඩ) කාර්යාංශය හරහා සිදු වූ ප්‍රධානතම ආනයන 10 - 2012

| NSD කේතය | HS විස්තරය | CIF වටිනාකම | මට්ටම Rank | රේගු ආනයන බද්ද % CID | සෙස් බද්ද % CESS | RIDL% | නිෂ්පාදන බද්ද Excise% | සමාජ ආරක්ෂණ බද්ද SRL% | විශේෂ භාණ්ඩ බද්ද SCL% | වරාය හා ගුවන්තොටුපළ බද්ද PAL% | ජාතිය ගොඩනැගීමේ බද්ද NBT% | එකතු අගය මත බද්ද VAT% | ආදායම |
|---|---|---:|---|---|---|---|---|---|---|---|---|---|---:|
| **85171220** | අනෙකුත් සෙලියුලර් ජංගම දුරකථන | 9,247,820,442 | 1 | - | - | - | - | - | - | 5 | 2 | - | 673,627,310 |
| **90189000** | වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය විද්‍යාවන්ට අවශ්‍ය උපකරණ හා මෙවලම් | 2,056,781,742 | 2 | - | - | - | - | - | - | 5 | 2 | - | 150,151,792 |
| **84733090** | අනෙකුත් කොටස් හා අමතර කොටස් 8471 | 1,742,898,843 | 3 | - | - | - | - | - | - | 5 | 2 | - | 126,971,468 |
| **84713090** | අතින් ගෙන යා හැකි ස්වයංක්‍රිය දත් සැකසුම් යන්ත්‍ර (=<10 kg), භාවිතා කරන ලද / නැවත අළුත්වැඩියා කරන ලද | 1,606,689,430 | 4 | - | - | - | - | - | - | 5 | 2 | - | 116,461,271 |
| **38220000** | සකස් කරන ලද රෝග විනිශ්චය හෝ විද්‍යාගාර ප්‍රතිකාරක යන්ත්‍ර | 1,589,215,905 | 5 | - | - | - | - | - | - | 5 | 5 | 12 | 334,932,389 |
| **85176290** | කටහඬ ආදිය ප්‍රතිග්‍රහණ, වෙනස්කිරීම් හෝ සම්ප්‍රේෂණය කිරීමේ හෝ ප්‍රතිජනනය කිරීමේ යන්ත්‍ර | 1,453,745,653 | 6 | - | - | - | - | - | - | 5 | 2 | - | 104,657,841 |
| **84717000** | ස්වංයක්‍රිය දත්ත සැකසුම් යන්ත්‍ර - ගබඩා කිරීමේ ඒකක | 1,116,429,751 | 7 | - | - | - | - | - | - | 5 | 2 | - | 81,328,427 |
| **84099900** | එන්ජින් සංකෝචනය, ජ්වලනය හෝ අභ්‍යන්තර දහනය සඳහා වන කොටස් | 1,043,042,003 | 8 | - | - | - | - | - | - | 5 | 2 | 12 | 213,510,198 |
| **84715090** | සකස් කිරීමේ ඒකක SHD 847141 & 847149, nes | 1,009,559,622 | 9 | - | - | - | - | - | - | 5 | 2 | - | 73,698,285 |
| **85176210** | ප්‍රතිග්‍රහණ උපකරණය සහිත හෝ රහිත සම්ප්‍රේෂණ උපකරණ | 935,666,228 | 10 | - | - | - | - | - | - | 5 | 2 | - | 68,291,876 |
| | **එකතුව** | | | | | | | | | | | | **1,943,630,857** |

2012 වසරේ HS භාන්ඩ වල ප්‍රධානතම ආනයන 10 ක් ඉහත වගුවේ දැක්වෙන අතර ඒවායින් බොහොමයක් අඩු බදු හා අඩු ගාස්තු සහිත ඒවා බව දැකිය හැකිය. ආනයනවල වටිනාකම ඉහළ ගියද බදු එකතු කර ගැනීම පහළ බැස ඇති බව විශේෂයෙන් සටහන් කළ යුතුය.

# සංයුක්ත සේවා පරිෂදය

# ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

**හැඳින්වීම**

ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු, තීරුබදු ගැටළු හා අන්තර් ජාතික කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

01. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය කරුණු වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම හා එම ප්‍රතිපත්ති අදාල අංශයන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියා පටිපාටි බවට පත් කිරීම, එකී තීරණ නිලධාරීන්ගේ දැන ගැනීමට හා අනුගත වීම සඳහා දැනුම් දීම.

02. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉල්ලා සිටි විට
    (i) ආර්ථික/වෙළඳ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සහ
    (ii) එම ප්‍රතිපත්ති තීරුබදු උපාය මාර්ග බවට පත් කිරීම යන කටයුතු වලට සහාය වීම

03. තීරු බදු උපාය මාර්ග මහජනතාවට හා නිලධාරීන්ට අවශ්‍ය පරිදි දැන ගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබා දීම.

04. ජාතික රේගු තීරුබදු නිරතුරුවම යාවත්කාලීන ලෙස පවත්වාගෙන යාම සහතික වීම, සියලුම තිරුබදු සම්බන්ධ විමසුම් වලට අවශ්‍ය කටයුතු කිරීම, තීරුබදු සම්බන්ධ ආරවුල් නිරාකරණය කිරීම

05. රේගු තොරතුරු මධ්‍යස්ථානය මගින් මහජනතාව වෙත ස්වයං අනුගතවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම

06. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ලෝක රේගු සංවිධානයේදී හා එහි ප්‍රාදේශීය සංවිධානවලදී හා අනෙකුත් අන්තර් ජාතික සංවිධාන (ලෝක රේගු සංවිධානය හා බහුවිධ පාරිසරික ගිවිසුම්) හා ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳ සංවිධාන වලදී නියෝජනය කිරීම

07. දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟාකරගනු පිණිස ලෝක රේගු සංවිධානයේ නිර්දේශ හා සාර්ථක අත්දැකීම් ප්‍රතිපත්ති හා ක්‍රියා පරිපාටි බවට පත් කිරීම මගින් එම සංවිධානයේ කටයුතු වලට අනුගත වීම.

**ප්‍රධාන කාර්යයන්**

01. දෙපාර්තමේන්තු නියෝග *(DOPLs)*මගින් මහා භාණ්ඩාගාරයේ තීරුබදු ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ක්‍රියාත්මක කිරීම
02. රේගුවේ ප්‍රතිපත්තිමය තීරණ දෙපාර්තමේන්තු නියෝග මගින් ක්‍රියාවට නැංවීම
03. ආනයන තීරුබදු මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීම
04. මහජනතාවගේ හා නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා ජාතික ආනයන තීරුබදු මාර්ගෝපදේශ සංග්‍රහය සංයුක්ත තැටි හා පොත් වශයෙන් එළි දැක්වීම
05. අවශ්‍ය වූ අවස්ථාවන්හිදි තීරු බදු ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා *HS* කේත ක්‍රමයේ උප බෙදීම් නිර්මාණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයට සහාය වීම
06. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

07. අදාල අංශයන්හි ප්‍රගතිය විමර්ශනය කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කිරීම

08. ලෝක රේගු සංවිධානය, ලෝක රේගු සංවිධානයේ ආසියා පැසිපික් කාර්යාලය, ලෝක වෙළඳ සංවිධානය, අනෙකුත් අන්තර්ජාතික සංවිධන හා රේගු පාලනාධිකාරීන් සමග ගනුදෙනු කිරීමේ අනෙකුත් අදාල කටයුතු පිළිබඳව සම්බන්ධ වන සම්බන්ධීකරණ ස්ථානය (*contact point*) ලෙස කටයුතු කිරීම

09. අනෙකුත් රේගු පාලනාධිකාරීන් සමග රේගු සහයෝගිතා හා අන්‍යොන්‍ය පරිපාලන සහයෝගිතා ගිවිසුම්වලට අදාල කටයුතු වලට මැදිහත් වීම

10. නිදහස් වෙළඳ ගිවිසුම් හා වරණීය වෙළඳ ගිවිසුම්වලට සම්බන්ධ කටයුතු වලට මැදිහත්වීම

11. නාමකරණ කමිටුව, වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව හා අනෙකුත් තාක්ෂණ කමිටුවලට අදාල ලේඛණ කටයුතු කිරීම හා අනෙකුත් තාක්ෂණ කමිටුවල කටයුතු සම්බන්ධීකරණය කිරීම

12. තීරුබදු වෙළඳාම හා නිශ්කාෂණ පරිපාටි ආදි කරුණුවලට අදාල පර්යේෂණ කටයුතු සිදු කිරීම

13. කාර්ය පරිපාටි අත්පොත සකස් කිරීම හා යාවත්කාලීන කිරීම

14. විනිමය හුවමාරු අනුපාතික දැන්වීම් සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීම

15. මහජන සම්බන්ධතා හා රේගු තොරතුරු මධ්‍යස්ථානයට අදාල කටයුතු සිදු කිරීම

16. වාර්ෂිකව ලෝක රේගු දින උත්සවයක් සංවිධානය කිරීම

**රේගු තීරුබදු අත්පොත**

සාම්ප්‍රදායිකව ශ්‍රී ලංකා රේගුවට අන්තර් ජාතික වෙළඳාමේදී පනවා ඇති සියලු බදු රැස් කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත. 2012 වර්ෂය තුල ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් රේගුව විසින් ආනයන බද්ද, අපනයන බද්ද, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද, ආනයන සෙස් බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු, ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද හා සමාජ වගකීම් බද්ද යන බදු මගින් ආදායම් රැස්කර ඇත. සමහර අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් අපනයන බදු හා ආනයන සෙස් බදු ගෙවිය යුතුවේ. ඊට අමතරව සමහර අත්‍යවශ්‍ය පරිභෝජන භාණ්ඩ සම්බන්ධව විශේෂ භාණ්ඩ බද්ද කාලානුරූපව පනවන ආකාරයට ගෙවිය යුතුය. මෙම විවිධ බදු නිසා රේගු තීරු බදුවල දැක්වෙන එක් එක් භාණ්ඩය සඳහා විවිධ බදු පැනවෙන අතර එය සංකීර්ණ ලේඛණයක් බවට පත්ව ඇත.

**දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ**

ප්‍රතිපත්තිමය තීරණයක් සංනිවේදනය කිරීමට අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එමෙන්ම පවත්නා ක්‍රියා පරිපාටින්හි වෙනසක් සිදු වූ විටද, නව ක්‍රියා පරිපාටි හඳුන්වාදීමට අවශ්‍ය වූ විටද, එසේ නැතහොත් ක්‍රියා පරිපාටි අත් පොතෙහි වෙනසක් සිදු වූ විටද මේ ආකාරයට දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තු චක්‍රලේඛ වැදගත් නිල ප්‍රවෘත්ති මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. අදාල අංශයන්හි ප්‍රතිපත්ති පිළිබඳ සංකල්ප බිහිවන අතර ඒවා ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට යොමු කෙරේ. අන්තර්ගතය පවත්නා චක්‍රලේඛ සමග අන්තර්ගතය හා ක්‍රියා පටිපාටි සසඳා නොගැලපීම් ඇත්දැයි පරීක්ෂා කොට අවසාන වශයෙන් එහි පෙළ සකස් කෙරේ. ඉන්පසු එම චක්‍රලේඛය නිල ස්වරූපයක් දරණ අතර නියමිත ආකෘතියට අනුව සැකසේ. එය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කිරීමෙන් පසුව මුද්‍රණය කොට බෙදා හැරේ. බෙදා හැරීමද ඇතුළුව මෙම සම්පූර්ණ ක්‍රියාවලිය කාලය වැයවන නීරස එකක් වුවද මෙම අංශය මෙකී චක්‍රලේඛ

ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට උත්සාහ ගනු ලබන්නේ එමගින් පළමුවෙන්ම ඉතා වැදගත් උපදෙස් කාර්ය මණ්ඩලයට නිකුත් කිරීම සඳහා චක්‍රලේඛ අවශ්‍ය වන බැවිණි.

ආදායම් ආරක්ෂණ නියෝග තවත් චක්‍රලේඛ විශේෂයක් වන අතර ඒවා සකස් කොට මුද්‍රණය කොට අවම කාලයක් තුල නිකුත් කළ යුතුවේ. (බොහෝ විට වැඩ කරන දිනය තුලම) මෙමගින් බදු හා අය බදු වල වෙනස්කම් සන්නිවේදනය කරනු ලබන අතර එමගින් නිලධාරීන්ට ඒවා බලාත්මක වන දිනයේ හා වේලාවේ සිටම නව අනුපාතයන්ට අනුව රැස්කර ගැනීමට ඉඩ ලැබේ. මෙකී වෙනස්කම් මහා භාණ්ඩාගාරයන් නිකුත් වන අතර මෙම නියෝග බදුකරණයේ වැදගත් කොටසක් නියෝජනය කරයි.

**විනිමය අනුපාතික චක්‍රලේඛ**

සියලුම ආනයනයන්හි වටිනාකම් විදේශ විනිමය අනුපාතිකයන්ගෙන් ප්‍රකාශයට පත් වෙන අතර ඒවා ශ්‍රී ලංකා රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමට රේගුවට සිදුවේ. බැංකු හා මුදල් මාරු කරන්නන් විසින් භාවිත කෙරෙන නිරන්තරයෙන් වෙනස්වන (පාවෙන) විනිමය අනුපාතික මෙන් නොව ශ්‍රී ලංකා රේගුව වැඩකරන සතියක් සඳහා බලපවත්වන විනිමය අනුපාතික භාවිත කරයි. සෑම සති අන්තයකම විනිමය හුවමාරු අනුපාතික වෙනස් වන අතර ඊළඟ සඳුදා සිට නව අනුපාතික බලපවත්වයි. එකී අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකුව මගින් තීරණය කරන අතර සතිපතා ඒවා ප්‍රසිද්ධියට පත් කර දැනුම් දෙනු ලබනුයේ ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය මගිනි. මෙම චක්‍රලේඛය බදුකරණයේ නියුක්ත වෙළඳ ව්‍යාපාරිකයන්ට හා නිලධාරින්ට අත්‍යවශ්‍ය මග පෙන්වන ලේඛනයකි.

**අන්තර් ජාතික කටයුතු**

මෙම අංශයේ නමෙහි අන්තර්ගත නොවූවද ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශයට රේගු කටයුතු සම්බන්ධ අන්තර් ජාතික කටයුතු පිළිබඳ වගකීමද පැවරි ඇත. මේ යටතට වැටෙන ප්‍රධාන කර්තව්‍යයක් වන්නේ ලෝක රේගු සංවිධානය හා එහි ආසියා පැසිපික් කලාපීය කාර්යාලය සමග අදහස් හුවමාරු කර ගැනීමට කටයුතු කිරීමයි. ලෝක රේගු සංවිධානය නිරන්තරයෙන් නිවේදන නිකුත් කරන අතර ඒවාට සුදුසු ලෙස ප්‍රතිචාර දැක්විය යුතුවේ. ශ්‍රී ලංකා රේගුවට වර්ගීකරණ ගැටළු විසඳා ගැනීමට අපහසු වූ කල්හි එවන් ආරවුල් සහගත තත්ත්වයන් ලෝක රේගු සංවිධානය වෙත යොමු කරනු ලැබේ. HS නාමකරණයට අදාල වෙනස්කම් ලෝක රේගු සංවිධානය විසින් දැනුම් දෙන අතර මෙම අංශය ඒවාට අනුගත වීමට කටයුතු කරනු ලබයි.

ඊට අමතරව, ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය, කලාපීය ද්විපාර්ශවික හා බහුපාර්ශවික වෙළඳ ගිවිසුම් වලට සම්බන්ධ අන්‍යොන්‍ය රේගු සහයෝගිතාවට අදාල වගන්ති පිළිබඳ කටයුතු කිරීමේ වගකීමද දරයි. දැනට ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරු වන අතර පාකිස්ථානය දෙවන විශාලතම හවුල්කරු වේ. ඉන්දු ශ්‍රී ලංකා ද්විපාර්ශවික රේගු අන්‍යොන්‍ය සහයෝගිතා ක්‍රියාකාරකම් හොඳින් ස්ථාපිත වූ යෝජනා ක්‍රමයක් බවට පත්ව ඇත. පාකිස්ථාන රේගුව සමග අන්‍යොන්‍ය සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා වන එකී යන්ත්‍රණය මේ වන විට නිසි ආකාරයට වර්ධනය විමට පටන් ගත්තා පමණි. පිළිවෙලින් ඉන්දියාව හා පාකිස්ථානය සමග වන ද්විපාර්ශවික ගිවිසුම්වලට අමතරව ශ්‍රී ලංකාව, ඉරානය, ඉරාකය, පකිස්ථානය හා මෙක්සිකෝව ආදී රටවල් සමග රේගු සහයෝගිතාවන් ගොඩ නගා ගැනීමට ඇති හැකියාවන් සම්බන්ධව ක්‍රියාකාරි ලෙස සොයා බලමින් සිටී.

**ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්**

| | |
|---|---|
| APTA | ආසියා ශාන්තිකර වෙළඳුන්ගේ ගිවිසුම (මීට පෙර බැංකොක් ගිවිසුම) |
| ISFTA | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම |
| MAA | රේගු කටයුතුවලදී අන්‍යෝන්‍ය පරිපාලන සහාය සඳහා වූ සාක් (SAARC) ගිවිසුම |
| MAA | රේගු කටයුතුවලදී අන්‍යෝන්‍ය පරිපාලන සහාය සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය 2003 -ජුනි 27 |
| MAA | රේගු කටයුතුවලදී අන්‍යෝන්‍ය පරිපාලන සහාය සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය. රේගු වැරදි වැළැක්වීම, විමර්ෂණය කිරීම හා මැඩපැවැත්වීම සඳහා - නයිරෝබි 1997 ජුනි 09 |
| SL-MX | ශ්‍රී ලංකාව සහ මෙක්සිකෝව අතර රේගු කටයුතුවලදී අන්‍යෝන්‍ය පරිපාලන සහාය පිළිබඳ ගිවිසුම |
| MAA | ක්‍රමානුකූල රේගු භාවිතය පිළිබඳ වන අවබෝධතා පරිපාලන සහයෝගිතාව පිළිබඳ වන ගිවිසුම |
| SL-IT | රේගු කටයුතු වලදී පරිපාලන සහාය සහ සහයෝගිතාවය පිළිබඳ ශ්‍රී ලංකාව හා ඉතාලි සමූහාණ්ඩුව අතර ගිවිසුම |
| SL-PAK | රේගු කටයුතු වලදී අන්‍යෝන්‍ය පරිපාලන හා සහයෝගිතාවය පිළිබඳ පකිස්තාන ඉස්ලාමීය සමූහාන්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ද්වි පාර්ශ්වීය ගිවිසුම් කෙටුම්පත |
| SL-IR | රේගු කටයුතු වලදී අන්‍යෝන්‍ය පරිපාලන සහාය පිළිබඳ ශ්‍රී ලංකාව හා ඉරානය අතර ද්වි පාර්ශ්වික ගිවිසුම |
| SAARC | සාක් SAARC කලාපීය දුම්රිය සේවා හා මෝටර් වාහන ගිවිසුම් කෙටුම්පත |
| SAFTA | දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම |
| SAPTA | දකුණු ආසියා වරණීය වෙළඳ ගිවිසුම |
| SL-Sg | සිංගප්පූරුව සමග වූ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම (2003)(CEPASS) |
| SL-EC | යුරෝපා සංගමය - ශ්‍රී ලංකාව - යු.ස. සමඟ ශ්‍රී ලංකාව පවත්වන වෙළඳම පිළිබඳ ඒකාබද්ධ අධ්‍යයනය |
| SL-IN | ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ඇති පූ.ආ.හ.ලි. (CEPA) පිළිබඳ අන්තර් ආයතන කමිටුවේ 8 වන රැස්වීමේ කාර්ය සටහන් කෙටුම්පත |
| SL-IN | ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පූර්ණ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම (පූ.ආ.හ.ගි.) |
| SL-Ir | ශ්‍රී ලංකාව හා ඉරානය අතර ද්විපාර්ශ්වික ගිවිසුම |
| SL-Ir | ශ්‍රී ලංකාව හා ඉරානය අතර සහයෝගිතාවය පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභාවේ 9 වන සැසිවාරය - 2010 සැප්තැම්බර් 13-15 දක්වා කොළඹදී |
| SL-Ir | ඉන්දියාව සමග ආර්ථික සහයෝගිතාවය |
| SL-Ir | ශ්‍රී ලංකා ඉරාන රේගු සහයෝගිතාවය - |
| SL-PAK | ශ්‍රී ලංකා පාකිස්තානු නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ තාක්ෂණික මට්ටමේ සාකච්ඡා 2002 - සැප්තැම්බර් |
| SL-PAK | ආර්ථික සහයෝගිතාවය සඳහා වූ ශ්‍රී ලංකා පාකිස්ථාන ඒකාබද්ධ කොමිෂන් සභාව |
| SL-PAK | ශ්‍රී ලංකා - පාකිස්තාන ඒකාබද්ධ ආර්ථික සහයෝගිතාවය |
| SL-PAK | පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම |
| SL-Qat | ශ්‍රී ලංකාව හා කටාර් රාජ්‍යය අතර රේගු වැරදි මැඩපැවැත්වීමේ විමර්ශනය කිරීමේ හා බලාත්මක කිරීමේ නීතිය |
| SL-Tur | විශේෂ වශයෙන් ත්‍රස්තවාදය හා සංවිධානාත්මක වශයෙන් සිදුවන දරුණු අපරාධ මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව හා තුර්කිය අතර වන සහයෝගිතා ගිවිසුම් කෙටුම්පත |
| SL-UK | ශ්‍රී ලංකාවේ හා යුක්රේනයේ කැබිනට් අමාත්‍යවරුන් අතර ගිවිසුම |
| SL-USA | ශ්‍රී ලංකා - ඇමෙරිකා වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම (TIFA) |
| SL-USA | වෙළඳ හා ආයේජන රාමු ගිවිසුමේ (TIFA) 8 වන ඒකාබද්ධ සභා රැස්වීම ( ශ්‍රී ලංකාව හා ඇමෙරිකා එක්සත් ජනපදය අතර) |
| SL-Vt | වියට්නාමය හා ශ්‍රී ලංකාව අතර යෝජිත වෙළඳ ගිවිසුම |

**දෙපාර්තමේන්තුමය තාක්ෂණික කමිටුව**

ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට ඉතා වැදගත් තාක්ෂණික කමිටු දෙකක් සඳහා ලේඛණ කටයුතු හා සේවා පහසුකම් සැපයීමට සිදුව තිබේ. ඒවානම්

I. රේගු නාමකරණ හා වර්ගීකරණ කමිටුව
(මෙය රේගු නාමාවලි කමිටුව ලෙසද හැඳින් වේ) සහ
II. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කමිටුව

සෑම අඟහරුවාදාම රැස් වන රේගු නාමාවලි කමිටුව වර්ගීකරණයට අදාල ගැටළු හා ආරවුල් සම්බන්ධව කටයුතු කරන අතර වෙළඳාම ගැන පහසුකම් සැලසීමේ කමිටුව වෙත වෙළඳාමට පහසුකම් සැලසීමට, අදාලව සංශෝධිත කියෝතෝ සම්මුතියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීමද දෙපාර්තමේන්තුවේ අනෙකුත් වෙළඳාමට පහසුකම් සැලසීම පිළිබඳ ගැටලු පිළිබඳව කටයුතු කිරීමේ වගකීමද පැවරී ඇත.

**සැලසුම්කරණයට අදාල කටයුතු**

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සමාලෝචනය කිරීම හා ඊළඟ වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්ම තීරණය කිරීමද මෙම අංශයට පැවරී ඇති වගකීම් දෙකක් වේ. දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇති ප්‍රධාන කාර්යයන්හි ප්‍රගති සමාලෝචනය කිරීමද වාර්ෂික කාර්ය සාධන සැලැස්ම සකස් කිරීමද පැවරී ඇති තවත් කාර්යයන් වේ.

මෙම අංශය මගින් සිදුකරනු ලබන තවත් වැදගත් කාර්යයක් වන්නේ ජාතික හා අන්තර් ජාතික සංවිධාන සමග එළඹෙන අවබෝධතා ගිවිසුම් වලට (උදාහරණ වශයෙන් අනෙකුත් රටවල රේගු සමග) අදාල සියලු කටයුතු සිදු කිරීමයි.

පර්යේෂණ කටයුතු

මෙම අංශය අනිකුත් අංශ වලින් මාසිකව ප්‍රගති වාර්තා ලබා ගන්නා අතර, පරිපාලනයට අවශ්‍ය පරිදි පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි.

**2012** කාර්ය සාධනය

2012 වර්ෂය තුල මෙම අංශය විනිමය අනුපාත වලට අදාල චක්‍රලේඛ 52ක් හා දෙපාර්තමේන්තු නියෝග 56 ක් නිකුත් කර ඇත.

2012 වර්ෂය තුල නිකුත් කරන ලද චක්‍රලේඛ වල සංයුතිය මෙසේය.

| | |
|---|---|
| • වැට් සංශෝධන | 01 |
| • නිෂ්පාදන බදු සංශෝධන | 05 |
| • වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු සංශෝධන | 02 |
| • විශේෂ භාණ්ඩ බදු සංශෝධන | 10 |
| • සෙස් බදු සංශෝධන | 05 |
| • ආදායම් ආරක්ෂණ නියෝග | 04 |
| • ජාතිය ගොඩනැගීමේ බදු සංශෝධන | 02 |

මීට අමතරව, පිටරට හා දේශීයව වෙළඳ හා අනෙකුත් සාකච්ඡා විශාල සංඛ්‍යාවකට අධ්‍යක්ෂවරයා හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයා නියෝජනය කරමින් සහභාගී වී ඇත.

## 2012 වර්ෂය තුල නිකුත් කල දෙපාර්තමේන්තු නියෝග

| දිනය | දෙපාර්තමේන්තු චක්‍රලේඛ | අදාළ අංශය | විස්තරය |
|---|---|---|---|
| 03.01.2012 | 572 C | | අවදානම් කළමනාකරණ කමිටුව (සංශෝධනය) |
| 13.01.2012 | 798 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධනයන් |
| 08.02.2012 | 797A | ආනයන | DOPL 797 ට දෝෂ<br>(ශ්‍රී ලංකා කේටරින් පෞද්ගලික සමාගමේ ආනයනයන් සඳහා අගය එකතු කරන ලද බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, CESS හා රේගු තීරු බදු නිදහස් කිරීම්) |
| 01.03.2012 | 799 | ආනයන | 1989 අංක 30 දරණ සුරාබදු (විශේෂ විධිවිධාන) පනතේ 3(c) වගන්තිය යටතේ නියෝගය |
| 16.03.2012 | 800 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධනයක් (අර්තාපල් 0701.90) |
| 21.03.2012 | 801 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත සඳහා සංශෝධන |
| 02.04.2012 | 802 | ආනයන | සුරාබදු තීරුබදු (විශේෂ විධිවිධාන) අනුපාත හා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා සඳහා ආනුෂංගික සංශෝධන RP001/2012 |
| 10.04.2012 | 803 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධනයක් |
| 20.04.2012 | 804 | ආනයන | ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා සඳහා වෙනස් කිරීම් |
| 26.04.2012 | 805 | ආනයන | 1989 අංක 13 දරණ සුරාබදු (විශේෂ විධිවිධාන) පනත - 3 (c) වගන්තිය යටතේ නියෝගය |
| 04.05.2012 | 806 | ආනයන | කිරි පිටි සඳහා වන ආනයන තීරු බදු ඉවත් කිරීම HS : 0402 .10, 0402.21 හා 0402.29 |
| 11.05.2012 | 807 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධන |
| 14.05.2012 | 808 | ආනයන | රේගු තක්සේරු රෙගුලාසි 2012 හි අංක 1 (ආනයනකරු සිය භාණ්ඩ සිය යාත්‍රාවෙන්ම ආනයනය කිරීමේදී රේගු තක්සේරු සඳහා ප්‍රවාහන ගාස්තු තීරණය කිරීම) |
| 14.05.2012 | 809 | ආනයන | රේගු තක්සේරු රෙගුලාසි 2012 හි අංක 02 (අන්ත සැකසුම් උපකරණ සඳහා වන මෘදුකාංග ප්‍රවාහනය කෙරෙන වාහක මාධ්‍යය තක්සේරු කිරීම) |
| 15.06.2012 | 810 | ආනයන | ගුවන් තොටුපොලේදී මැණික් පාර්සල් නිෂ්කාෂණය සරල කිරීමේ මූලික උපදෙස් |
| 15.06.2012 | 811 | අපනයන | HS : 25.16 යටතේ අපනයන හා කලුගල් ඒකක මත නව සෙස් බදු පැනවීම |
| 15.06.2012 | 812 | ආනයන | 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තිය යටතේ නියෝගය |
| 26.06.2012 | 813 | ආනයන | පොලික්ලෝරිනේටඩ් බයිෆෙනිල්ස් (BPCS) මගින් දූෂිත වූ නිෂ්පාදන |
| 22.06.2012 | 814 | ආනයන | HS ශීර්ෂ 71.02 හා 71.03 යටතේ ගැනෙන මැණික් හා වටිනා ගල් වර්ග මත ඇති ජාතිය ගොඩනැගීමේ බද්ධ ඉවත් කිරීම |

| | | | |
|---|---|---|---|
| 22.06.2012 | 815 | ආනයන | සීනි මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සඳහා වන සංශෝධන |
| 27.06.2012 | 816 | ආනයන | අපනයන සංවර්ධන CESS අනුපාත සංශෝධනය කිරීම (1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගය) |
| 28.06.2012 | 815 A | ආනයන | 2012.06.20 සිට එක් මසකට සීනි මත පනවා ඇති වි.වෙ.බ. සඳහා සංශෝධන |
| 02.07.2012 | 562 C | පොදු | තාක්ෂණික කමිටුවේ සාමාජික ලැයිස්තුවට සංශෝධන |
| 05.07.2012 | 810 A | ආනයන (ගුවන්) | ගුවන්තොටුපොලේදී මැණික් පාර්සල් නිෂ්කාෂණය සරල කිරීමේ උපදෙස් |
| 06.07.2012 | 817 | ආනයන | 1969 අංක 01 (HS : 10.06) දරණ ආනයන සහ අපනයන පනත යටතේ සාදන ලද නියෝග |
| 09.07.2012 | 816 A | ආනයන | අපනයන සංවර්ධන CESS බදු සංශෝධනය (1979 අංක 40 දරණ ශ්‍රී.ලං.අ.ස. පනතේ 14 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගය) මෙම DOPL 16 අවලංගු කෙරේ. |
| 16.07.2012 | 818 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධන |
| 16.07.2012 | 737A | ආනයන | මෝටර් රථ සඳහා රේගු වටිනාකම් තීරණය කිරීම |
| 19.07.2012 | 819 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධන |
| 19.07.2012 | 820 | ආනයන | 1962 අංක 19 දරණ ආදායම් ආරක්ෂණ පනතට සංශෝධන (HI : 2007.10) |
| 13.08.2012 | 821 | ආනයන | විශේෂ වෙළඳ බදු සඳහා සංශෝධන (HI : 0701.90 - වෙනත් අර්තාපල් හා 0703.10.20 - බී ලූණු) |
| 27.08.2012 | 822 | ආනයන | 2008 අංක 14 දරණ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ප්‍රදානය කෙරෙන බදු සහන / නිදහස් කිරීම් |
| 04.09.2012 | 823 | ආනයන | 1979 අංක 40 දරණ ශ්‍රී.ල.අ.ස. ප. 14 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගය (අපනයන සංවර්ධන CESS ගාස්තු සංශෝධනය) |
| 19.09.2012 | 824 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධන |
| 05.10.2012 | 825 | ආනයන | සිගරට් මත පනවා ඇති සුරාබදු තීරුබදු සඳහා සංශෝධන |
| 26.10.2012 | 826 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධන |
| 30.10.2012 | 827 | ආනයන | CARNET පද්ධතියේ යටතේ මෝටර් රථ ආනයනය සඳහා අමුත්තන්ගේ තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම |
| 08.11.2012 | 828 | ආනයන | විශේෂ වෙළඳභාණ්ඩ බදු අයවැය - 2012 |
| 08.11.2012 | 829 | ආනයන | සුරාබදු තීරුබදු අයවැය සංශෝධනය - 2013 |
| 08.11.2012 | 830 | ආනයන | RPO 03/2013 - බදු අනුපාත වෙනස්වීම් |
| 08.11.2012 | 831 | ආනයන | 2013 අයවැය - ආනයන මත පනවා ඇති CESS අනුපාත සංශෝධනය |
| 08.11.2012 | 832 | අපනයන | 2013 අයවැය - අපනයන මත පනවා ඇති CESS අනුපාත සංශෝධනය |
| 08.11.2012 | 833 | ආනයන | 2013 අයවැය - කිරිපිටි මත පනවා ඇති ආනයන තීරුබදු ඉවත් කිරීම |
| 08.11.2012 | 831A | ආනයන | 2013අයවැය - ආනයන CESS නිවැරදි කිරීම |

| | | | |
|---|---|---|---|
| 08.11.2012 | 834 | ආනයන | 2013 අයවැය - වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු |
| 14.11.2012 | 830A | ආනයන | RPO 03/2012 දෝෂ |
| 23.11.2012 | 830B | ආනයන | RPO 03/2012 දෝෂ |
| 23.11.2012 | 835 | ආනයන | ඉවත් කිරීම් හා සහන ලැයිස්තුව |
| 29.11.2012 | 836 | ආනයන | e - රේගු - නව CusDec |
| 07.12.2012 | 836A | ආනයන | DOPL 836 ට නිවැරදි කිරීම |
| 06.12.2012 | 837 | ආනයන | ආනයනය කරනු ලබන තීන්ත වල අඩංගු වන තඹ ප්‍රමාණය පිළිබඳ රෙගුලාසි |
| 10.12.2012 | 838 | ආනයන | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සඳහා සංශෝධන |
| 14.12.2012 | 562 D | NC | NC කමිටුව ( නාමකරණ හා වර්ගීකරණ කමිටුව) |
| 21.12.2012 | 839 | ආනයන | වැට් බදු සඳහා සංශෝධන |
| 21.12.2012 | 840 | ආනයන | 2013 අයවැය - ජා.ගො.බ. නිදහස් කිරීම |
| 21.12.2012 | 839A | ආනයන | වැට් බදු සඳහා සංශෝධන |

**ඇති කරන ලද දෙපාර්තමේන්තුමය නව විෂය ගොනු**

| දිනය | PL අංකය | විස්තරය |
|---|---|---|
| 09.02.2012 | 697 | රුසියානු සමූහාණ්ඩුවේ යුධ නැව් (නාවික අනු කොටස්) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවතා තැබීම පිළිබඳ සරල කරන ලද ක්‍රියාපටිපාටි පිළිබඳ ශ්‍රී ලංකාව හා රුසියාව අතර අවබෝධතා ගිවිසුම් කෙටුම්පත |
| 28.02.2012 | 698 | ආනයනය කරන ලද කිරුම් හා මිනුම් උපකරණ රේගුවෙන් නිදහස් කිරීම |
| 02.03.2012 | 699 | තෝරාගත් ආසියාතික රටවල PCB කළමනාකරණය පිළිබඳ තොරතුරු හුවමාරුව |
| 18.04.2012 | 700 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය (1919) - ICTA |
| 04.05.2012 | 701 | 'හම්බන්තොට වරාය' |
| 14.05.2012 | 702 | ආසියා ශාන්තිකර වෙළඳාම පහසු කිරීමේ පෝරමය පිළිබඳ උපදේශක කමිටුව (APFT)-2012 |
| 15.05.2012 | 703 | රේගු තක්සේරු රෙගුලාසි |
| 12.06.2012 | 704 | ගුවන් තොටුපොළේදී මැණික් පාර්සල් නිෂ්කාෂණය පහසු කිරීම |
| 15.06.2012 | 705 | වෙළඳ කේන්ද්‍රය |
| 27.07.2012 | 706 | ශ්‍රී ලංකා රේගුවේ විදේශීය මුදල් ගිණුම |
| 14.08.2012 | 707 | ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති යටතේ ලබා දුන් සහන |
| 24.08.2012 | 708 | ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ජාත්‍යන්තර සබඳතා කමිටුව |
| 28.09.2012 | 709 | වෙළඳ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ ශ්‍රී ලංකා - චීන ඒකාබද්ධ කොමිසම |
| 08.11.2012 | 710 | HS 2012 අනුවර්තනය ක්‍රියාත්මක කිරීම |
| 12.11.2012 | 711 | AsyCuDA World හරහා විද්‍යුත් රේගු බිල්පත් සැකසීම |
| 29.11.2012 | 712 | ශ්‍රී ලංකා රේගුව (SLC) හා මාලදිවයින් රේගු සේවාව (MCS) ජාලගත කිරීමේ යෝජනාව |

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

*හැඳින්වීම*

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණ වන්නේ පැය විසි හතර පුරාම නිරන්තරයෙන් දෙපාර්තමේන්තුව වෙත රේගු ප්‍රකාශන පිළිබඳ කටයුතු කිරීමට හා අන්තර්ජාල සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණ, සේවා හා පහසුකරණයන් ලබා දීමයි.රේගු ප්‍රකාශන සම්බන්දව කටයතු කිරීමේ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් යාන්ත්‍රිකරණ කිරීමෙන් යහපත් රේගු පරිපාලනයක් සඳහා වේගවත් ගුණාත්මක තොරතුරු පද්ධති ඵලදායි හා ප්‍රථිපලදායි හා කාර්යක්ෂම ලෙස ලබාදීම සහතික කරයි. මෙම අංශය මේ වන විට වඩා ඵලදායි හා බිඳවැටීම වලින් තොර තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු ප්‍රකාශන හා ඊට අදාල සහය ලියකිය විලි ඉලෙක්ට්‍රොනිකව ගබඩාකර තැබීමටත් අවශ්‍ය කටයුතු කරමින් සිටියි.

**ප්‍රධාන කාර්යයන්**

01 ස්වයංක්‍රීයකරණය තුලින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය වීම.

02 පද්ධති ජාලය, පරිගණක හා දත්ත පදනම් සාර්ථක ලෙස නඩත්තු කිරිම

03 රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා සහායක ආයතන වලට අවශ්‍ය වේලාවට නිවැරදි තොරතුරු වාර්තා ලබා දීම

04 ගෝලීය වැඩි දියුණු කිරීම් වලට සාරානුකූලව ඇගයීම් සිදුකිරීම හා පවත්නා පද්ධති යාවත්කාලීන කිරිම; "ආසිකුඩා" භාණ්ඩ පාලන පද්ධතිය, රථවාහන පාලන පද්ධතිය හා “තිනෙත්” පද්ධතිය

05 අධීක්ෂණ මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමග වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම.

06 දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම හා ඒවායේ මෙහෙයුම් වලට අදාල පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම

**2012 වර්ෂයේ කාර්ය සාධනය**

- ඍජු වෙළඳ අතුරු මාරු )**DTI)** පහසුකම හරහා තැරැව්කරුවන් හට අසිකුඩා පද්ධතිය (**AsyCuda World System**) සපයා දීම
- තේ අපනයනකරුවන්ට හා තේ මණ්ඩලයට බ්ලෙන්ඩ් ෂීට් පහසුකම සපයා දීම
- රේගු අපනයන අංශය හා ගුවන් භාණ්ඩ අපනයන අංශය තුළ අසිකුඩා පද්ධතිය (**AsyCuda World System**) ක්‍රියාත්මක කිරීම
- රේගු අපනයන අංශය තුළ **e -** ගෙවීම් පහසුකම ක්‍රියාත්මක කිරීම
- ආයෝජන මණ්ඩල කාර්යාල(කොළඹ , කටුනායක, බියගම, කොග්ගල හා මහනුවර) **AsyCuda World** ක්‍රියාත්මක කිරීම
- හම්බන්තොට අංගණයට **AsyCuda World** හඳුන්වා දීම හා පිටපත් ලේඛන භාවිතා කරමින් නව වාහන කඩිනමින් නිෂ්කාශනය කිරීමේ නව ක්‍රියාපරිපාටිය හඳුන්වා දීම
- දිගු කාමරය තුළ **AsyCuda World** ක්‍රියාත්මක කිරීම.
- නැව් භාණ්ඩ ලේඛනය (**CBMV1)** හා දිගු කාමරයේ ක්‍රියාත්මක කිරීම.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කාර්ය සාධනය

| | ආසිකුඩා ++ | ආසිකුඩා වර්ල්ඩ් |
|---|---|---|
| කටයුතු කල රේගු ප්‍රකාශන සංඛ්‍යාව | 7776,706 | 351,122 |
| අතින් | 525,017 | 0 |
| DTI | 110,320 | 351,122 |
| EDI | 141,369 | 0 |
| | | |
| ආනයන | | |
| එකතුව රේගු සටහන්කර | 472,666 | 110,567 |
| ආනයන- සාමාන්‍ය (IM4) | 276,045 | 56,079 |
| ආනයන - මෝටර් වාහන | 673 | 27,330 |
| ආනයන - පහසුකරණ යෝජනා ක්‍රම (IM5, IM6, IM7) | 196,621 | 54,428 |
| | | |
| අපනයන | | |
| අපනයන - සාමාන්‍ය | 81,477 | 229,796 |
| අපනයන - පහසුකරණ යෝජනා ක්‍රමය | 166,742 | 10,759 |
| | | |
| සංඛ්‍යා ලේඛන වාර්තා සකස් කිරීම් | | |
| අභ්‍යන්තර (විමර්ශන ඒකක හා අනෙකුත් රේගු අංශ සඳහා අභ්‍යන්තර විගණන) | 450 | |
| අභ්‍යන්තර විගණන | 80 | |
| බාහිර (රජයේ දෙපාර්තමේන්තු) | 260 | |
| බාහිර ( නීති බලාත්මක කිරීමේ ආයතන - පොලීසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ආදී ) | 60 | |
| බාහිර (පෞද්ගලි අංශ) | 636 | |
| | | |
| වෙබ් ප්‍රකාශන හා සංශෝධන | | |
| | | |
| විනිමය අනුපාතික | | 52 |
| ටෙන්ඩර් දැන්වීම් | | 38 |
| HS සංශෝධන | | 39 |
| ප්‍රකාශන | | 12 |
| **2012 කාලය තුළදී සිදුකරන ලද රඳවා ගැනීම්** | | |
| ලියාපදිංචි කරන ලද සිද්ධි ගණන | | 20 |
| අවසන් කරන ලද සිද්ධි ගණන | | 10 |
| රේගු වැරදි ඔප්පු කරන ලද, දඩ මුදල් හා රාජසන්තක කිරීම් කරන ලද සිද්ධි ගණන | | 5 |
| දඩ මුදල් හා රාජසන්තක කිරීම් වටිනාකම (රුපියල්) | | 14,243,152 |
| රාජසන්තක කරණ ලද භාණ්ඩවල මුළු වටිනාකම (රුපියල්) | | 17,974,390 |
| අතිරේක සටහන්කර මගින් අයකරගන්නා ලද මුදල (රුපියල්) | | 599,611 |
| විකිණීම්වලින් ලද ආදායම | | - |
| අසම්පූර්ණ සිද්ධි ලිපි ගොණු සංඛ්‍යාව (2012 වසර තුල පමණි) | | 10 |

# මධ්‍යම මිල පිරික්සුම් අංශය

**හැඳින්වීම**

රේගු ආදායම සුරක්ෂිත කිරීම පිණිස රේගු ආඥාපනතේ "ඊ" උපලේඛනය යටතට ගැනෙන ආනයනික භාණ්ඩවල වටිනාකම තීරණය කිරීමට අදාල කටයුතු පිළිබඳ වගකීම මධ්‍යම මිල පිරික්සුම් අංශයට පැවරී ඇත.

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු අවශ්‍යතා සඳහා වටිනාකම් තීරණය කිරීම
2. මිල පිරික්සුම් "වටිනාකම් දත්ත පද්ධතිය "නඩත්තු කිරීම
3. රේගු අවශ්‍යතා සඳහා ලෝක වෙළඳ සංවිධානයේ අදාල වටිනාකම් නිර්ණය කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම

**වටිනාකම සංශෝධනය කිරීම මගින් සිදු කරණ ලද අතිරේක අයකරගැනීම්**

ජනවාරි සිට දෙසැම්බර් දක්වා 2012

| මාස | ලැබුණු සටහන්කර සංඛ්‍යාව | වටිනාකම සංශෝධනය කළ සටහන්කර සංඛ්‍යාව | ගැලපුම් වල ප්‍රතිශතය | අයකර ගන්නා ලද අදාල (රු) |
|---|---|---|---|---|
| ජනවාරි | 2,160 | 1,181 | 54.68% | 169,349,817/- |
| පෙබරවාරි | 1,707 | 836 | 48.97% | 120,811,606/- |
| මාර්තු | 2,494 | 1,165 | 46.71% | 183,426,053/- |
| අප්‍රේල් | 2,617 | 986 | 37.68% | 143,328,526/- |
| මැයි | 2,034 | 1,058 | 52.02% | 181,265,678/- |
| ජුනි | 1,886 | 983 | 52.12% | 161,050,147/- |
| ජූලි | 2,347 | 1,088 | 46.36% | 200,736,053/- |
| අගොස්තු. | 3,808 | 1,166 | 30.62% | 205,605,604/- |
| සැප්තැම්බර් | 4,036 | 1,017 | 25.20% | 161,298,813/- |
| ඔක්තොම්බර් | 3,995 | 1,002 | 25.08% | 153,900,590/- |
| නොවැම්බර්. | 2,424 | 936 | 38.61% | 153,593,077/- |
| දෙසැම්බර් | 2,191 | 913 | 41.67% | 134,821,397/- |
| එකතුව | **31,699** | **12,331** | **38.90%** | **1,969,187,361/-** |

ලැබුණු සටහන්කර (Cusdecs)සංඛ්‍යාව :- 31,699
ලැබුණු අගය ගලපන ලද සටහන්කර (Cusdecs)සංඛ්‍යාව :- 12,331
ගැලපුම් වල ප්‍රතිශතය :- 38.9%

# විශේෂ සේවා අංශය

**හැඳින්වීම**

මෙම අංශය දෙපාර්තමේන්තු කටයුතු සඳහා පහසුකම් සලසන්නා වූ එක් ඒකකයකි. මෙමගින් HS ක්‍රමවේදයට අනුකූලව වෙළඳ භාණ්ඩ/භාණ්ඩ වර්ගීකරණය, හඳුනා ගැනීම හා මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ වල වටිනාකම් තක්සේරු කිරීම සිදු කරයි. එමෙන්ම අපනයන/ ආනයන කරුවන් ලියාපදිංචි කිරීම හා රේගු නියෝජිතයන් හට බලපත්‍ර නිකුත් කිරීම සිදු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

01 වෙළඳ භාණ්ඩ / භාණ්ඩ වර්ගීකරණය
02 මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා වටිනාකම තක්සේරු කිරීම
03 රේගු නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීම
04 ආනයන/අපනයන කරුවන් ලියාපදිංචි කිරීම

සංයුක්ත සේවා පර්ෂදය යටතේ ඇති විශේෂඥ සේවා කාර්යාංශය ඒකක කිහිපයකින් සමන්විතය.

**භාණ්ඩ වර්ගීකරණය කිරීමේ අංශය**

ආනයන/අපනයන කරන ලද භාණ්ඩ සඳහා යෝග්‍ය ආකාරයට **HS** කේත තීරණය කිරීම භාණ්ඩ වර්ගීකරණය කිරීමේ අංශයේ වගකීම වේ. **HS** වර්ගීකරණයේ හා කේත පද්ධතියේ භාවිතයෙන් භාණ්ඩ වර්ගීකරණය කිරීමේදී ඇතිවන ආරවුල් නිරාකරණය කිරීමට ඔවුන් රේගු කාර්ය මණ්ඩලයට අවශ්‍ය සහාය ලබාදේ.

2012 වසර තුලදී ආනයනකරුවන් අපනයනකරුවන් වෙත නිකුත් කරන ලද ඉදිරි කාණ්ඩගත කිරීමේ සංඛ්‍යාව. -312

2012 වසර තුලදී දෙපාර්තමේන්තුවේ වෙනත් අංශ වෙත නිකුත් කරන ලද ඉදිරි කාණ්ඩගත කිරීමේ සංඛ්‍යාව. -550

**රේගු විද්‍යාගාර අංශය**

භාණ්ඩවල නිවැරදි විස්තර තහවුරු කර ගැනීම හා දෙපාර්තමේන්තුවේ වෙනත් විවිධ ඒකක විසින් විද්‍යාගාරය වෙත යොමු කරනු ලබන භාණ්ඩ නියැදි පිළිබඳ කාණ්ඩ ගත කිරීමේ මත ලබාදීම මගින් රේගු විද්‍යාගාරය දෙපාර්තමේන්තුවට සිය සහාය ලබාදේ. තාක්ෂණික ඒකකයක් ලෙස එය විවිධ සම්මුතීන් හා පවතින රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි.

2012 වසර තුළදී ලබා ඇති කාණ්ඩගත කිරීමේ මත සංඛ්‍යාව- 363

**මැණික් , වටිනා ලෝහ හා ස්වර්ණාභරණ අංශය**

මැණික් , වටිනා ලෝහ හා ස්වර්ණාභරණ තක්සේරු කිරීම හා ආනයනය/අපනයන ලේඛන සකස් කිරීම මගින් ආනයනයකරුවන්, අපනයනකරුවන් හා සංචාරකයින් හට අවශ්‍ය පහසුව සැලසීම මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ අංශයේ වගකීම වේ.

**වසරේ කාර්යසාධනය 2012**

**සකසන ලද ප්‍රකාශන සංඛ්‍යාව**

ආනයන - 3,725

අපනයන - 6,055

| | | |
|---|---|---|
| ආනයනයන්ගේ වටිනාකම | | |
| රළු දියමන්ති | රු. | 37,574,011,213 |
| කපා ඔපදැමූ මැණික් | රු. | 12,058,980,493 |
| මැණික් | රු. | 1,176,321,288 |
| රිදී | රු. | 113,017,862 |
| රත්‍රන් | රු. | 21,692,735,803 |
| ස්වර්ණාභරණ හා සොයාගැනීම් | රු. | 386,547,977 |
| පරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය | රු. | 67,858,108 |
| ප්‍රති ආනයන | රු. | 4,971,768,019 |
| **එකතුව** | රු. | **78,041,230,763** |
| ආනයනයන්ගේ වටිනාකම | | |
| මැණික් | රු. | 14,598,956,073 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | රු. | 324,407,714 |
| වෙනත් ස්වර්ණාභරන | රු. | 2,428,149,207 |
| දියමන්ති | රු. | 52,892,114,867 |
| ගෙවුඩ හා ඛණිජ ද්‍රව්‍ය | රු. | 222,039,321 |
| රත්‍රන් ප්‍රති- අපනයන | රු. | 1,659,169,905 |
| **එකතුව** | රු. | **72,124,837,087** |

**වාජ්පු නියෝජිත ඒකකය**

යම් නෞකාවක් පැමිණීම හෝ නිෂ්කාශනය සම්බන්ධයෙන් හෝ භාණ්ඩ හෝ මගීබඩු සම්බන්ධයෙන් රේගුව සමග ව්‍යාපාර කටයුතු සිදු කරන **වාජ්පු** නියෝජිතයන්ගේ බලපත්‍ර නිකුත් කිරීම මෙම ඒකකයේ කාර්යභාරය වේ.

| | |
|---|---|
| (1) නව ලියාපදිංචි කිරීම් | |
| වාජ්පු නියෝජිතයින් | 179 |
| වාජ්පු සහකාර | 163 |
| (2) අලුත් කිරීම් සංඛ්‍යාව | |
| වාජ්පු නියෝජිතයන් | 1,562 |
| වාජ්පු සහකාර | 4,821 |
| (3) අවලංගු කිරීම් සංඛ්‍යාව | |
| වාජ්පු නියෝජිතයන් | 14 |
| වාජ්පු සහකාර | 453 |

**(TIN) හඳුනා ගැනීමේ ඉලක්කම / වැට් (අගය එකතු කල බදු) ලියාපදිංචි කිරීමේ ඒකකය.**
රේගු ආඥාපනතේ 115 වන වගන්තිය ප්‍රකාරව ආනයනකරුවන් හා අපනයනකරුවන් ලියාපදිංචි කිරීම මෙම ඒකකයේ කාර්යය වේ. ලියාපදිංචි ආනයනකරුවකු හෝ අපනයනකරුවකු නොවන කිසිවකු විසින් කිසිදු භාණ්ඩයක් ආනයන අපනයන නොකළ යුතුය.

**2012වසර තුළ ලියාපදිංචි වීම් සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| තනි හිමිකරු | - | 1193 |
| හවුල්කාරිත්ව | - | 1304 |
| සීමිත වගකීම් | - | 1819 |
| තනිපුද්ගල ආනයන | - | 9129 |
| ප්‍රත්‍යාගණන /**N.G.D.S.** | **-** | **10** |
| **එකතුව** | **-** | **13455** |

# සේවා හා සැපයීම් අංශය

**හැඳින්වීම**

රජය විසින් දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති නොවැළැක්විය හැකි රාජකාරි ඉටු කිරීම සම්බන්ධයෙන් මෙම කාර්යාංශය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. දෙපාර්තමේන්තුවේ සියළු කාර්යාංශයන්ට අවශ්‍ය සේවාවන් ඇතුළු සියළු අවශ්‍යතා සම්පාදනය ඵලදායි හා පාරදෘශ්‍ය ආකාරයෙන් සිදු කිරීම සේවා හා සැපයීම් අංශයේ ඉලක්කය වේ.

**ප්‍රධාන කාර්යයන්**

1. දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස, ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් අදාල අංශ වෙත සැපයුම් හා සේවා ලබාදීම
2. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව යමින් විනිවිද පෙනෙන ආකාරයට සැපයුම් හා සේවා මිළදී ගැනීම
3. විධිමත් ආකාරයේ තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සහතික කිරීමත්, මිළදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා උපරිම ප්‍රයෝජනය ලැබෙන පරිදි ඒවා ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම
4. රේගු දෙපාර්තමේන්තුවේ චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය
5. කාල සටහනට අනුව නව රේගු මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම කටයුතු නිම කිරීම හා පරිශ්‍ර කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.
6. සුදුසු පියවර මගින් රේගු දෙපාර්තමේන්තුවේ රථ වාහන සමූහය උපරිම ධාවන තත්ත්වයන් පවත්වාගෙන යාම සහතික කිරීම.

**2012 වසරේ කාර්ය සාධනය**

රේගු දෙපාර්තමේන්තුවේ භෞතික සම්පත් වර්ධනය කිරීම වෙනුවෙන් 2012 වසර තුල ඉහල අවදානයක් හිමි විය.මෙම වගකීම පූර්ණ වශයෙන් සේවා හා සැපයීම අංශයේ වෙත පැවරිණි.කාර්යංශයට හිමි වූ ප්‍රධානතම කාර්යන් අතර ප්‍රමුඛස්ථානය හිමි වූයේ නව රේගු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදි කිරීම් වල අවසන් ක්‍රියාකාරකම් වලට අදාළ සැපයුම් හා සේවාවන් සැපයීම වෙනුවෙනි. ගොඩනැගිල්ල ඉදි කර අවසන් වීමටත් පෙර 2011 වසරේදී දෙපාර්තමේන්තුව සිය ක්‍රියාකාරකම් නව ගොඩනැගිල්ල වෙත මාරු කල අවස්ථාවේ එවන් පරිසරයක් තුල උක්ත කටයුතු කිරීමට සිදුවීම කාර්යංශයට අතිරේක පීඩනයක් ගෙන දුනි. කෙසේ වෙතත්, අපේක්ෂා කල පරිදි 2012 වසරේදී එම සැපයුම් හා සේවා අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හැකියාව ලැබිණි.

2012 වසර තුලදී සම්පූර්ණ කරන ලද අනෙකුත් ප්‍රධාන කාර්යන්

1. **AsyCuDA World System** ස්ථාපිත කිරීමට අවශ්‍ය පරිගණක පද්ධති මුද්‍රණ යන්ත්‍ර හා ආරක්ෂක භාවිතයන් මිලදී ගෙනීම හා බෙදා හැරීම
2. ස්ථාවර වත්කම් හා ගබඩා පාලන කළමනාකරණය සඳහා අවශ්‍ය පරිඝනක පද්ධති හඳුන්වා දීම
3. ආරක්ෂාව ඉහළ දැමීම සඳහා **CCTV** කැමරා පද්ධති සකස් කිරීම
4. හම්බන්තොට රේගු කාර්යාල පහසුකම හා කටුනායක රේගු විවේකාගාරය ඉදිකිරීම අවසන් කිරීම, ගාල්ලේ රේගු කාර්යාලය හා අනෙකුත් ප්‍රාදේශීය කාර්යාල අලුත්වැඩියා කිරීම හා මත්තල ගුවතොටුපොලේ රේගු පරිශ්‍රයේ කටයුතු ආරම්භ කිරීම.
5. දෙපාර්තමේන්තුවේ ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සඳහා නව වාහන 12ක් සපයා දීම.

2012 වසරේදී ආරම්භ කොට 2013 වසරේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

1. නව ගොඩනැගිල්ලේ පැරණි කාර්යාල උපකරණ වෙනුවට නව උපකරණ සවි කිරීම සම්බන්ධයෙන් අදාල ප්‍රසම්පාදන කොන්ත්‍රාත් අවසන් කිරීම වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම
2. ආපන ශාලා සඳහා ආහාර සැපයීමට අවශ්‍ය ප්‍රසම්පාදන ආරම්භ කිරීම
3. යෝජිත රේගු කෞතුකාගාරය ස්ථාපිත කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීම
4. ස්වයංක්‍රීය ප්‍රවේශ පාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සියලු කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් වෙත ප්‍රවේශ පාලන කාඩ්පත් නිකුත් කිරීමට අදාල දත්ත සැකසුම් කටයුතු අවසන් කිරීම

**ඉහත ක්‍රියාකාරකම් ඉටුකිරීම පිණිස මුදල් වැය කළේ කෙසේද යන්න පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.**

පුනරාවර්තන වියදම (රු. මිලියන)

| වියදම | 2012 | 2013 ඇස්තමේන්තුගත |
|---|---|---|
| සැපයීම | 75.4 | 86.0 |
| නඩත්තුව | 73.0 | 82.0 |
| සේවාවන් | 163.9 | 192.2 |

මූලධන වියදම

***1.*** **මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම *(රු.මිලියන)***

| වියදම | 2012 | 2011 | 2012 | 2013 ඇස්තමේන්තුගත |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහයන් ඉදි කිරීම | 0.02 | 11.6 | 18.1 | 40.0 |
| යන්ත්‍රෝපකරණ | - | - | 4.5 | 6.0 |
| මෝටර් වාහන | 0.4 | 1.5 | 1.8 | 2.5 |

***2.*** **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම *(රු. මිලියන)***

| වියදම | 2012 | 2011 | 2012 | 2013 ඇස්තමේන්තුගත |
|---|---|---|---|---|
| මෝටර් වාහන | 14.9 | 1.9 | - | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 11.3 | 1.0 | 0.9 | 1.3 |
| යන්ත්‍රෝපකරණ | 6.3 | 9.3 | 1.8 | 2.5 |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් ඉදිකිරීම | 599.1 | 1,403.7 | 875.2 | 707.0 |

# මානව සම්පත් පරිෂදය

# මානව සම්පත් කළමනාකරණ අංශය

**හැඳින්වීම**

මානව සම්පත් කළමනාකරණ අංශය දෙපාර්තමේන්තුවේ මානව ප්‍රාග්ධනයේ ආයෝජන වෙනුවෙන් උපරිම ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අතර මූල්‍ය අවදානම අඩු කර ගැනීමටද කටයුතු කරයි. මෙම අංශය මෙකී අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන්නේ හැකියාවන් සහිත පුද්ගලයන් හා ඔවුන්ගේ දක්ෂතාවන්, දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්ම සහ ආයෝජනයට අනුරූපිව ලැබෙන ප්‍රතිඵල උපරිම කිරීම හා අනාගත පැවැත්ම හා සාර්ථකත්වය යන කරුණු සමග එකට ගැලපීම තුළිනි. එම අරමුණු ඉටු කර ගැනීම සහතික කිරීම පිණිස මානව සම්පත් කළමනාකරණ අංශය, රජයේ කම්කරු නීති හා රෙගුලාසි, සදාචාර සම්පන්න ව්‍යාපාර විධි සහ දළ වියදම, යෝජිත අභිප්‍රේරණය, කැපවීම හා ඵලදායිතාවය හැකිතාක් දුරට උපරිම ආකාරයට ප්‍රයෝජන ලැබෙන ලෙස මානව සම්පත් අවශ්‍යතා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම සිදු කරයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ සිට ඉන් පහත මට්ටම් වන මාණ්ඩලික හා මාණ්ඩලික නොවන මට්ටම් වල මානව සම්පත් කළමනාකරණයට අදාල සියලු කරුණු සම්බන්ධව අවසාන අධිකාරි බලය හිමි ආයතනයයි.

මානව සම්පත් කළමනාකරණ අංශය, මේ හේතුව නිසා වරින් වර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්යසාධන කළමනාකරණය ආදිය මෙන්ම ආයතන සංග්‍රහය, රේගු ආඥා පනත හා මුදල් රෙගුලාසි ආදිය සම්බන්ධව නිකුත් කරන නියෝග වලට අනුගතව කටයුතු කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වන කොටසේ දෙවන උපලේඛණයේ සඳහන් වැරදි සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට සහ ස්ථාන මාරු කිරීමටත් බලය පවරා ඇති අතර අනෙක් සියලු නිලධාරින්ගේ සියලුම විනය හා ස්ථාන මාරු සම්බන්ධව බලය පවරා ඇත. (රාජ්‍ය සේවා කොමිසන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතියට යටත්ව) එසේම රාජ්‍ය සේවයේ පවත්නා රෙගුලාසි වලට අනුගත වන අතරම රේගු දෙපාර්තමේන්තුවට කාර්යසාධන ආකෘති හා උසස් කිරීමේ නිර්ණායකද ඇතුළුව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමේ නිදහස ද ඇත.

**ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය ඉතා වැදගත් කාර්යයක් ඉටුකරයි.

1. බඳවා ගැනීම්, තෝරා ගැනීම් හා සම්පත් භාවිතා කිරීම,
2. සේවක වාර්තා තබා ගැනීම හා රහස්‍යභාවය,
3. ආයතනික සැලසුම හා සංවර්ධනය,
4. ප්‍රතිව්‍යුහගතකරණය හා වෙනස්වීම් කළමනාකරණය,
5. කාර්යසාධනය, හැසිරීම හා චර්යා කළමනාකරණය,
6. පාරිභෝගික හා සේවක සම්බන්ධතා,

7. මානව සම්පත්, මානව සම්පත් (මිනිස් බල) විග්‍රහය හා මිනිස්බල දත්ත කළමනාකරණය,
8. වන්දි ගෙවීම හා සේවක ප්‍රතිදාන කළමනාකරණය,
9. සේවක අභිප්‍රේරණ හා ධෛර්යය ගොඩනැගීම

යන කරුණු අරභයා මානව සම්පත් කළමනාකරණ අංශය උපාය මාර්ග සකස් කිරීමද ප්‍රතිපත්ති සම්පාදනය කිරීමද ප්‍රමිතීන්, පද්ධතීන් හා ක්‍රියාපරිපාටි සකස් කිරීමද කරනු ලබයි.

**2012 වසර තුල කාර්ය සාධනය**

**බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම**

| සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද තනතුර | තනතුරු සඳහා | දිනය |
|---|---|---|
| රේගු පරීක්ෂක I ශ්‍රේණිය | ප්‍රධාන රේගු පරීක්ෂක තනතුරු 50 | 09.08.2012 |
| රේගු අධ්‍යක්ෂ | අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 04 | 29.09.2012 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | රේගු අධ්‍යක්ෂ තනතුරු 07 සඳහා | 16.11.2012 |

**විභාග පැවැත්වීම**

| විභාගය | අපේක්ෂකයන් | සංඛ්‍යාව |
|---|---|---|
| කාර්යක්ෂමතා කඩඉම් | සහකාර රේගු අධිකාරි II ශ්‍රේණිය , රේගු පරීක්ෂක II ශ්‍රේණිය | 08 |

**අවසන් කරන ලද අධිකරණමය ක්‍රියා මාර්ග**

| නඩු අංකය | පෙත්සම්කරුවන් | ප්‍රතිඵලය |
|---|---|---|
| SCFR 1427/2012 | ඩබ්ලිව්.එම්. නාමල් සංජීව | නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |
| HRC 1427/2012 | පී.ජී. ප්‍රියදර්ශනී | නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |
| HRC 1523/2012 | උපාධිධාරි රේගු පරීක්ෂක සංගමය | නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |

**අනෙකුත් කාර්යයන්**

සමස්ත රේගු කාර්ය මණ්ඩලය සඳහා මාස 10 ක දිරි දීමනා සකස්කොට ගෙවන ලදී.

**කාර්ය සාධනය සැසඳීම**

**2008**

| | |
|---|---|
| **උසස් වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව.** | (සහකාර රේ. අ. I හා ප්‍රධාන රේගු අධ්‍යක්ෂ -I.) |
| **උසස් වීම් සංඛ්‍යාව හා බඳවා ගැනීම්** | නි.රේ.අ. 4, ස.රේ.අ.II 116, ප්‍රධාන රේගු පරීක්ෂක ස.රේ.අ. II ශ්‍රේණියට - 10 |
| **කාර්යසාධන කඩඉම් පරීක්ෂණ ඉල්ලා සිටින ලද සංඛ්‍යාව** | ඉල්ලා සිටි සංඛ්‍යාව -09,විභාග දෙපාර්තමේන්තුව පවත්වන ලද සංඛ්‍යාව -05. |
| **සේවක දිරි දීමනා ගෙවීම්** | මුළු වර්ෂය සඳහා ගෙවන ලදී. |

**2009**

රේගු අධ්‍යක්ෂ තනතුරු 4 ක්, ප්‍රධාන රේගු පරීක්ෂක 41ක් හා රේගු පරීක්ෂක I තනතුරු 3 පුරවන ලදී. කාර්යක්ෂමතා කඩඉම් විභාග 08 ක් විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලදී. මුළු වර්ෂය සඳහා දිරි දීමනා ගෙවන ලදී.

**2010**

| | |
|---|---|
| **බඳවා ගැනීම් විභාග හා සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව කී දෙනෙකු සහාද ?** | විවෘත තරග විභාග සඳහා ගැසට් නිවේදන මගින් ඉල්ලුම් කැඳවන ලදී. ස.රේ.අ.II- 100, රේගු පරීක්ෂක II-100, රේගු නියාමක - 50 |
| **උසස් කිරීම් සඳහා සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව** | රේගු අධ්‍යක්ෂ -12, නි.රේ.අ. -32,රේගු අධිකාරී - 107, නි.රේ.අ.- 376 හා ප්‍රධාන රේගු පරීක්ෂක 92 උසස් කිරීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. |
| **උසස් කිරීම් සංඛ්‍යාව හා බඳවා ගැනීම්** | අති.රේ.අ.ජනරාල් -4,රේගු අධ්‍යක්ෂ - 12 නි.රේ. අ. – 76, ස.රේ.අ. -44, රේගු අධිකාරි 118, නි.රේ.අධිකාරි - 70, ප්‍රධාන රේගු පරීක්ෂක - 92, රේගු පරීක්ෂක I - 32 |
| **විභාග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග සංඛ්‍යාව** | 08. |
| **සේවක දිරි දීමනා ගෙවීම** | මුළු වර්ෂය සඳහා ගෙවන ලදී. |

**2011**

| | |
|---|---|
| **තනතුරු වල උසස් කිරීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව** | 05 (අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රේගු අධ්‍යක්ෂ හා සහකාර රේගු අධිකාරි - II). |
| **බඳවා ගැනීම් සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව .** | 01 (සහකාර රේගු අධිකාරි -II). |
| **උසස් වීම් හා බඳවා ගැනීම් සංඛ්‍යාව** | ස.රේ.අ. -84, ස.රේ.අ. 9 (5%), ස.රේ.අ.II – 38 (15%). |
| **විභාග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සංඛ්‍යාව** | ඉල්ලන ලද සංඛ්‍යාව 08, පවත්වන ලද සංඛ්‍යාව 06. |
| **විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද විභාග ගණන** | තරග විභාග 3, සීමිත කරග විභාග 01 |
| **සේවක දිරි දීමනා හා ගෙවීම්** | මුළු වර්ෂය සඳහා ගෙවන ලදී. |

## මානව සම්පත් සංවර්ධන අංශය

**හැඳින්වීම**

දෙපාර්තමේන්තුවේ ප්‍රගතියට සහාය සපයන වඩා යහපත් ව්‍යුහයක් ඇති කිරීම සඳහා මූලික වශයෙන් මානව සම්පතේ ආකල්පය හා කුසලතා වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු හේතුවෙන් මෙම කාර්යාංශය දෙපාර්තමේන්තුවේ ඉතා වැදගත් කාර්යාංශයක් ලෙස හැඳින්විය හැකිය.

මෙම දෙපාර්තමේන්තුවේ වසර 30ක විශිෂ්ඨ සහයක ඉතිහාසයක් ඇති අතර එදිනෙදා කටයුතු වලදී කාර්ය මණ්ඩලයට නිවැරදි ලෙස සිතීමට අවශ්‍ය මතවාදිමය වෙනස මෙම කාර්යාංශය විසින් ඉතා සාර්ථකව ඇති කොට ඇත.

**දැක්ම**

රේගු දෙපාර්තමේන්තුවේ විශිෂ්ඨතම පුහුණු ඒකකය බවට පත්වෙමින් මානව සම්පතේ ඵලදායිතාවය ඉහළ දැමීම

**මෙහෙවර**

දෙපාර්තමේන්තුව තුලින් ඉහළම ඵලදායිතාවයක් අත්පත් කර ගැනීම සඳහා රේගුවේ ඉහළ ඵලදායිතාවය සැලකිල්ලට ගනිමින් පවතින මානව සම්පතේ කුසලතා වර්ධනය කිරීම

**ප්‍රධාන කාර්යයන්**

කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීම පැවරී ඇති ප්‍රධාන කාර්ය වේ. මෙය දේශීය හා විදේශීය පුහුණුව වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. අන්තර්ජාතික තලයේ රේගු ක්‍රියාකාරකම් පිළිබඳව විදේශ ශිෂ්‍යත්ව මෙමගින් මූලික වශයෙන් ඉලක්ක කර ඇත. දේශීය පුහුණුව, නිපුණතා සංවර්ධනය හා කුසලතා සහ උරුම කර ගත් හැකියාවන් හඳුනා ගැනීම මූලික කර ගත් අදාල ක්ෂේත්‍රයේ දැනුම හා දැනුවත්භාවය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ඇත. මෙම අංශය වෙත දෙපාර්තමේන්තුවේ පුහුණු ක්‍රමය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත. රේගු වාප්පු නියෝජිතයන් පුහුණු කරන අතරතුර අනෙකුත් ආයතන වලට අදාල සහාය ලබා දීමද සිදු කරයි. මානව සම්පත් සංවර්ධන අංශය සම්බන්ධයෙන් බලන කල, එම අංශය මගින් පහත සඳහන් සේවාවන් සපයන බව තවදුරටත් සඳහන් කළ යුතු වේ.

- රේගු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සැපයීම
- පුහුණු ප්‍රතිපත්තීන් හා ක්‍රියාපරිපාටි සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- රේගු වාප්පු නියෝජිතයන් සඳහා පුහුණුව මානව සම්පත් සංවර්ධන අංශය විසින් සපයන අතර පුහුණුව අවසානයේ විභාගයක්ද පවත්වනු ලබයි.
- දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම. ඒවා ප්‍රමුඛතාව අනුව පෙළ ගැස්වීම, පුහුණු සැලැස්ම සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම

- අවශ්‍යතාව පරිදි යුද හමුදාව, නාවික හමුදාව හා පොලීසිය වැනි බාහිර ආයතන වලට අවශ්‍ය පුහුණුව ලබාදීම.
- පාඨමාලාවන්හි විෂය මාලාවන් සංවර්ධනය කිරීම, දේශීය හා විදේශීය පුහුණුකරුවන් විසින් පවත්වනු ලබන පාඨමාලා මෙහෙයවීම
- අනෙකුත් ආයතන රේගු විෂය පථය පිළිබඳ දේශකවරුන් ඉල්ලා සිටින අවස්ථා වලදී අදාල දේශන පැවැත්වීම සඳහා සම්පත් දායකයින් ලබාදීම
- රේගු කටයුතු හා ඊට සම්බන්ධිත කරුණු පිළිබඳව කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීම
- රේගු කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම හා ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය
- පුහුණු අවස්ථා පිළිබඳව සන්නිවේදන කටයුතු.
- පුහුණු කටයුතු ඇගයුම් කිරීම
- ඉහත කාර්යයන්ට අමතරව ඕනෑම අවස්ථාවකින් අධ්‍යාපනික කාර්යයක් සඳහා ශාලා පහසුකම් ලබාදීම. මෙයට විවිධ ශ්‍රේණිවලට අයත් රේගු නිලධාරින්ගේ සංවිධාන වල වාර්ෂික මහා සම්මේලන පැවත්වීම හා සුබ සාධන කටයුතු ද අයත් වේ.

**කාර්යාංශයේ ප්‍රධාන ඉලක්කයන්**

- දෙපාර්තමේන්තුවේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ දැමීම සඳහා ඉදිරි දැක්මක් සහිත ක්‍රියාශීලී නිලධාරීන් කණ්ඩායමක් නිර්මාණය කිරීම
- නිතර වෙනස්වන පරිසරයක් තුළ කාර්යමණ්ඩලයේ ඉහළ කාර්යසාධනය තහවුරු කිරීම පිණිස ඵලදායී දේශීය හා විදේශීය පුහුණු ඉඩ ප්‍රස්ථා සපයා දෙමින් කාර්ය මණ්ඩලයේ නිපුණතාවයන් හා ආත්ම විශ්වාසය ඉහළ දැමීම
- දැනුම හුවමාරු කිරීම හා බෙදා හදා ගැනීම හරහා රේගු දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය ඉහළ දැමීම
- රේගු කාර්යමණ්ඩල සාමාජිකයන් හට ස්වකීය දැනුම පුලුල් කර ගැනීම සඳහා ඉහළ අධ්‍යාපනය ලැබීමේදී මූල්‍ය සහායද ඇතුළු අවශ්‍ය අනෙකුත් සහාය ලබා දීම
- ඉල්ලීම පරිදි අනෙකුත් ආයතනවලට හා පාර්ශ්වකරුවන් හට පුහුණුව ලබා දීම
- සුභවාදී ආකල්ප හා යහපත් පුද්ගල සබඳතා වර්ධනය කිරීම තුලින කාර්ය මණ්ඩලයේ සේවාවන් වල ගුණාත්මක භාවය ඉහළ දැමීම

මෙම ඉලක්ක ළඟ කර ගැනීම සඳහා කළමනාකරණ නිලධාරින් විසින් පහත දැක්වෙන කාර්ය මණ්ඩල අනුමත කර ඇත.

| පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ | 01 | 01 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 02 | 01 |
| රේගු අධිකාරි | 03 | 03 |
| නියෝජ්‍ය රේගු අධිකාරි | 08 | 03 |
| සහකාර රේගු අධිකාරි | 08 | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 02 |
| එකතුව | 25 | 15 |

**2012 වර්ෂයේ කාර්ය සාධනය:**

2012 පුහුණු සැලැස්ම අනුව පුහුණු පාඨමාලා 28 ක් හා පුහුණු වැඩසටහන් 107 ක් පවත්වන ලදී . පුහුණු පාඨමාලා පුහුණු පාඨමාලා වලට සහභාගී වන සංඛ්‍යාව 1200 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද ,

**2012 වර්ෂයේ පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය**

**වගු අංක 01 : ශ්‍රේණි අනුව**

| ශ්‍රේණිය | දේශීය | විදේශීය |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 1 | - |
| අති. රේගු අධ්‍යක්ෂ ජනරාල් | - | 02 |
| රේගු අධ්‍යක්ෂ | 2 | 12 |
| නි.රේගු අධ්‍යක්ෂ | 3 | 24 |
| රේගු අධිකාරි | 140 | 18 |
| නි.රේගු අධිකාරි | 200 | 12 |
| සහකාර රේගු අධිකාරි | 578 | 21 |
| අනෙකුත් | 176 | - |
| එකතුව | **1100** | **89** |

**වගු අංක 02 : පුහුණු නිර්ණායක**

දේශීය පුහුණු වැඩසටහන් – එකතුව වැඩසටහන් : 28

විදේශීය පුහුණු වැඩසටහන් – එකතුව වැඩසටහන් : 107

දේශීය

| ශ්‍රේණිය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| රේගු අධිකාරි හා ඉන් ඉහළ | 08 |
| සහකාර රේගු අධිකාරි හා ඉන් ඉහළ | 23 |
| අනෙකුත් | 05 |
| සහභාගි වූ මුළු සංඛ්‍යාව | **1050** |

විදේශීය

| වැඩසටහන් මෙහෙයවීම | වැඩසටහන් සංඛ්‍යාව | |
|---|---|---|
| | සැලසුම් කල | සත්‍ය වශයෙන් සහභාගි වූ සංඛ්‍යාව |
| සමුළු | 15 | 18 |
| වැඩමුළු | 20 | 22 |
| වැඩසටහන් | 11 | 11 |
| පුහුණු පාඨමාලා | 16 | 16 |
| සාකච්ඡා | 09 | 10 |
| පශ්චාත් උපාධි වැඩසටහන | 09 | 11 |
| සම්මන්ත්‍රණ | 14 | 14 |
| අනෙකුත් | 03 | 05 |

| | | |
|---|---|---|
| එකතුව | 97 | 107 |

**රේගු පුස්තකාලය**

මානව සම්පත් සංවර්ධනයේ ඉතා වැදගත් අවියක් වන රේගු පුස්තකාලය 2005.01.26 දින පිහිටුවන ලදී. ඒ සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීම අපහසු වීම නිසා, එය රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) යටතේ අනුබද්ධිත ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලදී. පුස්තකාලය සඳහා රේගු කාර්ය මණ්ඩයේ බලාපොරොත්තු නොවූ ධනාත්මක ප්‍රතිචාරයක් ලැබිණ. මේ වන විට එහි සාමාජිකත්වය 1124 දක්වා වැඩි වී ඇති අතර පොත් සංඛ්‍යාවද 5885 දක්වා වැඩි වී ඇත. රේගු නිලධාරින්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වෙන් කරනු ලබන මුදලින් පුස්තකාලය සඳහා පොත් ලබා ගැනීම පහසු වී ඇත.

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට මෙම පහසුකම් ලැබෙන අතර සාමාජිකයන් නොවන අයටද පුස්තකාලය පරිහරණය කල හැකිය. පොත් වලට අමතරව පුවත්පත් හා විවිධ සඟරා ආදියද පරිහරණය සඳහා ඇති අතර පුස්තකාලය දෙපාර්තමේන්තු නියෝග හා නිලධාරීන් විදේශ පුහුණුව සඳහා සහභාගී වීමෙන් පසුව ඉදිරිපත් කරනු ලබන වාර්තාද අනාගතය ප්‍රයෝජනය සඳහා මෙහි තැන්පත් කර ඇත.

මෙහි පුස්තකාලාධිපතිවරයකු නොමැති වුවද, පුස්තකාලයේ කටයුතු බාධාවකින් තොරව සිදු කෙරේ. පුස්තකාලයේ සාමාජිකත්වය වැඩ වෙමින් පවත්නා අතර එම නිසා එයට පහසුකම් ලබා දිය යුතු වේ. ඒවා අතර

(a) අනෙකුත් කාර්ය මණ්ඩලය සමග සුදුසු පුස්තකාලාධිපතිවරයෙකු අනුයුක්ත කිරීම
(b) සුදුසු මෘදුකාංගයක් හඳුන්වා දීම
(c) නවීන පහසුකම් සහිත පරිගණක අන්තර්ජාල පහසුකම් ලබාදීම වැනි දෑ දැක්විය හැකිය.
(d) කාඩ්පත් ක්‍රමය යටතේ පොත් පත් නිකුත් කිරීමේ හා නැවත භාරගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

**වගු අංක 03 : පුස්තකාල සේවාව**

**(සාමාජික සංඛ්‍යාව 1124)**

| විස්තරය | 2011 | 2012 |
|---|---|---|
| නව සාමාජික සංඛ්‍යාව | 89 | 223 |
| මිලදී ගන්නා ලද පොත් ප්‍රමාණය | - | 479 |
| ප්‍රදාන වශයෙන් ලද පොත් ප්‍රමාණය | - | 39 |
| බැහැර දෙන ලද වාර ගණන | 2,830 | 5,980 |

රේගු පුස්තකාලයේ සම්පත් සීමිත වුවත් එය දෙපාර්තමේන්තුවේ ඉතා ජනප්‍රිය ස්ථානයක් බවට පත්ව තිබේ.

# කාර්ය මණ්ඩල සේවා අංශය

**හැඳින්වීම**

ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ අලුතින් ආරම්භ කරන ලද මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ සේවකයන් හට දෙපාර්තමේන්තුමය අරමුණු ඉටුකර ගැනීම සඳහා නිර්මාණාත්මකව හා ප්‍රයෝජනවත් ආකාරයට දායක විය හැකි පරිසරයක් සැකසීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. අදාල නිලධාරින්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේ නම් ඒ පිළිබඳ මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම
2. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි රේගු කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරි ගණයක් සඳහාම ඵලදායිතා ප්‍රවර්ධන කණ්ඩායම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
3. අන්තර්ජාතික ප්‍රමිති සහතික ලබා ගැනීමේ අපේක්ෂාවෙන් රේගු දෙපාර්තමේන්තුවේ සෑම ඒකකයකටම ඵලදායිතා ප්‍රවර්ධන කණ්ඩායම් පිහිටුවීම
4. පිළිගත් වෘත්තීය සමිති සමග මනා සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමේ අපේක්ෂාවෙන් නිරන්තර සාකච්ඡා පැවැත්වීම
5. සේවක ගැටළු හඳුනාගෙන එකඟතාවයකට පැමිණීම පිණිස සාකච්ඡා පැවැත්වීම
6. අර්බුදකාරී කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම පිණිස සාකච්ඡා සම්මුති කමිටු පිහිටුවීම.
7. සේවකයන් තුල තෘප්තිය වර්ධනය කිරීමටත්, කළමනාකරණය කෙරේ අසන්තෘප්තිය අවම කිරීමටත් හැකිවන පරිදි දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
8. දැනට සැපයෙන සුබ සාධක සේවා හා ඒවායේ ප්‍රමිතිය හඳුනාගෙන ගුණාත්මක සුබ සාධක සේවාවක් සැපයීම පිණිස අවශ්‍ය කටයුතු කිරීම.
9. සියළුම මට්ටම් වල සේවකයින් සමග සාකච්ඡා කොට සුබ සාධක සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
10. රේගු දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියා පරිපාටිය තුලට අන්තර්ගත කොට චර්යාධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම
11. සාමාන්‍ය කාර්ය මණ්ඩල අධීක්ෂණ යන්ත්‍රණය තුලින්ද, අංශ ප්‍රධානීන් මගින් හා අධීක්ෂණ නිලධාරීන් මගින් චර්යාධර්ම පද්ධතිය සේවකයන් විසින් අනුගමනය කෙරන බවට වග බලා ගැනීම

12. ආචාර්ය ධර්ම පද්ධතිය අනුගමනය නොකරන්නන්ට විරුද්ධව විනය ක්‍රියා පරිපාටිය හැකිතාක් දුරට අනුගමනය කොට ආචාරධර්ම පද්ධතිය ඵලදායි බවට පත්කිරීම

**කාර්ය සාධනය**

**විනය**

| **පවත්වන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව** | **අවසන් කරන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව** | **ඉතිරි විනය පරීක්ෂණ සංඛ්‍යාව** |
|---|---|---|
| 03 | 01 | 02 |

**ඵලදායිතාවය**

රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා වන රජයේ ප්‍රතිපත්තිය හා අනුගත වෙමින් ශ්‍රී ලංකා රේගු පරිපාලනය ලෝකයේ ඉතාම හොඳ රේගු පරිපාලනයන් අතුරින් එකක් බවට පත් කිරීම පිණිස ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සහයෝගය සහිතව නිලධාරීන්ගේද, පද්ධති හා ක්‍රියාපරිපාටි වලද කාර්යක්ෂමතාව හා ඵලදායී බව වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. එහි අරමුණ කරා ළඟා වීම පිණිස, කොළඹින් පිට කාර්යාල හැරෙන්නට මුළු දෙපාර්තමේන්තුවම ආවරණය වන ලෙස ඵලදායිතා වර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් මෙහෙයුම් කමිටුව, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් මෙහෙයුම් කමිටුව හා අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රධානත්වයෙන් යුත් ක්‍රියාවට නැංවීමේ කණ්ඩායම් ලෙස කමිටු තුනක් ස්ථාපිත කොට ඵලදායිතා සංකල්පය හා 5S සංකල්පය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ සැසිවාර හතරක් පවත්වන ලදි.

# පළාත් පරිෂදය

# ආදායම් හා සේවා (පළාත් ) අංශය

## හැඳින්වීම

ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය හා මාගම්පුර යන බාහිර වරායයන්ට අදාල සියළු රේගු කාර්යයන් කළමනාකරණය, නැව් භාණ්ඩ, හිමිකරුවන් කැටුව නොඑන මගී ගමන් මලු හා පාර්සල් නිශ්කාශන සේවා සැපයීම හා ආදායම නිසි ලෙස ඒකරාශී කර ගැනීම යන කාර්යයන් ඉටු කිරීම ආදයම් හා සේවා (පළාත්) කාර්යාංශයේ වගකීම වේ. ආනයනයන් හා ප්‍රතිඅපනයන භාණ්ඩ නිශ්කාශනයට ඉඩ සැලසීම පිණිස 2012 ජුනි 5 වන දින හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ නව කාර්යාලය විවෘත කිරීමට අවශ්‍ය පියවර දෙපාර්තමේතුව විසින් ගෙන ඇත.

## ප්‍රධාන කාර්යයන්

01 ආනයන හා අපනයන වලින් ලැබිය යුතු ආදායම් රැස් කිරීම
02 රටේ සමාජ ආර්ථික ආරක්ෂාව සහතික කිරීම සඳහා දේශ සීමා පාලන කටයුතු සිදු කිරීම
03 ආනයන හා අපනයන භාණ්ඩ පරීක්ෂා කිරීම හා නිදහස් කිරීම
04 ප්‍රාදේශීය මට්ටමේදි තැපැල් මගින් එන පාර්සල් හා මගීන් කැටුව නොඑන ගමන්මලු නිශ්කාෂණය පහසු කිරීම

## එකතු කරන ලද ආදායම

**1000 x** රු.

| පළාත් | ගාල්ල | | හම්බන්තොට | | ත්‍රිකුණාමලය | | යාපනය | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | බදු | වෙනත් අයකිරීම් | බදු | වෙනත් අයකිරීම් | බදු | වෙනත් අයකිරීම් | බදු | වෙනත් අයකිරීම් | |
| ජනවාරි | 4,143 | 1,882 | - | - | 88 | 852 | 261 | 166 | 7,392 |
| පෙබරවාරි | 1,900 | 1,987 | - | - | 96 | 1,732 | 115 | 82 | 5,912 |
| මාර්තු | 3,059 | 2,294 | - | - | 66 | 1,206 | 250 | 123 | 6,998 |
| අප්‍රේල් | 2,614 | 1,732 | - | - | 38 | 1,841 | 199 | 118 | 6,542 |
| මැයි | 4,493 | 1,873 | - | - | 81 | 1,527 | 142 | 152 | 8,268 |
| ජුනි | 1,732 | 1,775 | 280 | 69 | 33 | 1,020 | 90 | 48 | 5,047 |
| ජුලි | 3,658 | 1,733 | 159 | 167 | 106 | 2,257 | 96 | 127 | 8,303 |
| අගොස්තු. | 2,282 | 1,827 | 639 | 127 | 172 | 946 | 144 | 91 | 6,228 |
| සැප්තැම්බර් | 3,049 | 2,001 | 494 | 63 | 131 | 1,161 | 137 | 199 | 7,235 |
| ඔක්තෝබර් | 2,091 | 2,049 | 601 | 62 | 105 | 1,110 | 161 | - | 6,179 |
| නොවැම්බර්. | 1,745 | 1,719 | - | 120 | 76 | 1,206 | 178 | 141 | 5,185 |
| දෙසැම්බර් | 1,701 | 1,912 | 175 | 44 | 110 | 1,951 | 94 | 106 | 6,093 |
| උප එකතුව | 32,467 | 22,784 | 2,348 | 652 | 1,102 | 16,809 | 1,867 | 1,353 | 79,382 |

| | | | | | |
|---|---|---|---|---|---|
| එකතුව | **55,251** | **3,000** | **17,911** | **3,220** | **79,382** |

**මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය**

| | |
|---|---|
| පැමිණි වාහන ගෙන යන නෞකා සංඛ්‍යාව | 32 |
| පිටවූ වාහන ගෙන යන නෞකා සංඛ්‍යාව | 32 |
| පැමිණි වාහන(දේශීය)සංඛ්‍යාව | 6,555 |
| පිටවූ වාහන(දේශීය)සංඛ්‍යාව | 6,298 |
| පැමිණි වාහන (ප්‍රතිඅපනයන) සංඛ්‍යාව | 2,181 |
| පිටවූ වාහන (ප්‍රතිඅපනයන) සංඛ්‍යාව | 2,181 |
| | |

# රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ ඇති අංශය

# පද්ධති හා ක්‍රියාපරිපාටි අනුකූලතා විගණන අංශය

**හැඳින්වීම**

පද්ධති හා ක්‍රියා පරිපාටි අනුකූලතා විගණන අංශය කෙලින්ම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ. එයට ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 වන පන්තියේ නිලධාරියකු විසින් නායකත්වය දෙනු ලබයි. මෙම නව අංශය ආරම්භ කිරීමේ අපේක්ෂාවක් වූයේ ක්‍රියාකාරි කළමනාකරණයට දායක වීමයි. එහිදී නිත්‍යානුකූල නොවන කාර්යයන් සිදු වීම වැලැක්වීමත්, අවංකත්වයේ සිදු වන අඩුපාඩු වැලැක්වීමෙහි ක්‍රමානුකූල වර්ධනයක් මගින් ක්‍රියාකාරී කළමනාකරණයට දායක වීම අපේක්ෂා කරන ලදී. එමෙන්ම ඇති වන අවදානම් තත්ත්වයන්ට අනුරූපීව අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා වැඩි දියුණු කිරීමද අපේක්ෂා කරන ලදී.
දෙපාර්තමේන්තුව තුල සියලුම අංශයන් තුල පවත්නා ප්‍රධාන ක්‍රියාවලීන් හා සහාය ක්‍රියාවලීන්හිදි සම්පත් යොදා ගැනීමේ අරපිරිමැසුම් බව හා සඵලතාව තක්සේරු කිරීම සඳහා විගණන සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන විෂය පථය වේ.

**ප්‍රධාන කාර්යයන්**

1. හැකි හැම අවස්ථාවකදීම විගණනයෙන් සිදු වන සේවය ප්‍රවර්ධනය කරමින්, එමගින් ආයතනයට වටිනාකමක් ඇති බව සනාථ කිරීම සඳහා ඵලදායී ලෙස අභ්‍යන්තර විගණන කාර්යය කළමනාකරණය කිරීම.
2. පහත සඳහන් කරුණුද ඇතුළුව ආයතනයේ පාලන මෙහෙයුම් හා තොරතුරු පද්ධතියට අදාලව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සඵලතාවය ඇගයීමට ලක් කිරීම

(අ) මූල්‍ය හා මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනීයත්වය
(ආ) මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය හා සඵලතාවය
(ඇ වත්කම් ආරක්ෂා කිරීම
(ඈ) නීති, රෙගුලාසි හා ගිවිසුම් වලට අනුගත වන බව

3. ආදායම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන අවදානම් තක්සේරුව මත පදනම්ව විගණන සැලසුම් සකස් කිරීම් හා ආයතනයේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.
4. හෙළිවන්නා වූ වැදගත් අවදානම් අවස්ථා සහ පාලන ගැටළු හා අනෙකුත් අවශ්‍ය කරුණු පිළිබඳව වාර්තා කිරීම හෝ ඉහළ කළමනාකරණය විසින් ඒවා ඉල්ලා සිටි විට ලබා දීම
5. දැනට ක්‍රියාත්මක මෙහෙයුම් හා වැඩසටහන් හෝ ඒවායින් ලද ප්‍රතිඵල කෙතරම් දුරට ඉලක්ක හා අරමුණු හා කෙතරම් දුරට අනුකූලදැයි බැලීම සඳහා මෙහෙයුම් හා වැඩසටහන් සමාලෝචනය කිරීම.
6. පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමෙහිලා පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා එය තක්සේරු කොට සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම
7. ආයතනය තුල සුදුසු චර්යාධර්ම හා වටිනාකම් ප්‍රවර්ධනය කිරීම
8. ඵලදායි ආයතනික කාර්ය සාධනය කළමනාකරණය හා වගකීම සහතික කිරීම

**කාර්ය සාධනය**

2012 වර්ෂය තුළ පද්ධති ක්‍රියාපරිපාටි අනුකූලතා විගණන අංශය විගණන 78 ක් සාර්ථකව නිම කොට ඇත.

# මූල්‍ය අංශය

**හැඳින්වීම**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ආදායම් උපදවන දෙපාර්තමේන්තු අතරින් ප්‍රධානතම එකකි. පාර්ලිමේන්තුව මගින් අනුමත කරනු ලබන වාර්ෂික ඇස්තමේන්තු මගින් වාර්ෂිකව ආදායම් බදු එකතු කිරීම පිළිබඳ ඉලක්කයක් ලබාදෙයි.

මුදල් අංශය මෙහිදී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරමින් මෙම අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට විශාල සහායක් ලබා දෙයි. එලෙසම බදු පරිපාලනය කරමින් පහත සඳහන් කාර්යයන්ද ඉටු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වියදම් සහ බදු ආදායම් සකස් කිරීම.
2. බදු ආදායම් හා වියදම් රැස්කිරීම, වාර්තා තබා ගැනීම හා බදු ආදායම් වාර්තාකරණය.
3. වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ලබාදී ඇති ප්‍රතිපාදන පරිදි වියදම් කළමනාකරණය
4. අවශ්‍ය පරිදි වියදම් හා අනෙකුත් වාර්තා මහා භාණ්ඩාගාරයට, විගණකාධිපති හා අනෙකුත් බලධාරීන්ට සැපයීම.
5. තැන්පත් ගිණුම් අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ භාණ්ඩ හා රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම් පරිපාලනය
6. වාර්ෂික විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම්, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අවසන් ගිණුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් කල කාර්යයන් මෙහෙයවනු ලබන්නේ ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය) විසිනි. එමෙන්ම රාජ්‍ය කළමනාකරණ නිලධාරීන් 100 කගේ සහාය ලැබෙන ගණකාධිකාරිවරුන් 4 දෙනෙකු යටතේ පහත සඳහන් අංශ 6 ක්‍රියාත්මක වේ.

- ආදායම් අංශය
- ගෙවීම් අංශය
- වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම් අංශය
- අතිකාල ගෙවීම් අංශය
- තැන්පත් ගිණුම් හා අරමුදල් ගිණුම් කළමනාකරණ අංශය

ප්‍රධාන ගණකාධිකාරී වෙත දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය හා සම්බන්ධීකරණයද ඇතුළු සමස්ත මූල්‍ය වගකීම පැවරී ඇත. තවදුරටත්, එම අංශයට බැංකු ඇපකර නිකුත් කිරීමේ වගකීම පැවරී ඇත. ගණන් තැබීම හා උපයන විට ගෙවීම් බදු අය කර ගැනීම පිළිබඳ වගකීමද දරණ අතර මුදල් අංශයේ සේවය කරන රාජ්‍ය කළමනාකරණ නිලධාරීන් හට බලපාන පරිපාලන ගැටලු සම්බන්ධව කටයුතු කිරීමට මානව සම්පත් කළමනාකරණ අංශයට ද සහාය වෙයි.

වගුව 1- බැංකු ඇපකර නිකුත් කිරීම හා උපයන විට ගෙවීම් බදු ගෙවීම

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | සමාගම් | මුදල් ප්‍රමාණය (රු.මිලියන | සමාගම් සංඛ්‍යාව | මුදල් ප්‍රමාණය(රු.මිලියන) |
| බැංකු ඇපකර | 83 | 421 | 86 | **289** |
| විස්තරය | 2011.04.01 සිට 2012.03.31 දක්වා( බදු වර්ෂය) | | | |
| | සේවක සංඛ්‍යාව | ප්‍රමාණය (රු.මිලියන) | | |
| ගෙවීම් බදු | 2,866 | 23,110,502 | | |

**ආදායම් අංශය**

ආදායම් අංශය, ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ප්‍රධාන ආදායම් ගිණුමට සම්බන්ධ කරන ලද උප රැස් කිරීමේ ගිණුම්11 ක් යටතේ ක්‍රියාත්මක වන රැස්කිරීම් ඒකක 41 ක් මගින් ආදායම් එකතු කිරීම පිළිබද වගකීම දරයි. තවදුරටත්, එසේ රැස් කරන ලද ආදායම් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට දිනපතා බැර කෙරෙන අතර එමගින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතන වල මූල අවශ්‍යතා සපුරා ගැනේ.

**2 වගුව - 2011 හා 2012 වර්ෂ වල බදු රැස් කිරීමේ සාරාංශය**

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ඉලක්කය (රු. මිලියන) | එකතු කරන ලද (රු.මිලියන) | ඉලක්කය (රු. මිලියන) | එකතු කරන ලද (රු.මිලියන) |
| ආනයන බදු | 80,252 | 76,010 | 76,830 | 73,489 |
| අපනයන බදු | 30 | 17 | 20 | 21 |
| වරාය හා ගුවන්තොටුපල බදු | 65,032 | 66,030 | 75,211 | 70,111 |
| සෙස් බදු –ආනයන | 26,366 | 26,885 | 29,287 | 29,604 |
| ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු | - | 6 | - | 7 |
| සෙස් බදු – අපනයන | 3,000 | 2,785 | 3,120 | 3,136 |
| විශේෂ භාණ්ඩ බදු | 14,711 | 15,622 | 36,608 | 33,666 |
| **එකතුව** | **189,391** | **187,355** | **221,076** | **210,034** |

**ගෙවීම් අංශය**

ගෙවීම් අංශය ගෙවිම් අංශය වාර්ෂික වියදම් ඇස්තමේන්තුව, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ගෙවීම් හා මූල්‍ය ගිණුම් යටතේ ගෙවීම් මගින් වෙන් වන අරමුදල්වලට අනුකූලව සියලු ගෙවීම් කටයුතු කිරීමේ වගකීම.

**වගුව 3 - 2011 හා 2012 වර්ෂ වල වියදම් සැකසීම**

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත (රු. මිලියන) | සත්‍ය වියදම (රු.මිලියන) | ඇස්තමේන්තු ගත (රු.මිලියන) | සත්‍ය වියදම (රු.මිලියන |
| පුනරාවර්තන | 1,325 | 1,251 | 1,393 | 1,392 |
| මූලධන | 1,469 | 1,429 | 903 | 903 |
| | **2011** | | 2012 | |
| | සේවක සංඛ්‍යාව | ප්‍රමාණය (රු.මිලියන) | සේවක සංඛ්‍යාව | ප්‍රමාණය (රු.මිලියන) |
| **උත්සව අත්තිකාරම** | 383 | 1.91 | 360 | **1.8** |
| **ආපදා ණය** | **398** | **22.22** | **474** | **37.76** |
| **විශේෂ හා බයිසිකල් ණය** | | | **35** | **0.1** |

**වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම් අංශය**

මෙම අංශය වැටුප් ගෙවීම හා විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ වගකීම දරයි.

**වගුව 4 - 2011 හා 2012 වර්ෂවල වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම් සැසඳීම**

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | සේවක සංඛ්‍යාව | මුදල (රු.මිලියන) | සේවක සංඛ්‍යාව | මුදල (රු.මිලියන) |
| වැටුප් මුළු ගෙවීම් | 1,868 | 864 | 2,092 | **1,007** |
| විශ්‍රාම වැටුප් මුළු ගෙවීම් | **100** | **44.2** | **88** | **35.54** |

**අතිකාල ගෙවීම් අංශය**

මෙම අංශය සාමාන්‍ය කාලවේලාවෙන් බැහැරව සේවය ඉල්ලා සිටින ආයතනවලින් අතිකාල එක්රැස් කර ගැනීම හා රේගු අතිකාල අරමුදල යටතේ දෙපාර්තමේන්තු සේවකයින්ට අතිකාල ගෙවීම පිළිබඳ වගකීම දරයි.
තවද මෙම අංශය පහත සඳහන් ගිණුම්වලට අදාළ වාර්ෂික ඇස්තමේන්තුව සහ අවසන් ගිණුම සකස් කිරිම හා ඉදිරිපත් කිරිම.

1. රේගු අතිකාල අරමුදල් ගිණුම
2. භාණ්ඩ සමීක්ෂණ ගාස්තු අරමුදල් ගිණුම.

වගුව 5 - 2011 හා 2012 වර්ෂවල අතිකාල ගෙවීම් සංසන්දනය

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලැබුණු මුදල (රු.මිලියන) | ගෙවන ලද මුදල (රු.මිලියන | ලැබුණු මුදල (රු.මිලියන) | ගෙවන ලද මුදල (රු.මිලියන |
| අතිකාල මුළු ගෙවීම් | 598 | 422 | 583 | 431 |
| භාණ්ඩ සමීක්ෂණ ගාස්තු අරමුදල් ගිණුම. | 223 | 341 | 201 | 162 |

**තැන්පතු ගිණුම හා අරමුදල් කළමනාකරණ අංශය**

රාජ්‍ය සේවයේ ගිණුම් ප්‍රමිති ප්‍රකාරව පහත දැක්වෙන අරමුදල් ගිණුම්වලට අදාල ගෙවීම් වවුචර ලැබීම හා සහතික කිරීම වාර්තා, ගෙවීම් වාර්තා කිරීම හා වාර්ෂික ඇස්තමේන්තු හා වාර්ෂික අවසන් ගිණුම් සැකසීම මෙම අංශයේ වගකීම වේ.

1. තැන්පතු ගිණුම (මණ්ඩල ගෙවීම් බැංකු ඇපකර හා විවිධ)
2. අත් අඩංගුවට ගත් හා රාජසන්තක කරන ලද භාණ්ඩ හා අත්තිකාරම් ගිණුම

වගුව 6 - 2011 හා 2012 වර්ෂවලට අදාල තැන්පත් ගිණුම් හා අරමුදල් ගිණුම් වල කාර්යසාධනය සැසඳීම

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලැබුණු මුදල (රු.මිලියන) | ගෙවන ලද මුදල (රු.මිලියන | ලැබුණු මුදල (රු.මිලියන) | ගෙවන ලද මුදල (රු.මිලියන |
| අත් අඩංගුවට ගත් හා රාජසන්තක කරන ලද භාණ්ඩ හා අත්තිකාරම් ගිණුම | 2.5 | 3.5 | 2.5 | **3.4** |

**වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම**

**2013.03.31** දිනට පෙර පහත දැක්වෙන වාර්ෂික ගිණුම් විගණකාධිපතිවරයා හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම මුල්‍ය කාර්යාංශයේ වගකීම වේ.

- වාර්ෂික විසර්ජන ගිණුම්
- වාර්ෂික ආදායම් ගිණුම්
- අත් අඩංගුවට ගත් හා රාජසන්තක කරන ලද භාණ්ඩ ගිණුම හා වෙනත් අරමුදල් ගිණුම් හා මුදල් කාර්යාංශය වෙත පවරා දී ඇති අනෙකුත් අතිරේක වගකීම්

**මුදල් කාර්යාංශය වෙත පවරා දී ඇති අතිරේක වගකීම**

රේගු ආඥා පනත යටතේ ස්ථාපිත අරමුදල් ගිණුම් පිළිබඳ වගකීම පහත දැකවෙන පරිදි මුදල් කාර්යාංශය වෙත පවරා දී තිබේ.

1. පහත දැක්වෙන අරමුදල් ගිණුම් කළමනාකරණය
    - රේගු නිලධාරී ත්‍යාග අරමුදල
    - රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල
2. ඉහත සඳහන් අරමුදල් ගිණුම්වල ගෙවීම් වවුචර් ලැබීම් හා සහතික කිරීම් වාර්තාකිරීම්, ගෙවීම් වාර්තා කිරීම වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

වගුව **7 - 2011** හා **2012** වර්ෂවලට අදාල අරමුදල් ගිණුම් වල කාර්යසාධනය සැසඳීම

| විස්තරය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලැබුණු මුදල (රු.මිලියන) | ගෙවන ලද මුදල (රු.මිලියන | ලැබුණු මුදල (රු.මිලියන) | ගෙවන ලද මුදල (රු.මිලියන |
| රේගු නිලධාරී පරිත්‍යාග අරමුදල | 873 | 816 | 1,078 | 1,009 |
| රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල | 282 | 49 | 362 | 97 |

# විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය

**හැඳින්වීම**

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ පාලන හස්තයක් ලෙස ක්‍රියා කරමින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය දැක්වීම සහ දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු වල ක්‍රියාකාරිත්වය පිළිබඳ සුපරීක්ෂාවෙන් සිටීමත් වේ. මහජනතාවගෙන් ලබා ගන්නා තොරතුරු හා කාර්ය මණ්ඩලය විසින් රැස් කර ගනු ලබන බුද්ධි තොරතුරු මත විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය සිය නීති බලාත්මක කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරයි.


එමෙන්ම තැපැල් මාර්ගික, කූරියර් සේවා හා විශේෂ ක්‍රියාපරිපාටි මගින් සිදු කෙරෙන භාණ්ඩ නිශ්කාෂණය කිරීම් පිළිබඳව මෙම අංශය සිය සුපරීක්ෂණ කටයුතු මෙහෙයවයි.

**ප්‍රධාන කාර්යයන්**

1. දෙපාර්තමේන්තුව තුල අවංක භාවය ප්‍රවර්ධනය කිරීම සහ නීත්‍යානුකූල නොවන භාවිතයන් ඉවත් කිරීමට කටයුතු කිරීම.
2. පැමිණිලි හා චෝදනා සම්බන්ධව වහාම අවශ්‍ය පියවර ගැනීම .
3. අර්බුදකාරි අවස්ථා වල රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය පිණිස සම්පත් ඒක රාශි කර දීම.
4. ආනයනය කරන ලද හෝ අපනයනයට සකස් කරන ලද භාණ්ඩ නවත්වා අනුගමනය කර ඇති ක්‍රියා පරිපාටිවල නිවැරදි බව පරීක්ෂා කිරීම
5. ගුවන් තොටුපලේදී හෝ මගින් කැටුව නොඑන භාණ්ඩ රඳවන ගුදම් වලදී (*UPB warehouses*) එම ගමන් භාණ්ඩ හෝ පුද්ගලයන් නවත්වා පරීක්ෂා කිරීම.
6. තැපැලේදී, කූරියර් සේවාවලදී මෙන්ම අනෙකුත් විශේෂ භාණ්ඩ නිශ්කාෂණ ක්‍රියාපරිපාටි පිළිබඳව විමසිල්ලෙන් සිටීම.

**2009,2010,2011 හා 2012 වර්ෂ වල මුළු වැටලීම් සිද්ධි සංසන්දනය**

| | 2009 ( රු.) | 2010 ( රු.) | 2011 ( රු.) | 2012 ( රු.) |
|---|---|---|---|---|
| දඩ මුදල්,අතිරේක රේගු සටහන්කර හා අනෙකුත් බදු | 354,417,921 | 392,152,071 | 671,474,362 | 407,821,431 |
| අලෙවි ආදායම් | 70,179,646 | 39,451,881 | 58,642,363 | 91,004,686 |
| ***මුළු එකතුව*** | **424,597,567** | **431,603,952** | **730,116,725** | **498,826,117** |




**2009,2010,2011, 2012 වර්ෂ වල මුළු වැටලීම් සිද්ධි සංසන්දනය**

| | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| වාණිජ ආනයන (මුහුදු හා ගුවන් මගින්) -FCL & LCL | 827 | 1,114 | 1,196 | 1,235 |
| මගීන් කැටුව නොඑන ගමන් බඩු | 622 | 978 | 991 | 1,058 |
| මගීන් කැටුව එන ගමන් බඩු (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල) | 1,000 | 24 | 70 | 40 |
| මුළු සිද්ධි සංඛ්‍යාව | **2,449** | **2,116** | **2,257** | **2,333** |

# ව්‍යාපෘතිය *II*

## නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම

# නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

**හැඳින්වීම**

1990 අංක 40 දරණ පනතින් හා 1994 අංක 8 දරණ පනතින් සංශෝධිත 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත රජයේ නිෂ්පාදන බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ලා පවත්නා නීතිමය මූලාශ්‍රය වේ.

නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය පරිපාලනමය වශයෙන් රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන අතර, මුදල් අමාත්‍යාංශය යටතේ පවතී. ජාතියේ යහපත තකා නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පණතේ විධිවිධාන සහ එහි රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය වශයෙන් මෙම අංශය වැදගත් ජාතික කර්තව්‍යයක් ඉටුකරයි.

**ප්‍රධාන කාර්යයන්**

(අ) අධීක්ෂණය හා සිගරට් හා අනෙකුත් නිෂ්පාදන ආයතන පාලනය කිරීම තුලින් ආදායම් රැස් කිරීම.

(ආ) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පණතේ විධිවිධාන ක්‍රියාත්මක කරන අධිකාරි ආයතනය වශයෙන් ක්‍රියා කිරීම හා එමගින් ආනයනය කළ හා දේශීය වශයෙන් නිෂ්පාදනය කල බදු අය කල යුතු භාණ්ඩ වලින් නිෂ්පාදන බදු අය කර ගැනීම .

(ඇ) නිෂ්පාදන බදු පැනවීමට අදාල කාර්යයන්හි නියුක්ත වීම

**මෙහෙවර සහ අරමුණ**

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ මෙහෙවර වනුයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් නිෂ්පාදන බදු ආදායම කාර්යක්ෂම ලෙස එකතු කිරීම හා එමගින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක වීමත් ය.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ අරමුණු පුළුල් ලෙස පහත සඳහන් පරිදි හඳුනාගත හැකිය.

(අ) 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම

(ආ) මෙම පනත යටතට වැටෙන භාණ්ඩ වලින් ආදායම් රැස් කිරීම හා ආරක්ෂා කිරීම පෙට්‍රෝලියම්, - ද්‍රව පෙට්‍රෝලියම් ගෑස්, සිගරට්, මද්‍ය බීම, තුරඟ තරග ප්‍රකාශන , වාහන ආනයන, දේශීය වශයෙන් එකලස් කරන ලද වාහන, ජේන්ට් වර්ග, පොලිතින් හා අනෙකුත් නිෂ්පාදන බදු අය කල යුතු භාණ්ඩ වලින් නිෂ්පාදන බදු අය කිරීම

**පද්ධති හා ක්‍රියා පරිපාටි**

මෙම අංශය ආරම්භයේ සිටම පනත යටතේ රෙගුලාසි හා නියමයන් අන්තර්ගත වූ ගැසට් නිවේදන සමූහයක් වරින් වර ප්‍රකාශයට පත් කරන ලදී. නිෂ්පාදන බදු ව්‍යුහය පවා ක්‍රියාත්මක කරන ලද්දේ ඉහත රෙගුලාසි හා නියෝග අනුවය.

**පසුගිය වසර තුල සිදු වූ ප්‍රධාන වෙනස්කම්**

1. H.S.කේත අංක 32.08 ,32.09, 32.10 තීන්ත හා වාර්නිෂ් සඳහා 2010 ජුනි 01 දින සිට නිෂ්පාදන බදු වලින් නිදහස් කරන ලදී.
2. H.S.කේත අංක දින සිට නිෂ්පාදන 2010.11.23 පොලිතීන් බෑග් සඳහා නිෂ්පාදන බදු 39.23 බදු වලින් නිදහස් කරන ලදී
3. H.S.කේත අංක 39.01 පොලිතීන් සඳහා වූ නිෂ්පාදන බද්ද 2010.11.23 දින සිට ඉවත් කරන ලදී.

2010.11.23 දින සිට **HS** කේත අංක 39.01 යටතේ වූ ප්‍රාථමික ස්වරූපවලින් ඇති එතලීන් වල බහු අවයවික සඳහා නිෂ්පාදන බදු පනවන ලදී.

**2009 වර්ෂය තුලදී නිෂ්පාදනබදු අය විය යුතු භාණ්ඩ වලින් එකතු කළ ආදායම (දේශීය)**

| | | |
|---|---|---|
| | | **රුපියල් මිලියන** |
| **සිගරට්** | - | 37,670.16 |
| **පෙට්‍රෝලියම්** | - | 7,854.18 |
| **මෝටර් වාහන (දේශීය එක්ලස් කරන ලද)** | - | 0.11 |
| **මෘදු බීම** | - | 750.31 |
| **තුරඟ තරග ප්‍රකාශන** | - | 9.14 |
| **විදුලි භාණ්ඩ (දේශීය)වෙනත්** | - | 171.16 |
| **විදුලි භාණ්ඩ(රේගු ප්‍රකාශන) ගෙවීම්** | | |
| **සුරා බද්ද** | | |
| **සමාජ වගකීම් බද්ද(දේශීය)** | - | 710.70 |
| **පේන්ට්ස් හා පොලිතින්** | - | 277.49 |
| **නීති කටයුතු මගින්** | - | 27.29 |
| **ද්‍රාව්‍ය පෙට්‍රෝලියම් ගෑස්** | - | 526.34 |
| **එකතුව** | **-** | 47,996.88 |

**2010 වර්ෂය තුලදී නිෂ්පාදනබදු අය විය යුතු භාණ්ඩ වලින් එකතු කළ ආදායම (දේශීය)**

| | | |
|---|---|---|
| | **රු. මිලියන** | |
| **සිගරට්** | - | 42,132.3**2** |
| **පෙට්‍රෝලියම්** | - | **5,650.66** |
| **මෝටර් වාහන (දේශීය එක්ලස් කරන ලද)** | - | **15.78** |
| **මෘදු බීම** | - | **949.56** |
| **තුරඟ තරග ප්‍රකාශන** | - | **9.31** |
| **විදුලි භාණ්ඩ (දේශීය)වෙනත්** | - | **284.68** |
| **විදුලි භාණ්ඩ(රේගු ප්‍රකාශන) ගෙවීම්** | - | |
| **සුරා බද්ද** | - | |
| **සමාජ වගකීම් බද්ද(දේශීය)** | - | **564.33** |
| **ද්‍රාව්‍ය පෙට්‍රෝලියම් ගෑස්** | - | **1.65** |
| **එකතුව** | **-** | **49,608.29** |

**2011 වර්ෂය තුලදී නිෂ්පාදනබදු අය විය යුතු භාණ්ඩ වලින් එකතු කළ ආදායම (දේශීය)**

| | | රුපියල් මිලියන |
|---|---|---|
| **සිගරට්** | - | 49,925.30 |
| **පෙට්‍රෝලියම්** | - | 7,163.20 |
| **මෝටර් වාහන (දේශීය එක්ලස් කරන ලද)** | - | 21.60 |
| **මැදු බීම** | - | 1,345.90 |
| **තුරඟ තරඟ ප්‍රකාශන** | - | 9.40 |
| **විදුලි භාණ්ඩ (දේශීය)වෙනත්** | - | 166.00 |
| **විදුලි භාණ්ඩ(රේගු ප්‍රකාශන) ගෙවීම්** | | |
| **සුරා බද්ද** | | |
| **සමාජ වගකීම් බද්ද(දේශීය)** | - | |
| **ජේන්ට්ස් හා පොලිතින්** | - | |
| **නීති කටයුතු මගින්** | - | |
| **ද්‍රාව්‍ය පෙට්‍රෝලියම් ගෑස්** | - | |
| **එකතුව** | **-** | **58,631.40** |

**වර්ෂය තුල වියදම**

2012 **වර්ෂය තුල බදු අය කල යුතු භාණ්ඩ හා අතිකාල ආදායම (දේශීය)**

| | | **රුපියල් මිලියන** |
|---|---|---|
| **සිගරට්** | - | 54,241.38 |
| **පෙට්‍රෝලියම්** | - | 6,900.63 |
| **මෝටර් වාහන (දේශීය එක්ලස් කරන ලද)** | - | 56.9 |
| **මැදු බීම** | - | 1,668.77 |
| **තුරඟ තරඟ ප්‍රකාශන** | - | 9.49 |
| **විදුලි භාණ්ඩ (දේශීය)වෙනත්** | - | 133.54 |
| **එකතුව** | **-** | **63,010.74** |

ගෙවීමට ඇති සුරාබදු තීරුබදු (**රුපියල් -** 7,486,997,687.00)

දෙපාර්තමේන්තු වැය ශීර්ෂ මගින් සියලු වියදම් දරණ ලද හෙයින් 2010 වර්ෂය සඳහා එම අංශය සඳහා වියදම් ශීර්ෂයක් නොමැත .

**නීති කටයුතු**

නිෂ්පාදන  බදු ගෙවීම් පැහැර හරින ලද ආයතන වලට විරුද්ධව නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නීති කටයුතු සිදු කොට දඩ මුදල් අය කිරීමට පියවර ගෙන ඇත. විස්තර පහත සඳහන් වේ.

| | |
|---|---|
| පෙනී සිටින ලද අධිකරණ සංඛ්‍යාව | 20 |
| ඉදිරියට ගෙන යන ලද නඩු සංඛ්‍යාව | 279 |
| වසර තුලදී පවරන ලද නඩු සංඛ්‍යාව | නැත |
| වසර තුලදී අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | නැත |
| වසර තුලදී අයකර ගනු ලැබූ මුදල් ප්‍රමාණය | නැත |